787

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය

2_ OCT 2006
කොළඹ.

# වාර්ෂික වාර්තාව
# 2004

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය

# වාර්ෂික වාර්තාව
# 2004

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.

## පාලක මණ්ඩලය

| | |
|---|---|
| තිස්ස වර්ණසූරිය මහතා | සභාපති - පාලක මණ්ඩලය සහ ලේකම් කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය |
| ඩී.ජී.පී. සෙනෙවිරත්න මහතා | අධ්‍යක්ෂ, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය |
| ඩබ්.එම්. ජයතිලක මහතා | නියෝජිත - අතිරේක ලේකම් (ඉඩම්), කෘෂිකර්ම සහ පශු සම්පත් අමාත්‍යාංශය |
| එම්.වීරසිංහ මහතා | නියෝජිත - අතිරේක ලේකම් (සංවර්ධන), මහවැලි සහ ගංගා නිම්න සංවර්ධන අමාත්‍යාංශය |
| ඒ. බෙඩිගා පෙරේරා මහතා | නියෝජිත - අධ්‍යක්ෂ (කෘෂිකර්ම සංවර්ධන), කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය |
| කේ.පී. ඉන්ද්‍රන් මහතා | නියෝජිත - අධ්‍යක්ෂ (පොදු ව්‍යවසාය දෙපාර්තමේන්තුව), මුදල් අමාත්‍යාංශය |
| සී.පී. සිරිවර්ධන මහතා | නියෝජිත - අතිරේක ලේකම්, කුඩා සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය |
| ඉන්ද්‍රානි සුගතදස මහත්මිය | නියෝජිත - අතිරේක ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| ඩබ්.එම්.කේ.ආර්. බාලචන්ද්‍රන් මහත්මිය | නියෝජිත, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, වෙළඳ හා පාරිභෝගික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය |
| ආචාර්ය කේ.එල්. ද සිල්වා මහතා | නියෝජිත, ජ්‍යෙෂ්ඨ අර්ථශාස්ත්‍රඥ, බැංකු කටයුතු අධ්‍යයන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා මහ බැංකුව |
| ආචාර්ය එස්.එල්. වීරසේන මහතා | කෘෂිකර්ම අධ්‍යක්ෂ ජෙනරාල් |
| කේ.එස්.ආර්.ද සිල්වා මහතා | වාරිමාර්ග අධ්‍යක්ෂ ජෙනරාල් |
| ලූකස් ඉදුරුගල්ල මහතා | කොමසාරිස් ජෙනරාල්, ගොවි කටයුතු සංවර්ධන |
| එස්.ජේ. පතිරණ මහතා | ඉඩම් කොමසාරිස් |
| ජී.එස්.එල්. ෆොන්සේකා මහතා | සමූපකාර සංවර්ධන කොමසාරිස් |
| මාස්ලාත් ප්‍රූසෝ මහතා | නේවාසික නියෝජිත, ආහාර හා කෘෂිකර්ම සංවිධානය |
| ආර්.ද සිල්වා මහත්මිය | ලේකම්, පාලක මණ්ඩලය |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,
114, විජේරාම මාවත,
කොළඹ 07.

2005.03.23

ගරු කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යතුමා,
කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය,
ගොවිජන මන්දිරය,
80/5, රජමල්වත්තත පාර,
බත්තරමුල්ල.

ඇමතිතුමනි,

## 2004 වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද ගිණුම්

1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) වගන්තිය පරිදි 2004 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා මෙම ආයතනය සම්බන්ධයෙන් පහත සඳහන් ලේඛනය ආයතනයේ පාලක මණ්ඩලය වෙනුවෙන් මේ සමඟ ඉදිරිපත් කරමි.

1. වාර්ෂික වාර්තාව
2. විගණනය කරන ලද ආදයම් හා වියදම් ගිණුම්
3. විගණනය කරන ලද ශේෂ පත්‍රය
4. ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ නිරීක්ෂණය

මෙයට - විශ්වාසී,

තිස්ස වර්ණසූරිය
සභාපති,
පාලක මණ්ඩලය.

# වාර්ෂික වාර්තාව 2004

## දළ විශ්ලේෂණය

මෙම ආයතනයේ ප්‍රථම වාර්ෂික වාර්තාව, ආයතනය ස්ථාපිත කිරීම පිළිබඳ ඉතිහාසය මෙසේ වාර්තා කරයි. "1960 ජූලි මාසයේ දී එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය විසින් අග්නිදිග ආසියාතික ගොවි කටයුතු පර්යේෂණ සහ පුහුණු ආයතනයක් පිහිටුවීමට යෝජනා කරන ලදී. 1964 ජූලි මාසයේ දී එක්සත් ජාතීන්ගේ විශේෂ අරමුදලෙහි ආධාරය ඇතිව මෙම ආයතනය ලංකාවේ පිහිටුවන ලෙස කැබිනට් මණ්ඩලය විසින් විධිමත් ඉල්ලීමක් කරන ලදී. ඉන් අනතුරුව එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල සහ ලෝක ආහාර සංවිධානය සමඟ යෝජිත ආයතනයේ විශේෂිත අරමුණු ද, එය විසින් බාර ගත යුතු පර්යේෂණ සහ පුහුණු කටයුතුවල විෂය පථය හා අන්තර්ගතය ද, එවකට කෘෂිකර්ම පීඨයක් පැවති එකම විශ්ව විද්‍යාලය වන ලංකා විශ්ව විද්‍යාලය වැනි පුහුණු හා පර්යේෂණ ආයතන සමඟ යෝජිත ආයතනය විසින් පවත්වා ගත යුතු සබඳතාව ගැන ද, සාකච්ඡා ආරම්භ විය. මෙම සාකච්ඡා පදනම් කොට ගෙන, 1967 ඔක්තෝම්බර් මාසයේදී ජාතික ආයතනයක් පිහිටු වීම සඳහා සහාය අපේක්ෂාවෙන් සංශෝධිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී. එක්සත් ජාතීන්ගේ පාලක සභාව විසින් 1969 ජනවාරි මාසයේ දී මෙම ව්‍යාපෘතිය අනුමත කරන ලදී. ආයතනය කාලයාගේ ඇවෑමෙන් ආසියාතු කලාපයේ වෙනත් රටවල අවශ්‍යතා ද ආවරණය වන පරිදි තම කටයුතු පුළුල් කරනු ඇතැයි අපේක්ෂා කරන ලදී".

ප්‍රක්ෂේපිත ප්‍රසාරණය හේතු කිපයක් නිසා සිදු නොවීය. මූලික හේතුව නම් එවකට සිටි අධිකාරීන් මෙරට පැවති ගොවි කටයුතු පිළිබඳ තත්ත්වය හා එය හා බැඳුන ගතිලක්ෂණ වෙත ප්‍රවේශ වූ ආකාරය ඉතා පටු සීමාවන්ට මැදි වීමය. ආරම්භක අවධියෙහි ආයතනයට බැඳුන විදේශීය ශාස්ත්‍රවන්තයන් ද ශ්‍රී ලංකාව තම අධ්‍යයන වාර්තා ගොඩ නැඟීම සඳහා සුදුසු ප්‍රතෙසික අධ්‍යයනයක් කර ගත්හ.

ආරම්භයේ සිටම වෙළඳපොළ තොරතුරු ජාලය සංස්ථාපිත කිරීම තුළින් ප්‍රත්‍යක්ෂ වත්මනෙහි පවත්නා ආහාර අනාරක්ෂිතභාවය සහ අනතුරට නිරාවරණය වීම පිළිබඳ තොරතුරු සහ අනුරූපන පද්ධතියක් ඇති කිරීම දක්වා, ආහාර සහ කෘෂිකර්ම සංවිධානය සමඟ සහයෝගිතාවය අඛන්ඩව පවති. අපගේ අවශ්‍යතා පදනම් කර ගත් වෙනත් සහයෝගීතාවයන් වරින් වර ඇති විය. ශ්‍රී ලංකාවේ සහල් නිෂ්පාදනය පිළිබඳ ආර්ථික පදනම ගැන වොෂිංටන් ඩී.සී.හි පිහිටි අන්තර් ජාතික ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය සමඟ සහයෝගයෙන් සිදු කළ අධ්‍යයනය එම සහයෝගීතාවයන්ගෙන් එකකි. (එම අධ්‍යයනය අනුව කුඩා ඉඩම් හිමියන් විසින් සහල් නිෂ්පාදනය කිරීම 'කාර්යක්ෂම' බව ආර්ථික සාධක අනුව පෙන්වා දෙන ලදී.)

පශ්චාත් උපාධි පුහුණුව සඳහා පිටරට යවන ලද, ආයතනයේ පර්යේෂණ නිලධාරිහු ද, සමාජ ආර්ථික සංසිද්ධි විශ්ලේෂණයට බටහිර රටවල යොදගත් තාක්‍ෂණය අනුගමනය කිරීමේ පහසු විකල්පය බොහෝ විට තෝරාගත්හ. පුහුණුවෙන් වැඩි කොටසකට එක්සත් ජනපද ආධාර (USAID) ලැබීම, එම ප්‍රවණතාවයට දයක විය. මෙරට ගොවිජන කටයුතු සහ ඒවා ආශ්‍රිත ගැටළු පිළිබඳ ඔවුන්ගේ ආකල්ප, පුහුණුව ලැබූ සත්කාර රටෙහි පුළුල් මූලෝපායික අරමුණු අනුව සකස්වීම පුදුමයක් නොවේ. අවසාන වශයෙන් ඔවුන් අතුරෙන් සමහර දෙනෙක්, ආධාර සැපයූ එවන් මූල්‍ය ආයතන සහ එම ආයතන වෙනුවෙන් මෙහෙවරෙහි යෙදෙන්නන් විසින් අරමුදල් සපයනු ලැබූ බැංකු සහ රාජ්‍ය නොවන ආයතන වැනි අන්තර් ජාතික සංවිධානවල වැඩ නැතත් ලාභ වැඩි තනතුරු ලබා ගත්හ.

ආහාර සහ කෘෂිකර්ම සංවිධානය සමඟ සහභාගීත්වයෙන් කටයුතු කළ මුල් අවධියෙහි, ආයතනයෙහි විෂය පථයන් වූයේ ඉඩම් ආර්ථිකය සහ ඉඩම් බුක්තිය, නිෂ්පාදන ආර්ථිකය, ඉඩම් නිරවුල්කරණය, ග්‍රාමීය සමාජ විද්‍යාව, සමුපකාරය සහ ණය, අලෙවිය, සංඛ්‍යානය, කෘෂිකර්ම ව්‍යාප්තිය සහ සන්නිවේදනය ආදියයි. ගොවිජන ගැටළු විවිධ සාධකයන් අතර අන්තර් ක්‍රියාකාරිත්වයක් හැටියට දක්නා ලදී. යොදගත් ප්‍රවේශය වූයේ හැකිතාක් දුරට පර්යේෂණ සහ පුහුණු කාර්ය මණ්ඩලයේ

විශේෂිත කුසලතා අනුව, අන්තර් ශික්ෂණ පිළිවෙතක් අනුගමනය කිරීමයි. විශේෂයෙන්ම ඇමරිකා එක්සත් ජනපදයෙහි විශ්ව විද්‍යාලයන්හි උගන්වනු ලබන පාඨමාලාවල විශේෂඥතාවය වඩාත් වැඩි වීම සමඟ එම විශ්ව විද්‍යාලවල පුහුණුව ලද අයට තම නිරීක්ෂණයට පාත්‍ර වූ පටු ක්ෂේත්‍ර වෙනත් ශික්ෂණයන් හා ගැළපීමෙහි දී දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදු විය. මෙම තත්ත්වය තුළ, අවශ්‍ය වූ නැවත පුහුණු කිරීම අඛණ්ඩව පවත්වා ගැනීම අපහසු විය. එයට හේතු නම් පර්යේෂණ පරිපාලන රීති සහ රජයේ ප්‍රතිපත්ති වෙනස්වීම්වලට භාජනය වීමයි.

කාලයාගේ ඇවෑමෙන් විශේෂයෙන්ම රාජ්‍ය අරමුදල් සම්පාදනය හීනවීමත් සමඟ කලින් පැවති තත්ත්වයට වඩා තියුණු ලෙස පර්යේෂණ න්‍යාය පත්‍රය, අරමුදල් සපයන බාහිර නියෝජ්‍යායතනවල බලපෑමට පාත්‍ර විය. එහි ප්‍රතිඵලය වූයේ අන්තර්ජාතික මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව යන ආයතනවල සේවා සම්පාදනය යටතේ වර්ධනය වෙමින් පැවති ගතානුගතික ආචාරධර්මවලට අනුබල දීමට තුඩු දෙන අධ්‍යයනයන් බිහි වීමයි. එවන් දක්මකට පිටු පා යන අධ්‍යයන ක්ෂේත්‍රයන්ට අරමුදල් ලබාගැනීම අපහසු විය. කලින් පැවති පරිපාලනය යටතේ, තම දේශපාලන අරමුණුවලට සහාය දෙන අධ්‍යයන කිරීමට පමණක් නොව ආයතනයට වෙනත් අධ්‍යයනයක් කිරීමට ද යම් ප්‍රමාණයකට ඉඩ සලසන අරමුදල් සමෘද්ධි ව්‍යාපෘතිය යටතේ ලබා ගැනීමට අමාත්‍යාංශයට හැකි විය. ලැබුනු අරමුදල් මෙම අරමුණු දෙකම ඉටු කිරීමට ප්‍රමාණවත් ලෙස යොදා ගත් බවක් නොපෙනේ.

2003 ජුනි මාසයේදී, ආයතනයට නව නේවාසිකාගාරයක් තැනීමට ගොවිහාර අරමුදලෙන් (Farmers Trust Fund) රුපියල් මිලියන 15ක් නිදහස් කරන ලදී. නමුත් මෙම ව්‍යාපෘතියට ආධාර කිරීම මහා භාණ්ඩාගාරය ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව එය අත්හැර දමන ලදී. තැනුම්පොළෙහි පාංශු පරීක්ෂණයට වැය වූ ප්‍රාථමික වැය වන රු.234,000 ක් අඩුකරන ලදුව, ප්‍රදානයෙහි ඉතිරි මුදල 2004 දෙසැම්බර් මාසයේ දී අමාත්‍යාංශයට ආපසු ගෙවන ලදී. එසේ මුදල් ආපසු ගෙවීමේදී, ආයතනය ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දුන් ඇතැම් ක්‍රියාකාරකම්වලට ඉන් කොටසක් ලබා දෙනු ඇත යන අවබෝධය පැවතුනි. එම ක්‍රියාකාරකම්වලට ඇතුළත් වූ අධ්‍යයන කීපයකි. ඒවා මෙසේය. (1) ග්‍රාමීය සංවර්ධනයෙහි ලා රාජ්‍ය නොවන සංවිධාන වල - විශේෂයෙන්ම අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධානවල කාර්යභාරය (2) 1970 දශකයේ දී බැම්බිණිවත්ත ග්‍රාමය තුළ ආයතනය ලබා ගත් අත්දැකීම් ප්‍රයෝජනයට ගන්නා බහුමාන ක්‍රියාකාරී පර්යේෂණ වැඩසටහනක් (එම ප්‍රදේශය ක්ෂේත්‍ර රසායනාගාරයක් ලෙස සැලකීම මඟින්) (3) 1990 දශකයේ දී, කෘෂිකර්ම ඵලදායිතා, ග්‍රාම සහ අපනයන ප්‍රවර්ධන ග්‍රාම ගැන පැවැත් වූ අධ්‍යයන සහ තිරසර ග්‍රාම සංවර්ධන වැඩසටහන යටතේ මෑතදී ලබා ගත් අත්දැකීම්. එම ව්‍යාපෘතිය මඟින් වෙළඳපොළ තොරතුරු ජාලයක් උපයෝගීකොට ගෙන කුඩා වැව් අමුණු පුනරුත්ථාපන වැඩසටහනකට සහාය වීමට සහ ක්ෂේත්‍ර මට්ටමේ පසු විපරමකට අවශ්‍ය සේවක පිරිස ලබා දීමට (මේ සඳහා අනියම් සෝදිසිකරුවන් 70ක් ලබා දීම භාණ්ඩාගාරය විසින් අනුමත කර තිබුණි) අපේක්ෂා කරන ලදී.

අන් කවර දකටත් වඩා භාණ්ඩාගාරයෙන් අරමුදල් වෙන්කිරීම හීන වී ඇත. කොතරම් හීන වී ඇත් ද යත් ලැබෙන අරමුදල ආයතනයේ නඩත්තුවට වුව ද ප්‍රමාණවත් වන්නේ යාන්තමිනි. නිදහස් කරන මුදල් ප්‍රමාණය මද වීම හේතු කොට ගෙන ආයතනයේ ගැටළු වඩාත් තීව්‍ර වී ඇති අතර ආයතනය විසින් ඉටුකළ යුතු මෙහෙවර පටු අර්ථ දක්වීමකට භාජනය කර ඇති නිසා ග්‍රාමීය ක්ෂේත්‍රයෙහි පවත්නා ජාතික වැදගත්කමක් ඇති ගැටළු නිරාකරණය උදෙසා සාර්ථක ලෙස කටයුතු කිරීමේ හැකියාව දුර්වල වී ඇත.

පවත්නා මතභේද කෙබඳු වුව ද, වත්මන් පරිපාලනය විසින් පැහැදිලි ජාතික ප්‍රතිපත්තියක් සකසා ඇති අතර, ආරම්භයක් වශයෙන් මෙරට කුඩා වාරි ක්‍රමවල ස්වභාවය හැදෑරීමෙන්, ආයතනය එම ප්‍රතිපත්තියට ප්‍රතිචාර දක්වා ඇත. ගංගා නිම්න තුළ පවත්නා සම්පත් කළමනාකරණයට අවේනික ගැටළු ද පරිසරය ආශ්‍රිත ප්‍රතිපත්ති සහ ගැටළු ද මානව පෝෂණය පිළිබඳ ගැටළු ද හැදෑරීමට ආයතනය සූදනම් වුව ද, ඒ පිළිබඳ අවබෝධය මද වීම ආයතනයට මුහුණපෑමට ඇති ප්‍රශ්නයකි.

වී සහ සහල් ස්වාරක්ෂක තොග තබා ගැනීම පිළිබඳ විස්තරාත්මක යෝජනාවක් අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.

## ආයතනයේ කාර්යභාරය සහ අරමුණු

ආයතනයේ කාර්යභාරය සහ අරමුණු පහත සඳහන් පරිදි පනතෙහි දක්වා ඇත.

* ගොවි කටයුතු පර්යේෂණ පෝෂණය කිරීම, එම පර්යේෂණවලට සහායවීම, අනුබල දීම සහ සහයෝගය දක්වීම.

* ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, පළාත් බද ආයතන, සංස්ථා සහ වෙනත් ආයතන මඟින් සිදු කරන ගොවි කටයුතු පර්යේෂණ සම්බන්ධීකරණය කිරීම.

* කෘෂිකර්ම සංවර්ධනය කෙරෙහි බලපාන ආයතනික සාධක පිළිබඳ ගවේෂණය සහ ඒ ගැන පර්යේෂණ කිරීම.

* කෘෂිකාර්මික අරමුණු සඳහා ඉඩම් ආර්ථික වශයෙන් ඵලදදායී ලෙස උපයෝගී කර ගැනීම පිළිබඳව ගවේෂණ, පර්යේෂණ සහ අධ්‍යයන කිරීම.

* කෘෂිකාර්මික සහ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ සමාජ ආර්ථික පර්යේෂණ පැවැත්වීම.

* ගොවි කටයුතු පර්යේෂණ පිළිබඳ තනිවම හෝ මෙරට හෝ පිටරට ආයතනයක සහභාගීත්වයෙන් පුහුණු පහසුකම් සහ වැඩසටහන් සම්පාදනය හෝ ඒවා ක්‍රියාත්මක කිරීම. තවද එම පුහුණුව සම්බන්ධ ඩිප්ලෝමා උපාධි, ත්‍යාග සහ විශිෂ්ඨතා සහතික ප්‍රදානය කිරීම.

* ගොවි කටයුතු පර්යේෂණ සහ පුහුණුව පිළිබඳ සමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම හෝ පැවැත්වීමට අනුග්‍රහය දක්වීම සහ ඒ පිළිබඳ පුවත්පත් සඟරා ප්‍රකාශයට පත් කිරීම.

* ආසියාතික රටවල සහභාගීත්වය ඇතිව එම රටවල කලාපීය අවශ්‍යතා පසුරාලනු පිණිස ගොවිජන ව්‍යුහයට අදළ ගැටළු ගැන පර්යේෂණ පැවැත්වීම සහ ගොවිජන ගැටළු පිළිබඳ තොරතුරු එකතු කිරීම සහ බෙද හැරීම සඳහා මධ්‍යස්ථානයක් ඇති කිරීම.

* එබඳු පර්යේෂණ ලංකාවට සහ වෙනත් ආසියාතික රටවල් විශේෂිත කොට ගොවි කටයුතු සංවර්ධනයට සහ නූතනකරණයට සම්බන්ධ කිරීම.

පනත අනුව, උප වගන්තියෙහි සඳහන් කරුණු වෙන් වශයෙන් හෝ එසේත් නැතිනම් සියලුම කරුණු සලකා බලා ඇමතිතුමාට උපදෙස් දීම ආයතනයෙහි යුතුකම වන්නේය. තවද ඇමතිතුමා විසින් උපදෙස් සඳහා ආයතනය වෙත යොමු කරනු ලබන වෙනත් කරුණු සම්බන්ධයෙන් ද උපදෙස් දීම ආයතනයේ යුතුකම වේ.

දනට පහත සඳහන් පරිදි නම් කරනු ලබන පර්යේෂණ අංශ මඟින් ආයතනයේ කටයුතු ඉටුකරනු ලැබේ.

* කෘෂිකර්ම ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයීම් අංශය
* කෘෂිකාර්මික හා පාරිසරික සම්පත් කළමනාකරණ අංශය
* වාරි ජල කළමනාකරණ සහ ගොවිජන සබඳතා අංශය
* අලෙවි ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය
* සංඛ්‍යා ලේඛන සහ දත්ත සැකසුම් අංශය
* මානව සම්පත් සහ ආයතනික සංවර්ධන අංශය (පුහුණුව)

එක් අංශයක කටයුතු තවත් අංශයක කටයුතු වෙත බලපෑම් ඇති කරන අවස්ථා ඇතිවීම අනිවාර්ය වේ. එසේ වුවද මෙම අංශ ප්‍රති - සම්බන්ධීකරණයකට බඳුන් කොට වඩාත් පැහැදිලි තත්ත්වයක් ඇති කර ගැනීම අවශ්‍ය බව පෙනේ. එවන් ප්‍රති - සම්බන්ධීකරණයකට යොමුවන යෝජනා සකස් කර ඇත.

2004 වසරේ දී මානව සම්පත් සහ ආයතනික සංවර්ධන (පුහුණු) අංශයෙහි කටයුතු පුළුල් කිරීමට පියවර ගන්නා ලදී. පුහුණුව සඳහා නව නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු පත් කිරීම හේතු කොට ගෙන නව පුහුණු වැඩ සටහන් වර්ධනය කිරීම සහ ඒවා අලෙවි කිරීම පහසු වනු ඇතැයි අපේක්ෂා කරන ලදී.

පර්යේෂණ මඟින් සොයා ගන්නා කරුණු ශාස්ත්‍රවන්තයන් සහ සාමාන්‍ය ජනතාව වෙත ප්‍රකාශන මඟින් ගෙන යාමේ සම්ප්‍රදායික ක්‍රමය ප්‍රමාණවත් නොවන බව පැහැදිලි වී ඇත. මෙයට ප්‍රධාන හේතුව කාලය ගත වීමයි. ප්‍රකාශනයට පෙර පර්යේෂණ වාර්තා සංස්කරණ ක්‍රියාවලියකට භාජන වේ. ඒ සඳහා ගත වන කාලය පර්යේෂණ වලින් සොයා ගන්නා කරුණු ප්‍රතිපත්ති සම්පාදනයට උපයෝගී කර ගැනීමට ඇති යෝග්‍යතාවය අඩු කරයි. එබැවින් ප්‍රකාශනවලට අතිරේකව ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යය යොදා ගැනීමට ද අතුරු වාර්තා නිකුත් කිරීමට ද තීරණය කර ඇත. රූපවාහිනිය මඟින් විකාශනය කිරීමට ගැලපෙන ලෙස වීඩියෝගත කිරීම් සිදුකළ හැකි වීඩියෝ උපකරණ මිලට ගැනීමට හැකි වූයේ 2004 වසර අවසානයේදීය. පර්යේෂණ අවසන් වීම සහ එම පර්යේෂණ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම අතර කාලපරාසය අඩු කිරීම සඳහා පූර්ණ කාලීන සංස්කාරකවරයෙකු බඳවා ගැනීමට කටයුතු කරන ලදී. මෙම තනතුර වසර 10කට වැඩි කාලයක් හිස්ව තිබුණි.

පහත සඳහන් තනතුරු සඳහා පැවති ඇබෑර්තු සඳහා නිලධාරීන් පත් කරන ලදී. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක සහ පුස්තකාලයාධිපති. පර්යේෂක සේවක පිරිසෙහි පුරප්පාඩු පිරවීමට 10 දෙනෙකු පත් කරන ලදී.

ආහාර අනාරක්ෂිතභාවය සහ අනතුරට නිරාවරණය වීම පිළිබඳ තොරතුරු සහ අනුරූපන පද්ධතියක් ඇති කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලේකම් කාර්යාලයක් ඇති කරන ලදී. භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ විශේෂඥයකු සහ පළපුරුදු සාර්ව අර්ථශාස්ත්‍රඥයකු මෙම ව්‍යාපෘතියට පත් කර ඇත. මෙම පියවරවලට අනතුරුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ද ලෝක සෞඛ්‍ය සංවිධානය ද සංගණන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ද අන්තර් ජාතික ජල කළමනාකරණ ආයතනය ද නියෝජනය කළ පර්යේෂණ නිලධාරීන්ගෙන් සැදුම්ලත් වැඩ සටහනෙහි භරය එක් තැන් කළ හැකි කාණ්ඩයක් පත් කරන ලදුව, එයට උපදෙස් දීම සඳහා අධ්‍යක්ෂවරයාගේ ප්‍රධානත්වයෙන් තාක්ෂණ කමිටුවක් පත් කරන ලදී. මෙම ක්‍රියාකාරකම්වලට පසුව කෘෂිකර්ම සහ ආහාර සංවිධානය මේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ නාභි ලක්ෂ්‍ය ලෙස මෙම ආයතනය නැවත ස්ථාපිත කිරීමට එකඟ විය. අදාළ අමාත්‍යාංශවල සහාය ලබා ගනිමින් එම අමාත්‍යාංශවලට දිළිඳුකම අවම කිරීමේ කාර්යයන්ට ද ප්‍රාථමික සෞඛ්‍ය ආරක්ෂාවට ද, ආහාර සම්පාදනය වැඩි කිරීමේ වැඩ සටහන්වලට ද ප්‍රාදේශීය මට්ටමේ දී සහාය වීම අරමුණු කරගත් කැබිනට් පත්‍රිකා කෙටුම් පතක් ඉදිරිපත් කරන ලදී.

වාරි ජල සම්පාදනය, ජල කළමනාකරණය සහ ගොවිජන සබඳතා අංශය තුළ ගංගා නිම්න කළමනාකරණය පිළිබඳ ගැටළු අධ්‍යයනය සඳහා වෙනම ඒකකයක් ඇති කිරීම 2004 වසරේ දී ආරම්භ විය.

පර්යේෂණ සේවක මණ්ඩලයෙන් හතරෙන් එකක්ම අලුතෙන් බඳවා ගත් සේවකයන් විය. ඒ අතුරෙන් වැඩි දෙනෙකුට සමාජ ආර්ථික පර්යේෂණ ගැන පළපුරුද්දක් නොතිබුණි. එබැවින් පැවැත්වෙන පර්යේෂණ නිරතුරුව සමාලෝචනයට භාජනය වූ අතර එයට සහාය වීම සඳහා ජ්‍යෙෂ්ඨ සේවක පිරිසක් පත් කරන ලදී. නව යෝජනා විචක්ෂණ පිරික්සුමට භාජනකොට, වැදගත් කරුණු අතින් ඌනතා පැවති යෝජනා නිවැරදි කිරීමේ පියවර හඳුන්වා දෙන ලදී.

කුඩා පරිමාණ වාරි ක්‍රම 10,000ක් පුනරුත්ථාපනය කිරීමේ වැඩ සටහනට ප්‍රතිචාර වශයෙන් එම විෂය ගැන සම්මන්ත්‍රණයක් ආයතනය විසින් පවත්වන ලදුව, එම සම්මන්ත්‍රණයේ සාකච්ඡාවට බඳුන් වූ කරුණු 2004 වසරේ දී ප්‍රකාශයට පත් කරන ලදී.

ඩැනියුබ් වේල්ල පිළිබඳ නඩුවේ දී අන්තර් ජාතික අධිකරණයේ උප සභාපති සී.ජේ. වීරමන්ත්‍රී විනිසුරුවරයා විසින් ප්‍රකාශිත වෙනස් මතය අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි සිංහලට පරිවර්තනය කිරීම ආයතනය විසින් බාරගන්නා ලදී. ශ්‍රී ලංකාවේ පුරාතන වාරි පද්ධතිය තුළ ගැබ්ව ඇති සිද්ධාන්ත පදනම් කර ගෙන, තිරසාර සංවර්ධනය පිළිබඳ අදහස, වීරමන්ත්‍රී මහතාගේ මතය නිසා අන්තර් ජාතික නීතියට ඇතුලත් කිරීමට හැකි වී ඇත.

2004 වසර අවසන් වන විට ආයතනය සඳහා වෙබ් අඩවියක් සකස් කොට ක්‍රියාත්මක කිරීමට හැකි වී ඇත.

ආයතනය ක්‍රියාත්මක කරන ක්ෂේත්‍ර පර්යේෂණ, පර්යේෂණ කණ්ඩායම්වලට ඇති ගමනාගමන පහසුකම් මත බෙහෙවින් රඳා පවතී. ආයතනය සතු වාහන 19න් 15 ක් 2004 දී අලුත්වැඩියා කොට ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත් කරන ලදී. මෝටර් බයිසිකල් 4ක්ද අලුත්වැඩියා කරන ලදී.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත්ව තිබූ පැල්වෙහෙර සංචාරක බංගලාව 2003 වසරේදී ආයතනයට පවරන ලදී. ගොඩනැගිල්ල පිළිසකර කිරීමට අමාත්‍යාංශය ලබා දුන් රු.600,000 ප්‍රයෝජනයට ගත් නමුත් ක්‍රියාවලිය අවසන් වී නැත. ගොඩනැගිල්ල තවමත් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයක පවතී. ආයතනයේ ක්ෂේත්‍ර කාර්යාලයක් ලෙස භාවිතයට ගත හැකි අයුරින් එය සකස් කර ඇත. පුළුල් කළ යුතු බවට යෝජිත ආයතනයේ පුහුණු කටයුතු සඳහා ආධාරකයක් හැටියට ද උතුරු මැද පළාතේ ගොවි සංවිධානවල සාමාජිකයන් පුහුණුවට උපයෝගී කර ගන්නා පුහුණු මධ්‍යස්ථානයක් හැටියට ද, එම ගොඩනැගිල්ල භාවිතා කරනු ඇත.

**ඩී.ජී.පී. සෙනෙවිරත්න**
**අධ්‍යක්ෂ**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු**
**පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

2005 මාර්තු 31
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
කොළඹ 07.

# පාලක මණ්ඩලය
# (වර්ෂය තුළ වෙනස්වීම)

2004 වසර තුළ පාලක මණ්ඩල සංයුතියෙහි පහත සඳහන් වෙනස්කම් සිදු විය.

කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශයේ ලේකම් ධූරයෙන් ඉවත් වීමෙන් පසුව ධනසේන හෙට්ටිආරච්චි මහතාගේ පාලක මණ්ඩල සභාපති ධූර කාලය අවසන් විය.

තිස්ස වර්ණසූරිය මහතා කෘෂිකර්ම සහ පශු සම්පත්, ඉඩම් සහ වාරි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් ධූරයට පත්වීමත් සමඟ පාලක මණ්ඩලයේ සභාපති ධූරයට පත්විය.

මහාචාර්ය එම්.ඕ.ඒ. ද සොයිසා මහතා ආයතනයේ අධ්‍යක්ෂ ධූරයෙන් අස්වීමත් සමඟ පාලක මණ්ඩලයේ සාමාජිකත්වයෙන් ඉවත් විය.

ඩී.ජී.පී. සෙනෙවිරත්න මහතා ආයතනයේ අධ්‍යක්ෂ ධූරයට පත්වීමත් සමඟ පාලක මණ්ඩලයේ සාමාජික ධූරයට පත්විය.

මුතුබණ්ඩා එම්. පෙරේරා මහත්මිය පාලක මණ්ඩලයේ සාමාජිකත්වයෙන් ඉවත් විය.

කේ.ඒ.එස් ගුණසේකර මහතා විශ්‍රාම ගැනීමත් සමඟ මණ්ඩලයේ සාමාජිකත්වයෙන් ඉවත් විය.

ඉන්ද්‍රානි සුගතදස මහත්මිය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය නියෝජනය කිරීම පිණිස පාලක මණ්ඩලයේ සාමාජිකත්වය ලැබුවාය.

ආචාර්ය ජී. උස්වත්ත ආරච්චි මහතා මහ බැංකුවේ සේවයෙන් ඉවත් වීමත් සමඟ පාලක මණ්ඩලයේ සාමාජිකත්වයෙන් ඉවත් විය.

කේ.එල්.ද සිල්වා මහතා ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරනු පිණිස පාලක මණ්ඩලයේ සාමාජික ධූරය ලැබීය.

ජී.ටී. ධර්මසේන මහතා විශ්‍රාම ගැනීමත් සමඟ පාලක මණ්ඩලයේ සාමාජිකත්වයෙන් ඉවත් විය.

කේ.එස්.ආර්. ද සිල්වා මහතා වාරිමාර්ග අධ්‍යක්ෂ ජෙනරාල් හැටියට පත්වීමත් සමඟ පාලක මණ්ඩලයේ සාමාජිකත්වයට පත් විය.

එම්. වීරසිංහ මහතා (අතිරේක ලේකම් සංවර්ධන) මහවැලි හා ගංගා නිම්න සංවර්ධන අමාත්‍යාංශය නියෝජනය කරනු පිණිස පාලක මණ්ඩලයේ සාමාජිකත්වයට පත්විය.

ඒ.බෙඩිගා පෙරේරා මහතා (අධ්‍යක්ෂ කෘෂිකර්ම සංවර්ධන) කෘෂිකර්ම සහ පශු සම්පත් අමාත්‍යාංශය නියෝජනය කරනු පිණිස පාලක මණ්ඩලයේ සාමාජිකත්වයට පත්විය.

කේ.පී. ඉන්ද්‍රන් මහතා (අධ්‍යක්ෂ පොදු ව්‍යවසාය සංවර්ධන) මුදල් අමාත්‍යාංශය නියෝජනය කරනු පිණිස පාලක මණ්ඩලයේ සාමාජිකත්වයට පත්විය.

# කාර්ය මණ්ඩල සංවර්ධනය

## පශ්චාත් උපාධි වැඩ සටහනක්

පහත සඳහන් පර්යේෂණ නිලධාරීන් පශ්චාත් උපාධි අධ්‍යයනයන්හි යෙදී සිටියහ.

| | | |
|---|---|---|
| එල්.පී. රූපසේන මහතා | - | ඉන්දියාවේ කෘෂි විද්‍යා විශ්ව විද්‍යාලයේ කෘෂි ව්‍යාපාර කළමනාකරණය ගැන ආචාර්ය උපාධිය |
| ඩබ්.ඩී. වික්‍රමසිංහ මහත්මිය | - | ජර්මනියේ ග්ලේසන් විශ්ව විද්‍යාලයේ කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳව ආචාර්ය උපාධිය |
| එම්.එස්. සේනානායක මහතා | - | චීනයේ හුෂොං විශ්ව විද්‍යාලයේ අන්තර් ජාතික වෙළඳම පිළිබඳ වැඩ සටහනෙහි ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යත්ව ලාභියකු වීම |
| එස්.එම්.ඒ. සමරකෝන් මහතා | - | පිලිපීනයේ ලොස් බානෝස් විශ්ව විද්‍යාලයේ ග්‍රාමීය සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව |
| පී.ආර්. වීරක්කොඩි මහත්මිය | - | නුගේගොඩ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වන විද්‍යාව සහ පරිසර කළමනාකරණය පිළිබඳ M.Sc උපාධිය |
| එම්.ඒ.සී. සිදත් බණ්ඩාර මහතා | - | පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය පිළිබඳ විශේෂ M.Sc උපාධිය |
| ජී.ජී.ද එල්.ඩබ්. සමරසිංහ මෙනෙවිය | - | පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය පිළිබඳ විශේෂ M.Sc උපාධිය |

පහත සඳහන් නිලධාරීහු පුහුණු වැඩ සටහන් සහ වැඩමුළුවලට සහභාගී වූහ.

ආචාර්ය ඩබ්.ජී. ජයසේන මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ), ඉන්දියාවේ හයිද්‍රාබාද්හි 2004 පෙබ.02 සිට 21 දක්වා පැවති 'ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන් සඳහා කෘෂිකර්ම පර්යේෂණ කළමනාකරණ පුහුණුව' නැමැති පාඨමාලාවට සහභාගී විය.

මහාචාර්ය එම්.ඕ.ඒ.ද සොයිසා මහතා, අධ්‍යක්ෂ, නේපාලයේ කත්මන්ඩු නුවර 2004 පෙබ.23-27 දක්වා පැවති විමධ්‍යගත කිරීම පිළිබඳ විවිධ රටවල අත්දැකීම් සාකච්ඡාවට භාජන කළ CIRDAP උප කලාපීය වැඩමුළුවට සහභාගී විය.

මහාචාර්ය එම්.ඕ.ඒ.ද සොයිසා මහතා, අධ්‍යක්ෂ, 2004 අප්‍රේල් 18-22 දක්වා බංග්ලාදේශයෙහි ඩකා නුවර පැවති යහපත් ආණ්ඩුකරණය සඳහා ගුරුපදේශ සකස් කිරීම පිළිබඳ CIRDAP අනුගාමී වැඩමුළුවට සහභාගී විය.

එන්.එස්.ඩබ්. නවරත්න මහතා, සංඛ්‍යාන නිලධාරී, චීනයේ වුහාන් නුවර 2004 අප්‍රේල් 01 සිට ජූලි 31 දක්වා පැවති නූතන කෘෂිකර්මය පිළිබඳ පාඨමාලාවට සහභාගී විය.

ටී.ඒ. ධර්මරත්න මහතා, සහාය අධි පර්යේෂක, පිලිපීනයේ මැනිලා නුවර 2004 ජූලි 19 සිට 23 දක්වා පැවති කෘෂිකර්ම ඵලදායිතාව සහ තරඟකාරිත්වය වර්ධනය කිරීම සඳහා තොරතුරු ජාලගත කිරීම පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගී විය.

ආචාර්ය ඩී. ගමගේ මහතා, අධි පර්යේෂක, 2004 සැප්. 08 සිට 15 දක්වා ජපානයේ පැවති 'සහල් යනු අපගේ ජීවයයි' යන සම්මන්ත්‍රණයට සහභාගී විය.

එම්.එස්. සේනානායක මහතා, සහාය අධි පර්යේෂක, 2004 නොවැ. 13 සිට 14 දක්වා ජපානයේ පැවති ජපානයේ ආර්ථික ප්‍රතිපත්ති සංගමයේ තෙවන අන්තර් ජාතික සම්මන්ත්‍රණයට සහභාගී විය.

## 2004 වසර තුළ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන කවය මෙහෙය වූ සම්මන්ත්‍රණ, වෙනත් සම්මන්ත්‍රණ සහ වැඩමුළු

| අංකය | සම්මන්ත්‍රණයේ, වැඩමුළුවේ මාතෘකාව | කථිකයෝ | පැවැත් වූ දිනය | ස්ථානය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපොළ, භාණ්ඩාගාර බිල්පත් හුවමාරුව හා බැංකු පොලී අනුපාතය අතර සබඳතාවය සහ ඒවායේ ආර්ථික බලපෑම | ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා | 2004.03.29 | හෙ.කො.ගො. ප.පු.ආ. සම්මන්ත්‍රණ ශාලාව | 23 |
| 2. | ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර වාරි තාක්ෂණය කුඩා පරිමාන ගොවිතැන් කටයුතු සඳහා යොදා ගැනීම - දියුණුවට ඇති අවස්ථා සහ අවහිරතා | එම්.එම්.එම්. අභියර් මහතා | 2004.03.30 | හෙ.කො.ගො.ප. පු. ආයතන සම්මන්ත්‍රණ ශාලාව | 23 |
| 3. | වැසි ජලය එකතු කිරීම සහ එම ජලයෙන් ප්‍රයෝජන ගැනීම : චීනයේ අත්දැකීම් | ආචාර්ය ඩබ්.එම්. ජී.බී. ගිරාගම | 2004.04.29 | හෙ.කො.ගො.ප. පු. ආයතන සම්මන්ත්‍රණ ශාලාව | 21 |
| 4. | විද්‍යා දේශනයක් (ඉදිරිපත් කිරීමක්) කරන්නේ කෙසේද? | ආචාර්ය ඩබ්.කේ. හිරිබුරේගම මහතා | 2004.05.27 | හෙ.කො.ගො.පු., ආ. දේශන ශාලාව | 15 |
| 5. | ශ්‍රී ලංකාවේ 100% ජීව ස්කන්ධ බල ශක්ති යන්ත්‍රාගාරයක් ඉදිකිරීම පිළිබඳ යෝජිත ව්‍යාපෘතිය සඳහා දහයියා නිපැයුම ප්‍රමාණකරණය පිළිබඳ සාකච්ඡාව සහ දේශනය | මහාචාර්ය ජෝන් බාලවන්ද්‍රන් මහතා | 2004.06.04 | හෙ.කො.ගො.ප.පු., ආයතන දේශන ශාලාව | 26 |
| 6. | ශ්‍රී ලංකාවේ වැසි ජලය එකතු කිරීම සහ සංරක්ෂණය | අභය ඒකනායක මහතා | 2004.06.24 | එම- මණ්ඩලීය කාමරය | 23 |
| 7. | ක්ෂුද්‍ර ව්‍යවසායකත්ව සංවර්ධනය - ඉන්දියානු අත්දැකීම් | එච්.එන්.එස්.ජේ. එම්. හිටිහාමු මෙනෙවිය | 2004.08.05 | දේශන ශාලාව | 25 |
| 8. | ගෝලීයකරණය සහ කෘෂිකර්ම සංවර්ධනය ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ප්‍රතිපත්ති සංශෝධනය පිළිබඳ සමාලෝචනයක් | ජී.එම්. හේනෙගෙදර මහතා | 2004.09.07 | හෙ.කො.ගො.ප. පු. ආයතනය | 21 |
| 9. | දිළිඳුකම අවම කිරීම සහ පාරිසරික පාලනය - දකුණු ආසියා අත්දැකීම් | ආචාර්ය ඩබ්.ජී. සෝමරත්න මහතා | 2004.04.29 | එම | 30 |
| 10. | ගොවි සමාගම් සහ කෘෂිකර්ම නූතනකරණය | එම්.එස්. සේනානායක මහතා | 2004.10.05 | මණ්ඩල සාකච්ඡා කාමරය | 26 |
| 11. | ශ්‍රී ලංකාවේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිළිබඳ කාර්ය සාධන ඇස්තමේන්තුවක් මගින් සොයා ගත් කරුණු | ඩබ්.එච්.ඩී. පියදර්ශන මහතා | 2004.09.30 | හෙ.කො.ගො.ප.පු ආයතනය | 25 |
| 12. | ආහාර අනාරක්ෂිතභාවය සහ අනතුරට නිරාවරණය වීම පිළිබඳ තොරතුරු සහ අනුරූප පද්ධතිය ගැන වැඩ මුළුව | හෙ.කො.ගො.ප.පු.ආ. සහ ආහාර සහ කෘෂිකර්ම සංවිධානයනය | 2004.07.23 | එම | 25 |
| 13. | කුඩා වැව් ආශ්‍රිත ජනාවාස පිළිබඳ සම්මන්ත්‍රණය | හෙ.කො.ගො.ප.පු. ආයතනය | 2004.08.21 | හෙ.කො.ගො.ප.පු ආ.සම්මන්ත්‍රණ ශාලාව | 50 |
| 14. | CIRDAP තාක්ෂණ කමිටුවේ 20 වන රැස්වීම | හෙ.කො.ගො.ප.පු. ආයතනය | 2004.09.21-22 | එම | CIRDAP සාමාජික රටවල නියෝජිතයෝ |
| 15 | කාබනික ගොවිතැන් ක්‍රමය තුළ පණු රෝපනය (Vermiculture) යොදා ගැනීමෙහි සමාජ ආර්ථික හැකියාව සහ එයට අදාළ කළමනාකරණ ක්‍රියාකාරකම් | - | 2004.11.14 | එම | 25 |
| 16. | මාතලේ සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ලොකු ළූණු නිෂ්පාදනය සහ අලෙවිය | සී.ජේ.ද සිල්වා මහතා | 2004.11.23 | එම | 25 |
| 17. | සුනාමියට ප්‍රතිචාර දැක්වීම | ජානක ජයවික්‍රම මහතා මාධවී අරියබන්දු මිය | 2004.12.31 | එම | 50 |

**පහත සඳහන් නව පර්යේෂණ ව්‍යාපෘති 2004 වසර තුළ ක්‍රියාත්මක කරන ලදී.**

01. ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල ප්‍රදේශයේ පිහිටි ඉලුක්කුඹුර නම් ගමෙහි කෘෂි නිෂ්පාදන එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම මඟින් කෘෂි නිෂ්පාදන අලෙවිය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ සමීක්ෂණය.
02. ගැටුම් පවතින ප්‍රදේශයට මායිම් වූ ගම්වල කෘෂි සංවර්ධනය නැවතත් ඇති කිරීම සඳහා සාමය නිසා ඇති වූ බලපෑම - අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගම් දෙකක පැවැත් වූ ප්‍රත්‍යේක අධ්‍යයනයක්.
03. ගොවි සමාගම් පිළිබඳ අධ්‍යයනය.

**2004 වසර තුළ පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘති අවසන් කරන ලදී.**

01. රුහුණු නිම්නයේ තෝරාගත් පාදක ලක්ෂණ ඇතුළත් ප්‍රදේශයෙහි දිළිඳුකම, ආහාර අනාරක්ෂිතභාවය සහ අනතුරට නිරාවරණය වීම පිළිබඳ අවකාශමය සහ කාලීන ගතිකයන් ඇස්තමේන්තු කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතිය.
02. කෘෂිකර්ම සහ සංවර්ධන උපාය මාර්ග තුළ පෞද්ගලික සහ පොදු අංශ අතර සම්බන්ධය.
03. තෝරාගත් පලතුරු වර්ග නිපැයුම සහ අලෙවිය විශ්ලේෂණය කිරීම. (කෙසෙල්, අඹ, අන්නාසි, පැපොල් සහ පැෂන් පෲට්)
04. ශ්‍රී ලංකාවේ සමෘද්ධි සහ සමෘද්ධි නොවන ක්ෂුද්‍ර ව්‍යවසාය ගැන සංසන්දනාත්මක විශ්ලේෂණයක්.
05. මාතලේ සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ලොකු ළූණු නිපැයුම සහ අලෙවිය.
06. පොලොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය.
07. පශු සම්පත් අංශයට අදළ (කිරි පට්ටි උප අංශය) සේවය සහ බෙද හැරීම සම්බන්ධයෙන් පෞද්ගලික අංශයේ මැදිහත්වීම. දියුණුවට ඇති අවස්ථා සහ බාධක.
08. ශ්‍රී ලංකාවේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල කාර්ය සාධනය ඇස්තමේන්තු කිරීම.
09. මහවැලි එච් ප්‍රදේශයේ දෙවන සහ තුන්වන පරම්පරා සඳහා පවතින රැකියා අවස්ථා පිළිබඳ වත්මන් තත්ත්වය සහ අනාගත බලාපොරොත්තු.
10. අයවැය ගමන් මග විමසීම සහ විශ්ලේෂණ පද්ධති ක්‍රියාත්මක කිරීම සහ සැලසුම් කිරීම උදෙසා ශ්‍රී ලංකා රජයට ලැබුණු ආධාර
11. යෝජිත ජල සම්පත් ප්‍රතිපත්තිය පිළිබඳ ජනතාව දනුවත් කිරීමේ වැඩ පිළිවෙල.
12. ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන වියදම කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යයනයක්.

## කාර්ය මණ්ඩල තත්ත්වය

වසර තුළ ආයතනයේ කාර්ය මණ්ඩල තත්ත්වය පහත සඳහන් පරිදි වේ.

| | 2003.12.31 දිනට තත්ත්වය | වසර තුළ සේවය අවසන් වීම හෝ ඉල්ලා අස්වීම | පත්වීම් | 2004.12.31 දිනට තත්ත්වය |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | 01 | 01 | 01 | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 | - | - | 01 |
| අංශ ප්‍රධානී | 06 | - | - | 06 |
| පර්යේෂණ කාර්ය මණ්ඩලය | 31 | 01 | - | 30 |
| පරිපාලන කාර්ය මණ්ඩලය | 06 | 02 | - | 04 |
| ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය (පුස්තකාලය) | 02 | 01 | 01 | 02 |
| දත්ත සංවර්ධන ඒකකය | 02 | - | - | 02 |
| පරිඝනක ඒකකය | 01 | - | - | 01 |
| ප්‍රකාශන ඒකකය | 04 | 01 | - | 03 |
| සංඛ්‍යාන කාර්ය මණ්ඩලය | 25 | - | - | 25 |
| තාක්ෂණ කාර්ය මණ්ඩලය | 02 | - | - | 02 |
| ලිපිකාර, ලේකම් කටයුතු හා ඊට සමාන්තර ශ්‍රේණි | 51 | - | - | 51 |
| ක්‍රියාකරවන්නන් සහ ආශ්‍රිත ශ්‍රේණි | 41 | 02 | - | 39 |
| සම්පූර්ණ සංඛ්‍යාව | 173 | 08 | 02 | 167 |

# කෘෂිකර්ම ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය

**කාර්ය මණ්ඩලය :**

| | | |
|---|---|---|
| ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා | - | වැඩ බලන අංශ ප්‍රධානී |
| ජී.එම්. හේනෙගෙදර මහතා | - | අධි පර්යේෂක |
| එස්.ආර්. බණ්ඩාර මහත්මිය | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි |
| ආර්.එල්.එන්. ජයතිස්ස මහතා | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි |
| එන්.පී.ජී. සමන්ත මහතා | - | පර්යේෂණ නිලධාරි |
| එම්.කේ.එන්. දමයන්ති මෙනවිය | - | පර්යේෂණ නිලධාරි |
| සාගරිකා හිටිහාමු මෙනවිය | - | පර්යේෂණ නිලධාරි |
| ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා | - | පර්යේෂණ නිලධාරි |
| එන්.එන්.ඒ. ද සිල්වා මහතා | - | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරි |
| එස්. සේනානායක මහතා | - | සංඛ්‍යාන නිලධාරි |

**නිමකළ අධ්‍යයන**

1. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය විවිධාංගීකරණය සඳහා ගොවිපොළ නොවන අංශයේ දායකත්වය.
   පර්යේෂකයෝ : එස්.ආර්. බණ්ඩාර මහත්මිය
   ආර්.එල්.එන්. ජයතිස්ස මහතා

විචාරයයන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් අනුව පළමු වාර්තා කෙටුම්පත සංශෝධනය කරනු ලැබේ.

2. තිරසාර ග්‍රාම සංවර්ධන වැඩ සටහන

පොදු සම්බන්ධීකාරක : ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා

ව්‍යාපෘති සම්බන්ධීකාරකයෝ :

ආචාර්ය ඩී. තෙන්නකෝන් මහතා
සී. හතුරුසිංහ මහත්මිය
එස්.කුසුම් කුමාර මහත්මිය
ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා
පී. පියරත්න මහතා
අයි.ආර්. පෙරේරා මහතා
ආචාර්ය ඩබ්.එම්.ගිරාගම
ආර්.එම්.ආර්.බණ්ඩාර මහතා
ආර්.එල්.එන්. ජයතිස්ස මහතා

පර්යේෂකයෝ :

වී. රවිචන්ද්‍රන් මහතා
එන්.පී.ජී. සමන්ත මහතා
එම්.කේ.එන්. දමයන්ති මෙනෙවිය
සී. ජයම්පති ද සිල්වා මහතා
ජේ.කේ. හේරත් මහතා
එච්.එන්.එස්.ජේ.එම්. හිටිහාමු මෙනෙවිය
ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා

**හැඳින්වීම :**

ග්‍රාම සංවර්ධනය සඳහා නව ප්‍රවේශයක් සොයා ගැනීමේ අරමුණින් ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය, ප්‍රමුඛ අන්තර්ගතයන් දෙකකින් සමන්විත විය. (i) සංවර්ධන අන්තර්ගතය (ii) තොරතුරු එකතුව. ආදර්ශන හැටියට සංවර්ධනය කරනු ලබන තෝරාගත් ගම්මාන, විවිධ කෘෂි - කාලගුණ කලාපවල පිහිටි ක්ෂේත්‍ර රසායනාගාර ලෙස සකසනු ලැබේ. මෙවන් ක්ෂේත්‍ර රසායනාගාර 9ක් දිස්ත්‍රික්ක 8 ක් තුළ පිහිටා ඇත.

**ප්‍රගතිය :**

මූලික තොරතුරු රැස්කරන අවධිය තුළ යෝජිත සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට නොහැකි බව අවබෝධ විය. එයට හේතුව නම් අනුග්‍රහය දක්වන ප්‍රධාන ආයතනය වන සමෘද්ධි අමාත්‍යාංශයට තව දුරටත් අවශ්‍ය අරමුදල් ලබා දීමට නොහැකි වීමය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ව්‍යාපෘතිය සමාප්ත කරන ලදී. එක් එක් ගම සඳහා සකස් කළ අවසන් ඇගයීම් සහ අධ්‍යයන වාර්තා සාරාංශගත කොට එක් වාර්තාවක් සකස් කරන ලදී.

**ව්‍යාපෘතියෙන් උගත් පාඩම් සහ ලබාගත් අත්දැකීම්**

1. දැනට පවත්නා පරිසරයෙහි භෞතික සහ මානව සම්පත් නිසි කළමනාකාරිත්වයක් යටතේ වඩා ඵලදායී සහ කාර්යක්ෂම ලෙස උපයෝගී කර ගැනීමෙන් ග්‍රාමීය අංශයෙහි ගැටළු රාශියක් නිරාකරණය කළ හැක. උදහරණයක් ලෙස වඩා වැඩි මිලක් වියදම් නොකර මොනරාගල දිස්ත්‍රික්කයේ නිකවැව ගමෙහි වී අස්වැන්න අක්කරයකට බුසල් 60 සිට 80 ක් හෝ 85 ක් දක්වා වැඩි කිරීමට හැකියාවක් තිබීම දක්විය හැක. මෙහිදී සිදු වූයේ නව වී වර්ගයක් ලබාදී ගමෙහි සෑහෙන තරම් ලබාගත හැකි දැනට ප්‍රයෝජනයක් නොලබන ගොම පෝර වැනි ද්‍රව්‍ය භාවිතයට අනුබල දීම සහ වෙනත් යෝග්‍ය ගොවිතැන් ක්‍රම අනුගමනය කිරීමට පෙළඹවීමයි.

2. කවර සංවර්ධන මැදිහත් වීමක දී වුවද සාධනීය ලෙස සහභාගී ක්‍රම උපයෝගී කර ගන්නේ නම් නිෂ්පාදනය සහ ඵලදායිතාවය නැංවීමට පුළුවන. මෙයට එක් උදහරණයක් නම් ප්‍රදේශයෙන් ලබා ගත හැකි කම්කරු ශ්‍රමය ද වැලි සහ ගල් වැනි සම්පත් ද උපයෝගී කර ගැනීම හේතු කොට ගෙන ව්‍යාපෘතියෙන් රු.60,000/- ක් පමණක් වියදම් කොට කෘෂි ළිඳක් තනා ගත හැකිවීමයි. එම ළිඳෙහි වටිනාකම රු.100,000/- කි.

3. ගම්වල පවත්නා දේශපාලන ගැටුම් ඇතුළු විවිධ ගැටුම් හේතු කොට ගෙන සංවර්ධන උත්සාහයන් අඩපණ වී ඇත. මෙම හේතු නිසා ග්‍රාමීය සංවර්ධනයට බාහිර මූලාශ්‍රවලින් ලැබී ඇති සම්පත් අපේක්ෂිත පරමාර්ථ සඳහා යොදා ගැනීමට නොහැකි වී ඇත. උදහරණ වශයෙන් මාතලේ දිගම්පතහ ගමට REAP ව්‍යාපෘතිය යටතේ ලබා දීමට එකඟ වූ කෘෂි ළිං 25න් 23 ක්ම පසු කලෙක වෙනත් ගම්වලට ලබාදී ඇත.

4. 'ව්‍යාපෘතිය' යනුවෙන් හැඳින්වෙන්නේ සම්පත් සහ මුදල් විශාල වශයෙන් වෙන් කරනු ලබන ඕනෑම මාදිලියක සංවර්ධන ක්‍රියාවලියක්ය යන විශ්වාසය මහජනයා අතර පවතී. මෙ වැරදි අවබෝධය නිසා ස්වයං උපකාරය සහ ස්වශක්තිය මත රඳා පවත්නා තිරසාර සංවර්ධන ව්‍යාපෘතියකට අවධානය ලබා ගැනීම අපහසු විය.

5. තම නිෂ්පාදනවලට අඩු මිලක් ලැබීම සහ පොහොර මිල වැඩි වීම වැනි ගොවීන් අතර පවත්නා නොයෙක් ගැටළු, දේශීය නිෂ්පාදන වෙනුවට යොදා ගත හැකි භාණ්ඩ ආනයනය කිරීම, පොහොර සඳහා ලබා දුන් සහනාධාර අඩු කිරීම වැනි සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සමඟ බැඳී පවතින බව පර්යේෂකයන්ගේ අත්දැකීමට අසුවිය. එබැවින් එවැනි ගැටළුවලට තිරසාර ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘතියකින් විසඳුම් ලබා දීම උගහටය.

**දැනට සිදු කරන අධ්‍යයන**

1. කිරි නිෂ්පාදන මිල කෙරෙහි බලපාන සාධක

සම්බන්ධීකාරක : එච්.එම්.එස්.ජේ.එම්. හිටිහාමු මෙනවිය
පර්යේෂකයෝ : ගාමිණී රත්නායක මහතා
එන්.පී.ජී. සමන්ත මහතා

1. නිෂ්පාදන පරිමාණය, කළමනාකරණ ක්‍රියාකාරකම් සහ තාක්ෂණය පදනම් කොට කුරුණෑගල දිස්ත්‍රික්කයේ කිරි නිෂ්පාදන වියදම දනගැනීම සහ මැනීම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය. අධ්‍යයනයේ විශේෂිත අරමුණු නම්, කුඩා පරිමාණ කිරි නිෂ්පාදනය පිළිබඳ පිරිවැය සහ ප්‍රතිලාභය විශ්ලේෂණය කිරීම, කිරි නිෂ්පාදනයට බලපාන ආයතනික සාධකවල වැදගත්කම පිරික්සීම, කිරි නිෂ්පාදනයට සම්බන්ධ පරදු දරන්නන්ගේ හැසිරීම් රටාව නිර්ණය කිරීම සහ කිරි නිෂ්පාදන කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමට යෝග්‍ය ප්‍රතිපත්ති යෝජනා කිරීමය.

සමීක්ෂණය අනුව පෙනී ගිය කරුණක් නම්, 2004 වසරේ දී, කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි කිරි ලීටරයක් සැපයීමේ සාමාන්‍ය පිරිවැය රු.10.93 ක් බව සහ කිරි විකිණිය හැකි මිල ලීටරයක් රු.16/- ක් බවයි. ගොවියන් වැඩි දෙනෙක් අර්ධ තීව්‍ර කළමනාකරණ ක්‍රම අනුගමනය කළහ. එබැවින් ශුද්ධ යෙදවුම තරමක් පහත මට්ටමක පැවතුණි. පිරිවැයෙන් 50%කට වැඩි ප්‍රමාණයක් ශ්‍රමය සඳහා යොදවා ඇත.

කර්මාන්තයට මුහුණ පෑමට සිදු වී ඇති ප්‍රධාන බාධකය සාන්ද්‍ර ආහාරවල අධික මිල බව අධ්‍යනයෙන් හෙළි විය. ප්‍රදේශයෙන් ලබා ගත හැකි සම්පත් යොද නිෂ්පාදනය වැඩි කිරීමට සැලකිය යුතු තරමින් ගොවීන්ට ව්‍යාප්ති සේවයේ පිහිට නොලැබුණ බව ද පැහැදිලි විය.

## 2. ශ්‍රී ලංකාවේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල ක්‍රියාකාරිත්වය පිළිබඳ ඇගයීමක්

සම්බන්ධීකාරක : ඩබ්.එච්. දුමින්ද ප්‍රියදර්ශන මහතා
පර්යේෂකයෝ : රෝෂිණී රඹුක්වැල්ල මහත්මිය
රුවනී විදනපතිරණ මහත්මිය
බණ්ඩාර රත්නායක මහතා

මෙරට ග්‍රාමීය අලෙවි පහසුකම් දියුණුවට 1990 දශකයේ අපර භාගයේ සිට රජය ගත් පියවර අතුරෙන් ප්‍රමුඛතාවය හිමි එක් පියවරක් වන විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීමේ වැඩ සටහන ඇගයීම මෙම අධ්‍යයනයේ අරමුණයි. අධ්‍යනයේ විශේෂිත අරමුණු අතර පහත සඳහන් ද ඇතුළත් විය. වෙළඳපොළෙහි සිටින විවිධ මාදිලියේ වෙළෙන්දන්, සැපයුම්කරුවන් සහ ගැනුම්කරුවන් හඳුනා ගැනීම, ශ්‍රේණිගත කිරීම සහ ඇසුරුම වැනි වෙළඳ ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීම, ගොවීන්ට සහ වෙළෙන්දන්ට මුහුණපෑමට ඇති ප්‍රශ්න පරීක්ෂා කිරීම සහ වෙළඳ කටයුතු සඳහා තෝරා ගෙන ඇති ස්ථානයෙහි යෝග්‍යතාවය විමර්ශනය කිරීම.

i. කැප්පෙටිපොල සහ මීගොඩ සමඟ සසඳ බැලීමේ දී ස්වාභාවිකව ගොඩ නැඟුන දඹුල්ල මධ්‍යස්ථානය වඩාත් වේගයෙන් වර්ධනය වී ඇති බව මූලික සොයා ගැනීම්වලින් පැහැදිලි වේ.

ii නුවර, කුරුණෑගල, අනුරාධපුර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය සහ මඩකලපුවට යන පාරවල් එක්වන ස්ථානයක් වීම, මාතලේ නුවර සහ නුවරඑළිය යන එළවළු සපයන ප්‍රදේශවලට පහසුවෙන් යා හැකි වීම, විශාල තොග වශයෙන් එළවළු මිලට ගන්නා උතුරු නැගෙනහිර හමුද කඳවුරු වැනි ස්ථාන පැවතීම, වැනි පිහිටා ඇති ස්ථානයට සම්බන්ධ හේතු දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ සාර්ථක ක්‍රියාකාරිත්වයට ප්‍රධාන වශයෙන් පාදක වී ඇත.

කැප්පෙටිපොල සහ මීගොඩ ආර්ථික මධ්‍යස්ථානවල අසතුටුදායක ක්‍රියාකාරිත්වයට වැරදි ස්ථානගත කිරීම සහ වෙළඳ කුටි වෙන් කිරීමේ දේශපාලන බලපෑම් ඇති වීම හේතු වී ඇත.

### නව අධ්‍යයන

1. ගැටුම් පවතින ප්‍රදේශයට මායිම් වූ ගම්වල කෘෂි සංවර්ධනය නැවතත් ඇති කිරීම සඳහා සාම

ක්‍රියාවලිය නිසා ඇති වූ බලපෑම : අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගම් දෙකක සිදු කළ ප්‍රත්‍යේක අධ්‍යයනයක්

සම්බන්ධීකාරක : ඇම්.කේ.එන්. දමයන්ති මෙනෙවිය

උපදේශක : ආචාර්ය ඩී. ගමගේ මහතා

ප්‍රචණ්ඩත්වය නිමවීම හෝ පවත්නා සාම ක්‍රියාදමය හේතු කොට ගෙන, යුද්ධයෙන් පීඩනයට පත් දිස්ත්‍රික්කයන්ට යාබද ගම්වල වෙසෙන ජනතාවගේ ජීවනෝපාය සහ ජීවන තත්ත්වය කෙතරම් දුරට සාමාන්‍යත්වයට පත්වේද යන්න නිර්ණය කිරීම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය.

විශේෂිත අරමුණු වූයේ පහත සඳහන් කරුණු පරීක්ෂා කොට එම සාධකවල බලපෑම ඇස්තමේන්තු කිරීමයි.

i යුද්ධය නිසා අතහැර දමන ලද ඉඩම් පැවතියේ නම් ඒවා නැවත නිෂ්පාදන කටයුතු සඳහා යෙදවීම.
ii සාම ක්‍රියාදමය නිසා ඉඩම් භාවිතය පිළිබඳ තීව්‍රතාවය, භෝග විවිධාංගකරණය සහ නිෂ්පාදනය වැඩිකරන තාක්ෂණය භාවිතයට ගැනීම යන කරුණු ඉටු වී නම් එම කරුණුවල බලපෑම.
iii ගමෙහි නිෂ්පාදන අලෙවි කිරීම පිළිබඳ ගැටළු නිරාකරණය කිරීමට සාම ක්‍රියාදමය කෙතෙක් දුරට ඉවහල් වී තිබේද යන සාධකය.
iv එළදයීතාව සහ ගෘහස්ථ ආදායම පිළිබඳ නැඹුරුතා.
v අවබෝධතා ගිවිසුමෙන් පසු ගොවිපළ තුළ සහ ඉන් පිටත රැකියා අවස්ථා වර්ධනය පිළිබඳ නැඹුරුතා.
vi සේවාවලට (ගමනාගමනය, අධ්‍යාපනය, සෞඛ්‍යය, තැපැල් සේවය ආදියට) ප්‍රවේශය සහ එම සේවාවලින් ප්‍රයෝජන ගැනීමේ නැඹුරුතා.
vii ජීවන තත්ත්වය පිළිබඳ නැඹුරුතා (ආහාර සුරක්ෂිතභාවය සහ භෞතික වල්‍යතාවය ආදියෙන් පිළිඹිබුවන පරිදි).
viii කෘෂිකර්ම අංශය විශේෂිත කොට වර්ධනය සඳහා දැනට පවත්නා අවස්ථා පූර්ණ වශයෙන් සාක්ෂාත් කර ගැනීමට පෙර ජය ගත යුතු ඉතිරි අභියෝග ඇස්තමේන්තු කිරීම.

අධ්‍යනය සඳහා තෝරාගත් යාබද ගම්මාන දෙක වන්නේ, තම්මැන්නාකුලම සහ මහකොන්ගස්කඩ යි. ඒවා අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇත. යුධ බියෙන් තොර තත්ත්වය තේරුම් ගැනීමට තම්මන්නාකුලම ගමට නුදුරු පුල්එලිය ගම ද අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී.

ප්‍රශ්නාවලියක් මඟින් නියැදි ගෘහස්ථ සමීක්ෂණයට පාත්‍ර කිරීම දත්ත එකතුව සඳහා යොදගත් ප්‍රධාන ක්‍රමෝපාය වේ. එම සමීක්ෂණය තෝරාගත් ගම්වල ගෘහස්ථ 90% කට අධික ප්‍රමාණයක් ආවරණය කළේය. තෝරාගත් ගම්වල අලුතෙන් ස්ථාපනය වූ (2002ට පසු) ගෘහස්ථ ප්‍රශ්නාවලිය පදනම් කර ගත් සමීක්ෂණයට හසු නොවිය. සටන් විරාමයට පෙර සහ ඊට පසු පැවති වෙනස්වන්නා වූ ජීවනෝපාය සඳහා වන ක්‍රියාකාරකම් ද ජීවනෝපයට බලපාන විපාක ද ජීවන තත්ත්වය ද දැන හඳුනා ගැනීමට උචිත ලෙස ප්‍රශ්නාවලිය සකස් කරන ලදී. ප්‍රශ්නාවලියෙන් හෙළිවන කරුණු ඌනපූරණයට ත්‍රිකෝණ ආධාරයෙන් මැනීමට, නිරීක්ෂණ මඟින් හා ග්‍රාමීය මට්ටමේ නිලධාරීන්, ප්‍රදේශයේ ක්‍රියාකාරී වන රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා නායකයින් ඇතුළු මුඛ්‍ය තොරතුරු සම්පාදකයන් සමඟ පැවති සම්මුඛ සාකච්ඡා මඟින් දනගත් කරුණු උපයෝගී කර ගන්නා ලදී. අධ්‍යයන කණ්ඩායම පර්යේෂණ නිලධාරියකු, සංඛ්‍යාන නිලධාරියකු සහ පර්යේෂණ සහකරුවන් දෙදෙනෙකුගෙන් සමන්විත විය.

**සොයාගත් කරුණු :**

i අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමෙන් පසු යාබද ගම්වල වගා කළ ඉඩම් ප්‍රමාණය වැඩි වී ඇති බව අධ්‍යයනයෙන් පැහැදිලි විය. විශේෂයෙන්ම තම්මැන්නාකුලමෙහි අදාළ කාලය තුළ හේන් ගොවිතැන ආරම්භ කර ඇත.

ii අවබෝධතා ගිවිසුමෙන් පසු තම්මැන්නාකුලමෙහි වෙළඳභෝග (මැකරල්, වම්බටු සහ ලොකු ළූනු) වගාව ආරම්භ වී ඇත. මෙම ගමෙහි පවුල් බොහොමයක් දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයට යොමු වූ වෙළඳභෝග වගා කර ඇත. පුල්එළිය ගමේ ගොවීහු ද අවබෝධතා ගිවිසුමට පෙර පටන්ම වෙළඳභෝග වගාව ආරම්භ කර ඇත. නමුත් අවබෝධතා ගිවිසුමට පෙර එම ගොවීහු දඹුල්ලට නිෂ්පාදන ප්‍රවාහනය කිරීමේ අපහසුතාවලට මුහුණ පා ඇත. අවබෝධතා ගිවිසුමෙන් පසු එම ගොවීන්ට ප්‍රමාදයකට, සීමා බාධකයට හෝ දුෂ්කරතාවයකට මුහුණ දීමෙන් තොරව තම නිෂ්පාදන ප්‍රවාහනය කිරීමට හැකි වී ඇත.

iii අවබෝධතා ගිවිසුමෙන් පසු මෙම ගම් අතුරෙන් සමහරකට විදුලිබලය සහ දුරකථන වැනි පහසුකම් ප්‍රයෝජන ගැනීමට හැකි වී ඇත. උදහරණයක් වශයෙන් 'සෙල්කෝ සෝලර් ප්‍රයිවෙට් ලිමිටඩ්' නමැති එක් පෞද්ගලික සමාගමක් සූර්ය තාප ආලෝක පද්ධතියක් සහ දුරකථන පද්ධතියක් මහකෝන්ගස්කඩ සහ පුල්එළියට ලබා දී ඇත.

iv අවබෝධතා ගිවිසුමෙන් පසු මහකෝන්ගස්කඩ සහ තම්මැන්නාකුලම ජනතාවට පහසුවෙන් වෛද්‍ය පහසුකම් ලබා ගැනීමට හැකි වී ඇත. අවබෝධතා ගිවිසුමට පෙර අධ්‍යයනයට පාත්‍ර වූ ගම් වැසියෝ වෛද්‍ය පහසුකම් සඳහා අනුරාධපුර හෝ මැදවච්චිය රෝහල්වලට ගියහ. වව්නියා සහ උලුක්කුලම රෝහල් තමන්ට වඩාත් සමීප වුව ද, ආරක්ෂක අවදනම නිසා ඒවාට නොගියහ. මෙම තත්ත්වය අවබෝධතා ගිවිසුමෙන් පසු වෙනස් වී ඇත.

**වෙනත් ක්‍රියාකාරකම්**

අංශයේ සාමාජිකයන් සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන්වලට සහභාගි වීම

1. 2004 ජුලි 23 දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී ආහාර අනාරක්ෂිතභාවය සහ අනතුරට නිරාවරණය වීම පිළිබඳ තොරතුරු සහ අනුරූප පද්ධතිය ගැන කෘෂිකර්ම හා ආහාර සංවිධානයේ අනුග්‍රහයෙන් පැවති වැඩමුළුවට අංශයේ සියලු නිලධාරීහු සහභාගී වූහ.

2. එම්.කේ.එන්. දමයන්ති මෙනවිය, NIRD - CIRDAP ඒකාබද්ධව 2004 සැප්තැම්බර් 09 සිට 18 දක්වා ඉන්දියාවේ හයිද්‍රාබාද්හි පිහිටි NIRD ආයතනයේදී පවත්වන ලද දිළිඳුකම අවම කිරීමේ විවිධ වැඩසටහන්වල නියුතු ග්‍රාම සංවර්ධන ක්‍රියාකාරීන්ගේ හැකියා වර්ධනය සඳහා වූ පුහුණු වැඩ සටහනට සහභාගී වූවාය.

3. එච්.එම්.එස්.ජේ.එම්. හිටිහාමු මෙනවිය පේරාදෙණිය සේවාස්ථ පුහුණු ආයතනයේ 2004 මාර්තු 12 පැවැත් වූ කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ගිවිසුම්ගත පර්යේෂණ වැඩසටහන පිළිබඳ පර්යේෂණ සම්මන්ත්‍රණයට සහභාගි වූවාය.

4. එච්.එම්.එස්.ජේ.එම්. හිටිහාමු මෙනවිය 'ලංකා ඕගැනික් ඇග්රිකල්චර් මැනේජ්මන්ට්' ආයතනය විසින් 2004 නොවැ. 30 දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී "කාබනික කෘෂිකර්මය ගැන හැඳින්වීමක්" යන ශීර්ෂය යටතේ පැවති වැඩ මුළුවකට සහභාගි වූවාය.

5. ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය සහ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය විසින් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී 2004 දෙසැ. 21-22 දිනවල 'සාගර විද්‍යාව, සමුද්‍ර විද්‍යාව සහ ශ්‍රී ලංකාවේ සාගර සේවාවලට නව ශක්තියක්' යන ශීර්ෂය යටතේ පැවති ප්‍රාරම්භක ජාතික වැඩ මුළුවකට සහභාගි විය.

6. ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා, එම් හේනෙගෙදර මහතා සහ ආර්.එල්.එන්. ජයතිස්ස මහතා 'ශ්‍රී ලංකාවේ කුඩා වැව් ආශ්‍රිත ජනාවාස' යන මාතෘකාව යටතේ 2004 දෙස 21-22 දිනවල බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති සම්මන්ත්‍රණයකට සහභාගි වූහ.

**සඟරා සහ ප්‍රවෘත්ති පත්‍රවලට ලිපි සම්පාදනය සඳහා අංශයේ නිලධාරීන්ගෙන් ලැබුණ දයකත්වය**

1. එම්.කේ.එන්. දමයන්ති මෙනවිය 'ගොවිජන සමාජයක ස්ත්‍රී පුරුෂභාවය සහ කාන්තාව' යන ශීර්ෂය යටතේ 'ගොවි කටයුතු අධ්‍යයන' යන (සිංහල) සඟරාවෙහි වෙළුම අංක 5 අංක 01,2004 කලාපයට ලිපියක් සම්පාදනය කළාය.

## අධ්‍යාපන කවයේ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම

මෙම ප්‍රකාශනයෙහි පිටු අංක 10 හි දැක්වෙන සම්මන්ත්‍රණ සහ වැඩමුළු හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යයන කවයේ සම්මන්ත්‍රණ මාලාවෙහි සම්බන්ධීකාරක හැටියට ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා විසින් සංවිධානය කරන ලදී.

# කෘෂිකර්ම සහ පාරිසරික සම්පත් කළමනාකරණ අංශය

**කාර්ය මණ්ඩලය**

| | |
|---|---|
| ශාමිනී කුසුම් කුමාර මහත්මිය | - අංශයේ වැඩබලන ප්‍රධානියා (2004.01.01 - 2004.03.02) |
| ටී.ඒ. ධර්මරත්න මහතා | - අංශයේ වැඩබලන ප්‍රධානියා (2004.03.03 - 2004.06.02) |
| ආචාර්ය එම්.එස්. සේනානායක මහතා | - අංශයේ වැඩබලන ප්‍රධානියා (2004.12.21 සිට අද දක්වා) |
| ආර්.එම්.ජී.කේ.බී. රත්නායක මහතා | - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී |
| පී.ආර්. වීරක්කොඩි මහත්මිය | - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (අධ්‍යයන නිවාඩු ලබා ඇත) |
| එස්.එම්.ඒ. සමරකෝන් මහතා | - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (අධ්‍යයන නිවාඩු ලබා ඇත) |
| ආචාර්ය ඩබ්.ජී. සෝමරත්න මහතා | - අධි පර්යේෂක (විශේෂ නිවාඩු ලබා ඇත) |
| ඩී.ඩබ්.එස්.ඩී.කේ. සෙනෙවිරත්න මෙනෙවිය | - පර්යේෂණ නිලධාරී |
| ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා | - පර්යේෂණ නිලධාරී |
| එස්. ඇපාසිංහ මහතා | - සංඛ්‍යාන නිලධාරී |

**දැනට සිදුකරන අධ්‍යයන**

1. මහවැලි එච් ප්‍රදේශයෙහි දෙවන සහ තුන්වන පරම්පරා සඳහා පවතින රැකියා අවස්ථා පිළිබඳ වත්මන් තත්ත්වය සඳහා අනාගත බලාපොරොත්තු

**පර්යේෂණ කණ්ඩායම**

| | | |
|---|---|---|
| ඩී.ඩබ්.එස්.ඩී.කේ. සෙනෙවිරත්න මෙනෙවිය | - | සම්බන්ධීකාරක |
| ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා | - | සහාය පර්යේෂක |
| ආචාර්ය ජී.එම්. හේනෙගෙදර මහතා | - | අධීක්‍ෂක |

**හැඳින්වීම**

සමානාත්මතාවය පදනම්කරගත් ගොවි සමාජයක් බිහි කිරීම මහවැලි වැඩ සටහනෙහි ප්‍රධාන අරමුණක් විය. එසේ වුවද ගොවි පවුල් අතර වර්ධනය වන සමාජ පරතරයක් පවතින බව අභවන නැඹුරුතා අධ්‍යයනයන් රැසකින්ම අනාවරණය වී ඇත. මෙයින් ඇඟවෙන්නේ, වෙනත් කරුණු අතර, පදිංචිකරුවන්ගේ පවුල්වල දෙවන සහ තෙවන පරම්පරාවලට අයත් පිරිසගෙන් සමන්විත වැඩිවන ශ්‍රම බලකායට රැකියා ලබා ගැනීමේ අවස්ථා මන්දගාමීව වර්ධනය වන බවයි. වාර්ෂික වර්ධන අනුපාතය 1.4% ක් වන කල්හි, ඉදිරි හය වසර තුළ රැකියා සහ ආදයම් අපේක්‍ෂා කරන 51,900 ක ජනගහනයක් බිහි වනු ඇත. වැඩිවන දෙවන පරම්පරාවට අලුත් ඉඩම්, රැකියා සහ ආදයම් ඇති කිරීම ඉක්මනින් අවධානය යොමුවිය යුතු තීරණාත්මක අවස්ථාවක් බිහි කර ඇත.

විශේෂයෙන් 1990 දශකයේ දී රැකියා ක්ෂේත්‍රය ගැන නොයෙක් අධ්‍යයන හා සමීක්‍ෂණ පවත්වා ඇත. එසේ වුවත්, එක ප්‍රදේශයකට එක් නිෂ්පාදනයක් වෙන් කිරීමෙන් විශේෂිත නිෂ්පාදන හැකියාවක් ඇති කිරීම හා මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය ගංගා නිම්න සංවර්ධන අධිකාරියක් ලෙස පරිණාමනය කිරීම වැනි නවතම සංවර්ධන ආරම්භයන්ගෙන් රැකියා බිහි කිරීම සහ අදයම් මාර්ග ඇති කිරීම සඳහා ලද ප්‍රතිලාභ, ස්ථිර විශ්වසනීය දත්ත නැතිකම නිසා, හුදෙක් කාල්පනික නිගමන හැටියට සැලකිය යුතු තත්ත්වයක් පවතී. මහවැලි එච් කලාපයෙහි සිදු වූ ඉහත සඳහන් සංවර්ධන කටයුතු පදිංචි කරුවන්ගෙන් රැකියා ගැටළුව කෙරෙහි බලපෑ ආකාරය, විශේෂයෙන්ම දෙවන පරම්පරාවට අයත් පදිංචිකරුවන් කෙරෙහි බලපෑ ආකාරය ගැන හැදෑරීම මෙම අධ්‍යයනයෙහි අරමුණ විය.

මහවැලි එච්. කලාපයේ දෙවන හා තෙවන පරම්පරාවල පදිංචිකරුවන් සඳහා පවතින රැකියා අවස්ථා සහ ආදයම් මාර්ග පිළිබඳ වත්මන් තත්ත්වය සහ අනාගත නැඹුරුතා පරීක්ෂණයට භාජනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණයි.

- තෝරාගත්, දනට පවතින රැකියා උත්පාදනය සහ ආදයම් උපදවන අවස්ථා සලසන ව්‍යාපෘති දෙවන සහ තෙවන පරම්පරාවල පදිංචිකරුවන් කෙරෙහි බලපාන ආකාරය හඳුනා ගැනීම.

- දෙවන පරම්පරාවේ පදිංචිකරුවන් සඳහා ගොවිපළ තුළ සහ ඉන් පිට අංශවල පවතින රැකියා අවස්ථා සහ ඒවා ලබා ගැනීමට ඇති හැකියාව සහ එම හැකියාවන්ට එල්ල වන බාධක හඳුනා ගැනීම.

- දෙවන පරම්පරාවේ පදිංචිකරුවන් කෙරෙහි පවත්නා කුසලතා, ලබා ගන්නා පුහුණුව සහ රැකියා ලබා ගැනීමට ඇති සූදනම හඳුනා ගැනීම. තවද එම පදිංචි කරුවන් කෙරෙහි පවතින පෞද්ගලික රැකියා අපේක්ෂා සහ රැකියා සොයා යාමේ හැසිරීම් රටාව හඳුනා ගැනීම.

ගොවිපළ තුළ, ගොවිපළින් පිටත සහ ගොවිතැනින් පරිබාහිරව රැකියා සහ අදයම් උත්පාදනය සම්බන්ධයෙන් දනට පවත්නා තත්ත්වය පදනම් කොට අධ්‍යයන ස්ථාන තුනක්, එනම් ගල්නෑව, තලාව සහ තඹුත්තේගම, කොට්ඨාශ තෝරා ගන්නා ලදී. එක් එක් අධ්‍යයන ස්ථානවලින් එක ප්‍රදේශයකට එක හෝගයක් යන ක්‍රියාවලියෙහි නියුතු ගොවි සංවිධාන දෙක බැගින් තෝරා ගන්නා ලදී. ප්‍රශ්නාවලිය පදනම් කරගත් ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා පළමුවන සහ දෙවන පරම්පරා නියෝජනය කරන ගොවීන් 30 දෙනෙක් අහඹු ලෙස තෝරා ගන්නා ලදී.

සෑම තෝරාගත් ගමකම පළමුවන හා දෙවන පරම්පරා නියෝජනය කරන සාමාජිකයන් සමඟ යොමුගත කණ්ඩායම් සාකච්ඡා දෙක බැගින් පවත්වන ලදී. ගමෙහි මුඛ්‍ය තොරතුරු සපයන්නන් සමඟ ද ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් සමඟ ද, පැවැත් වූ අනියම් සාකච්ඡා වැදගත් දත්ත රැස් කිරීමට ප්‍රයෝජනවත් විය.

## අධ්‍යයනයෙන් සොයාගත් කරුණු

දෙවන හා තුන්වන පරම්පරාවලට අයත් පිරිසගෙන් වැඩි දෙනෙක් (82%) ප්‍රාථමික මට්ටමට වැඩි අධ්‍යාපනයක් ලැබූ අය වෙති. අධ්‍යයනයට පාත්‍ර වූ ප්‍රදේශවල උසස් අධ්‍යාපනය ලද අය සාපේක්ෂ වශයෙන් වැඩි ය. ඒ අතුරෙන් 11% ක්පමණ අ.පො.ස. (උසස් පෙළ) සමත් ය. කෙසේ වුවද විශ්ව විද්‍යාලවල ඉගනුම ලබන හෝ ඉගනුම ලබාගත් සංඛ්‍යාව සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමක පවතී. තෝරාගත් කොට්ඨාස 3න්ම මේ ගණයට අයත්වන්නේ 5 දෙනෙක් පමණි.

දෙවන / තෙවන පරම්පරාවලට අයත් ජනගහනයෙන් 70% ක්ම කම්කරුවන් ලෙස සේවය කරන අතර 80%ක්ම ආර්ථික වශයෙන් ක්‍රියාකාරී වෙති. ආර්ථික වශයෙන් ක්‍රියාකාරී පිරිස අතරින් වැඩි දෙනා පිරිමි (72%) වන අතර කාන්තාවන් 28% ක් එම කාණ්ඩයට ඇතුළත් විය. කම්කරු බලකාය, රැකියාවල නියුතු 53% කින් ද, රැකියා රහිත 4% කින්ද, ශිෂ්‍යයන් හා වෘත්තීය පුහුණුව ලබන්නන් 23%කින් ද ගෘහනියන්ගෙන් සැදුම්ලද වැටුප් නොලබන පවුලේ මෙහෙවරෙහි නියුතු අය 14% කින්ද, වයසින් අඩු හෝ ආබාධිත අය 6% කින් ද සමන්විත විය.

දෙවන/තෙවන පරම්පරාවල පදිංචි කරුවන්ගේ වයස් ව්‍යාප්තියෙහි ඉතා සුවිශේෂ ලක්ෂණය නම් 60% ට වැඩි කොටසක් අවු 19 සිට 36 දක්වා කාණ්ඩයට අයිති වීමය. මෙයින් පැහැදිලි වන්නේ දනට දෙවන/තෙවන පරම්පරාවලට අයත් පිරිස රැකියා සොයන වයස් කාණ්ඩයට සහ ශ්‍රම බලකායට අයත් වන බවය. තවද වයස් කාණ්ඩ 6-19 ට අයත් විශාල ළමයින් සංඛ්‍යාව (22%) හේතු කොට ගෙන ඇතිවන ක්ෂණික ප්‍රතිඵලය නම් ඉදිරි වසර කිහිපය තුළ රැකියා සොයන කාණ්ඩය විශාල වීමය.

රැකියාවෙහි නියුතු දෙවන / තෙවන පරම්පරාවල ජනගහනයෙන් 30% ක් පමණක් තම මූලික රැකියාව හැටියට කෘෂිකර්මයෙහි නියුතුව ඇත. දෙවන/තෙවන පරම්පරාවලට අයත් වූවන් අතුරෙන් කාන්තාවන් 10% ක් පමණක් තම මූලික ආදායම් මාර්ගය හැටියට කෘෂිකර්මයෙහි නියුතුව ඇතත් මෙම අංශයෙහි නියුතු පිරිමි සංඛ්‍යාව 43% කි. කෙසේ වුවද පිරිමින් ගෙන් අඩක් පමණ මූලික රැකියාව ලෙස කෘෂිකර්මය නොවන අංශවල නියුතුව ඇත. ඒ අතුරෙන් 18%ක් රාජ්‍ය සේවයෙහි නියුතුව ඇත. කෘෂිකර්ම නොවන අංශයෙහි ප්‍රධාන කොටස රාජ්‍ය සේවය වේ. අධ්‍යයන ප්‍රදේශයේ දෙවන/තුන්වන පරම්පරාවල පිරිමින්ට රැකියා ලබා දෙන ප්‍රමුඛ රාජ්‍ය සේවා අංශය වූයේ ආරක්ෂක බලකායයි.

අනෙක් අතට කාන්තාවන් සඳහා මූලික ආදායම් මාර්ගය හැටියට කෘෂිකර්මය නොවන ක්‍රියාකාරකම් අංශයෙන් ලැබුණු දායකත්වය 32% කි. කෘෂිකාර්මික නොවන අංශයෙහි ප්‍රමුඛ වූයේ 10% ක දායකත්වයක් ලබා දුන් ඇඟලුම් ක්ෂේත්‍රයයි. වෙනත් ආදායම් උපයන මූලාශ්‍ර අතුරෙන් පෞද්ගලික අංශය 8%ක දායකත්වයක් ද විදේශ රැකියා අංශය 6% ක දායකත්වයක් ද ලබා දුන්නේය. ශ්‍රම බලකායෙන් කාන්තාවන් 44% ක්ම ගෘහනියන් හැටියට වාර්තා කිරීම සුවිශේෂ වේ. ඊට අමතරව වැටුපක් නොලැබෙන පවුලේ ශ්‍රම දායකත්වය හැටියට ගොවිතැනෙහි නිරත වීම හැරුණු විට විකල්ප ආදායම් මාර්ග ඔවුන්ට නැත.

දෙවන/තුන්වන පරම්පරාවලට අයත් වූවන්ගෙන් 38%ක් කෘෂිකාර්මික රැකියාවල නිරත වීමට කැමති වන අතර 62%ක් කෘෂිකාර්මික නොවන රැකියාවලට කැමති වෙති. මෙයට හේතුව නම් කෘෂිකර්මයෙන් ප්‍රමාණවත් ආදායමක් නොලැබීම සහ වගා කිරීමට තමන්ගේම ඉඩම් නොමැති වීමයි. අධ්‍යාපනය හා වයස අනුව තරුණයන්ගේ රැකියා අපේක්ෂා වෙනස් වේ. ඔවුහු කෘෂිකාර්මික නොවන නිත්‍ය මාසික ආදායමක් ලැබෙන රැකියා ලැබීමට කැමති වෙති. ඔවුන් කැමති එවන් රැකියා වැඩි වශයෙන්ම ස්වයං රැකියා කුසලතා අවශ්‍ය තාක්ෂණ අංශයෙහි රැකියා සහ රාජ්‍ය අංශයෙහි රැකියා වේ.

දෙවන/තුන්වන පරම්පරාවට අයත් පදිංචිකරුවන් අතුරෙන් 40 දෙනෙක් (7%) මූලික රැකියාව ලෙස හෝ අතිරේක ආදායම් මාර්ගයක් ලෙස ස්වයං රැකියාවල නිරත වෙති. පිරිමින් අතුරෙන් 5% ක් ද ගැහැණුන් අතුරෙන් 2% ක් ද මූලික රැකියාව ලෙස ස්වයං රැකියාවල යෙදෙති. පළමුවන පරම්පරාව හා සසඳන විට දෙවන/තුන්වන පරම්පරාවල ස්වයං රැකියා වැඩි විවිධත්වයක් දරයි. කෙසේ වුවද කෘෂි පිරිසැකසුම් කර්මාන්තයෙහි ධාන්‍ය (ඇඹරීම) යෙදෙන අය කොට්ඨාස තුනෙහිම ඇත්තේ දෙදෙනෙක් පමණක් වීම වැදගත් කරුණක් සේ සැලකිය යුතුය.

ඉතා එලදායී වූත්, රැකියා ජනනය කරන්නා වූත්, ක්‍රියාකාරකමක් වන සත්ව පාලනය අධ්‍යයන ප්‍රදේශයෙහි හොඳින් ස්ථාපිත වී නැත. ගෘහස්ත 30 ක (17%ක් පමණ) කුඩා පරිමාණයෙන්, වැඩි වශයෙන් ගෘහාශ්‍රිත කෘෂිකර්ම කටයුතු සඳහා, මී හරකුන් හෝ එළ හරකුන් තබා ගනිති. ගෘහස්ත 19ක (10%) කුකුලන් ඇති කිරීම අරඹා ඇත. පශු සම්පත් අංශයෙහි නියතු ගොවීන්ගේ ප්‍රධාන ප්‍රශ්නය තණ බිම් හිඟවීම වැනි හේතු නිසා ඇති වන සත්ව ආහාර හිඟය යි. තව ද ඔවුහු ඉඩ මදකම, තම නිෂ්පාදනවලට වෙළඳපොළක් සොයා ගැනීම උගහට වීම, සත්ව ආහාරවල මිල අධික වීම සහ සුලබව ඇතිවන සත්ව රෝග වැනි ප්‍රශ්නවලට ද මුහුණ දෙති. දෙවන/තෙවන පරම්පරාවල පදිංචි කරුවන් අතුරෙන් සත්ව පාලනයට ලැබෙන දායකත්වය 38% ක් වීම, මෙම විෂයට ඔවුන් දක්වන අඩු උනන්දුව පැහැදිලි කරයි.

සමීක්ෂණයට අනුව දෙවන/තෙවන පරම්පරාවලට අයත් වූවන් අතුරෙන් ඉඩම් හිමි සංඛ්‍යාව ඉතා අල්පය. ඔවුන් අතුරෙන් 4% කට ගොඩ ඉඩම් හිමිවන අතර මඩ ඉඩම් හිමි වන්නේ 3%කට පමණි. සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය සලකා බලන කල දෙවන/තෙවන පරම්පරාවලට හිමි ඉඩම් ප්‍රමාණය ද අල්පය. කොට්ඨාශ තුනම එක්ව සැලකුව හොත් ඔවුනට හිමි ගොඩ ඉඩම් ප්‍රමාණය අක්කර 20.5 ක් වන අතර ඔවුන් සතු මඩ ඉඩම් ප්‍රමාණය අක්කර 70.25 කි. ආරම්භයේ දී දුන් ඉඩම් කට්ටි කැබලි කිරීමට නීතියෙන් ඉඩ නැති බැවින්, ගොඩ ඉඩම් සහ මඩ ඉඩම් දෙවන/තෙවන පරම්පරා සමඟ නීතිමය පදනමක් නොමැතිව බෙදු ගනු ලැබේ. මෙම නැඹුරුව නිසා මඩ ඉඩම්,

කොටස්වලට කැඩී යාමෙන් ඵලදායිතාවය හීන වී ඇත. ගොඩ ඉඩම් බෙද ඇත්තේ එක් අයෙකුට අක්කර 1/2 බැගිනි. එම අක්කර භාගය තුළ ගෙවල් කීපයක්ම ඉදි කොට දෙවන/තුන්වන පරම්පරාවල පිරිස ඒවා හිමි කර ගෙන ඇත.

'එක ප්‍රදේශයකට එක භෝගයක්' යන වැඩසටහන 2003 යල කන්නයේදී ආරම්භ කිරීමට පෙර ද පෞද්ගලික සමාගම් යම් ස්වභාවයකට ඉදිරියේදී නිෂ්පාදන මිලට ගැනීමට එකඟවන ගිවිසුම් ආරම්භ කර ඇත. එසේ වුවද මෙම වැඩසටහනට ඇතුළත් ගොවීන්ගෙන් 40% ක් ඉදිරි ගිවිසුම් ක්‍රමය ලෙන හඳුන්වන මෙම ගොවිතැන් ක්‍රමයට සම්බන්ධ වී ඇත්තේ වැඩ සටහන හඳුන්වා දුන් 2003 වර්ෂයේ යල කන්නයේදීය. වැඩ සටහන ආරම්භ වී කන්න තුනක් ගත වී ඇතත් එක ප්‍රදේශයකට එක භෝගයක් යන වැඩ සටහන ගැන දන්නේ ගොවීන්ගෙන් 60%ක් පමණි. වැඩ සටහනට සම්බන්ධ වී ඇත්තේ ගොවීන්ගෙන් 33%ක් පමණි. සහභාගි වූ ගොවීන් පවසන පරිදි, සාපේක්ෂ වශයෙන් ලාභ සහිත වීම (52%), යෙදවුම් පහසුවෙන් ලබාගත හැකි වීම (22%), තාක්ෂනික දැනුම ලබා ගැනීමට හැකිවීම (13%) සහ අලෙවිය පහසු වීම (10%) වැඩ සටහනෙහි ප්‍රධාන ප්‍රතිලාභ වේ. ඉදිරි ගිවිසුම් ක්‍රමය යටතේ භෝග නිෂ්පාදනය සෝයා බෝංචි සහ ඉරිඟු වැනි ඉතා සුළු භෝග සංඛ්‍යාවකට සීමා වේ. සෝයා බෝංචි සහ ඉරිඟු ඇතුළත් වගා වැඩ සටහනට සම්බන්ධ වී ඇත්තේ එක් බාහිර සමාගමක් පමණි. වැඩ සටහන ගැන නොදන සිටීම (71%), සුදුසු පස සහිත ඉඩම් නොමැති වීම සහ වාරි ජලය ස්ථිර ලෙස ලබා ගත නොහැකි වීම (14%) ගොවීන් වැඩි දෙනෙක් වැඩ සටහනට සහභාගි නොවීමට හේතුවයි.

අවම වශයෙන් දෙවන පරම්පරාවේ එක පදිංචිකරුවකුවත් ගොවි සංවිධානයක සාමාජිකත්වය ලබා ඇති ගෘහස්ථ සංඛ්‍යාව 10%ක් පමණ වේ. ඉඩම් අයිතිය නොමැති වීම (70%) ගොවි සංවිධානවලට සම්බන්ධ නොවීමට ප්‍රධාන හේතුවයි. ගොවි සංවිධානයක පූර්ණ සාමාජිකත්වය ලබා ගත හැක්කේ ඉඩම් අයිතිය ඇති ගොවීන්ට පමණි. දෙවන / තුන්වන පරම්පරාවේ පදිංචිකරුවන් බොහෝ දෙනෙකුට ඉඩම් හිමිකම නොමැති බැවින් ඔවුන් ගොවි සංස්ථාවල සාමාජිකත්වය අහිමි වේ.

ඉඩම් හිමි නොවන බැවින් පූර්ණ සාමාජිකත්වය නොලබන සාමාජිකයින්ට ගොවි සංවිධානයේ නිල දැරිය නොහැකිය. මෙම තත්ත්වය දෙවන/තෙවන පරම්පරාවල පදිංචිකරුවන් අදාළ ගොවි සංවිධානවල තීරණ ගැනීම සහ සැලසුම් කිරීමේ ක්‍රියාවලින් ඈත් කළේය. කන්නයක් තුළ වගා කාලසටහන ද වාරි ජලය බෙදහරින පිළිවෙල ගැන ද ඉහළම මට්ටමේ තීරණ ගන්න ගොවි සම්මේලනය සහ ව්‍යාපෘති කමිටුව සමඟ දෙවන/තෙවන පරම්පරාවේ ගොවීන් සම්බන්ධ වන්නේ මද වශයෙනි. එසේ වුවද ගොවි සංවිධානවල සාමාජිකත්වය ලැබූ දෙවන/තෙවන පරම්පරාවල ගොවීන් අතුරෙන් 47%ක් එම සංවිධානවල තනතුරු හොබවති. එයින් පැහැදිලි වන්නේ දෙවන/තෙවන පරම්පරාවල ගොවියන් ගොවි සංවිධානවල වගකීම් දැරීමට කැමතිවන බවය.

අධ්‍යයන ප්‍රදේශයේ ගෘහස්ථ අතුරෙන් 20% ක (සංඛ්‍යාව 36කි), එක ගෘහස්ථයකින් එක් අයෙක් හෝ ඉකුත් පස් වසර තුළ ස්ථාවර ලෙස මහවැලි ප්‍රදේශයෙන් පිටතට සංක්‍රමණය වී ඇත. පදිංචිකරුවන් සහ පිටස්තර අය අතර විවාහ ගිවිස ගැනීම, (88%) පිටතට ස්ථාවර ලෙස සංක්‍රමණය වීමට ප්‍රධාන හේතුව වී ඇත. පදිංචිකරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් පළමු පරම්පරාවේ අය පැමිණි උපන් ගම, විශේෂයෙන් නුවර සහ මාතලේ වෙත යාම (14%) ස්ථිර ලෙස සංක්‍රමණය වීමට හේතු වූ දෙවන වැදගත් කාරණයයි. විශේෂයෙන් හොඳ අධ්‍යාපනයක් දීම සඳහා පදිංචිකරුවෝ තම දරුවන් තම උපන් ගම වෙත යවති.

පදිංචි සම්පූර්ණ ජනගහනයෙන් 15%ක් ආදායම් ලබා ගැනීමේ මාර්ග සොයා තාවකාලික වශයෙන් මහවැලි ප්‍රදේශයෙන් බැහැර ගොස් ඇත. තාවකාලික සංක්‍රමණිකයන් වැඩි දෙනෙකු (38%) ස්ථිර රැකියාවල නියුතු වූහ. ඒ අතර පුහුණු කම්කරු පිරිස 45%කි. තාවකාලික වශයෙන් සංක්‍රමණය වූ නුපුහුණු කම්කරු ප්‍රතිශතය 18%කි. පුහුණු කම්කරුවන් අතර ඇඟළුම් කර්මාන්තයෙහි නියුතු කොටස (48%) ඉතා වැදගත්ය. ඉතිරි තාවකාලික සංක්‍රමණික පුහුණු කම්කරු පිරිසට (52%) වඩු

වැඩ, මේසන් වැඩ, පැස්සුම් වැඩ, මෝටර් යාන්ත්‍රික (මිකැනික්) වැඩ ආදිය කරන අය ඇතුළත්ය. නුපුහුණු කම්කරු පිරිසෙන් 57%ක් විශේෂයෙන් ගෘහ සේවිකාවන් ලෙස විදේශගතව සේවය කරන පිරිස වේ. තාවකාලික වශයෙන් සංක්‍රමණය වූවන්ගෙන් 90%ක් පූර්ණ කාලීන ලෙස ආදායම් උපයන මාර්ගවල නිරත වෙති. ඉතිරි 10% අර්ධ කාලීන රැකියා කරති. තාවකාලික ලෙස සංක්‍රමණය වන සේවකයන්ගේ රැකියා අරමුණු මොනවාද? යන්න මෙම සංඛ්‍යා වලින් පැහැදිලිය.

## ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වැදගත්වන කරුණු සහ නිර්දේශ.

ලාභය අඩුවීම සහ ප්‍රමාණවත් තරම් වගාකළ හැකි ඉඩම් කැබලි නොතිබීම දෙවන/තෙවන පරම්පරාවල අය කෘෂිකර්මයෙහි නොරැඳීමට ප්‍රධාන හේතු වේ. වාණිජමය ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය, අපනයනයට නිපයන අධි තාක්ෂණය යොදවන ආරක්ෂිත කෘෂිකර්ම ක්‍රම අනුගමනය කරන ලාභදායී ගොවිතැන ප්‍රවර්ධනය කරන වැඩසටහන් තිබිය යුතු ය. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමට මූල ධනය හා විධිමත් ආධාර අතුළත් යෙදවුම් සම්පාදන පද්ධතියක් ද, කාර්යක්ෂම ලෙස දනුම බෙදහැරීම ද, උපදේශක (කෘෂිකර්ම ව්‍යාප්ති) සේවය ද, හොඳින් ක්‍රියාත්මක අලෙවි දමයක් ද තිබිය යුතුය. අලෙවි මිල බෙහෙවින් උච්චාවචනය වන ඉහළ නිෂ්පාදන වියදම් දරිය යුතු භෝග වෙනුවට ඉහළ අලෙවි අගයක් සහ ලාභයක් ඇති වාණිජ භෝග වැවීමට ගොවීන් අභිප්‍රේරණය කොට, සහනාධාර ලබාදී, දිරි ගැන්වීමේ පියවර ගැනීම වගකිව යුතු අධිකාරීන්ගේ කාර්ය භාරයයි.

විශේෂයෙන්ම කාන්තාවන් සඳහා ස්වයං රැකියා ද කෘෂිකර්මය පදනම් කරගත් ගෘහ කර්මාන්ත ද හඳුන්වාදීමෙන් ඔවුන් ආර්ථික වශයෙන් ක්‍රියාකාරී පදිංචිකරුවන් කිරීම, වැටුපක් නැති පවුලේ ශ්‍රමිකයන් ලෙස තබා ගැනීමට වඩා වැදගත් ය. ඇඳුම් මැසීම, යෝගට් නිපැයුම සහ කිරි පදනම් කරගත් අගය එකතුකළ නිෂ්පාදන ගැන කාන්තාවන්ට පුහුණුවක් ලබා දීම ස්වයං රැකියා ආරම්භයට ප්‍රයෝජනවත් විය හැක.

නැවත ආපසු මිලට ගැනීමේ ක්‍රමය මත කුකුලන් ඇති කිරීම, කුකුලන් ඇති කරන ගොවියන්ට ප්‍රයෝජනවත් වනු ඇත. එමගින් ඔවුන්ගේ ආදායම වැඩි කොට මෙම ක්ෂේත්‍රයෙහි රැඳී සිටීමට අනුබල දිය හැක. නීරාවිය ගොවිපළ සමඟ සම්බන්ධ වී මහවැලි ආර්ථික නියෝජ්‍ය ආයතනයේ පශු සම්පත් අංශයට අදළ කටයුතු වර්ධනය කිරීම, කිරිහරක් කර්මාන්තය දියුණු කිරීමට ප්‍රයෝජනවත් වනු ඇත. ගොවීන්ගේ කිරි මිලට ගැනීමට යෝග්‍ය අලෙවි යාන්ත්‍රණයත් සමඟ ව්‍යාප්ති සේවා ඇතුළු කෘත්‍රිම සිංචනය, පට්ටි ගොනුන් සහ දෙනුන් ලබා දීම වැනි ප්‍රජනන පහසුකම් ලබා දීම ආරම්භ කළ හැකිය. ගෙවතුවල වගා කළ හැකි වැඩි ඵලදයී, නියඟට ඔරොත්තු දෙන, පෝෂ්‍යදයී, පිදුරු වශයෙන් ගත හැකි එසේත් නැත්නම් තණ වර්ග හැටියට යොදගත හැකි වගාවක් හඳුන්වා දීම, කිරිපට්ටි කර්මාන්තය දියුණු කිරීමට අත්‍යවශ්‍ය වේ.

නීතිමය වශයෙන් ඉඩම් අයිතිය නොලද ගොවියන්ට ගොවි සංවිධානවල පූර්ණ සාමාජිකත්වය හිමි නැත. විශේෂයෙන් දෙවන/තුන්වන පරම්පරාවල ගොවියනට ඉඩම් අයිතිය නැති බැවින් ඔවුහු ගොවි සංවිධානවලින් ඈත් වෙති. එබැවින් ඉඩම් අහිමි දෙවන/තුන්වන පරම්පරාවල ගොවීන්ට ගොවි සංවිධානවල ක්‍රියාකාරී සාමාජිකයන් හා නිලධාරීන් වීමට ඉඩ සලසන නීතිමය වෙනස්කම් ඇති කළ යුතුය.

ගොවිපළින් බාහිර අංශවල පුහුණු කම්කරුවන්ට නිරත වීමට රැකියා අවස්ථා ජනනය කිරීම සහ ආදයම් මාර්ග ඇති කිරීම, පිට ප්‍රදේශවලට සංක්‍රමණය වීම වැළැක්වීමට අත්‍යාවශ්‍ය වේ. විශේෂයෙන් පුහුණු කම්කරුවන්ට අදළ ක්ෂේත්‍රවල රැකියාවෙහි නිරත වීමට කර්මාන්ත අංශය පුළුල් කිරීම ඉක්මනින් සිදුවිය යුතුය. සංක්‍රමණය වූ පුහුණු කම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් මහවැලි ප්‍රදේශයෙන් පිට ඇඟළුම් කර්මාන්තයෙහි නිරත බැවින් පුහුණු කාන්තා ශ්‍රමිකයන්ට රැකියා අවස්ථා ලබා දීමට ඇඟළුම් කම්හල් පිහිටුවීම ප්‍රයෝජනවත් විය හැක.

'එක ප්‍රදේශයකට එක භෝගයක්' නම් වූ විශේෂිත වැඩ සටහන තුළ මහවැලි අධිකාරියේ මෙහෙවර ශක්තිමත් කළ යුතුය. ගොවි සංවිධාන හෝ පෞද්ගලික වශයෙන් ගොවි මහතුන් එක් පාර්ශවයක් හැටියට ද සුදුසු බාහිර සමාගම් අනෙක් පාර්ශවය හැටියට ද, ඉදිරි මිලට ගැනීම් සහතික කරන එකඟතාවලට එළඹීමේ ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ක්‍රියා කළ යුතුය. යෝග්‍ය බාහිර සමාගම් හඳුන්වා දීම ද මහවැලි සංවර්ධන අධිකාරියට සිදු කළ හැක. යෝග්‍ය පසක් ද විශ්වාසය රැඳවිය හැකි ජල සම්පාදනයක් ද පවතින ප්‍රදේශවල භෝග පදනම් කර ගෙන මෙම ගිවිසුම්වලට එළඹිය යුතුය. සියලුම ඉදිරි ගිවිසුම් අත්සන් කර ඇත්තේ පෞද්ගලික ගොවියන් සහ බාහිර සමාගම් අතරය. එබැවින් ගොවි සංවිධානවල මැදිහත් වීම නොසලකා හැරිය යුතු තරම්ය. එබැවින් තෝරාගත් භෝග ගිවිසුම් ඇතිකර ගැනීමේ ක්‍රියාවලියට ගොවි සංවිධාන ක්‍රියාකාරී සහභාගිකරුවන් හැටියට අවශෝෂණය කර ප්‍රවර්ධනය කළ යුතුය. වැඩ සටහන තුළ ගොවීන් රඳවා ගැනීම සඳහා නව වගා ක්‍රම ගැන ප්‍රායෝගික දැනුම ලබා දෙන යෝග්‍ය දැනුවත් කිරීමේ වැඩ සටහන් මගින් ගොවීන් ආකර්ශනය කොට උත්ප්‍රේරණය කළ යුතුය.

## 2. කිරිගව කර්මාන්තයේ සේවා සැපයීම් අංශය තුළ පුද්ගලික අංශයේ මැදිහත් වීම : සීමාකාරිකම් සහ විභවයන් හඳුනාගැනීම

**පර්යේෂණ කණ්ඩායම**

| | |
|---|---|
| ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා | - සම්බන්ධීකාරක |
| ශාමිනී කුසුම් කුමාර මහත්මිය | - අධීක්ෂක |
| ඩී.ඩබ්.එස්.ඩී.කේ. සෙනෙවිරත්න මෙනවිය | - සහාය පර්යේෂක |
| එන්.පී.ජී. සමන්ත මහතා | - සහාය පර්යේෂක |

**හඳුන්වාදීම**

ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනයෙහිලා කුඩා පරිමාන කිරිපට්ටි ගොවියා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. ලංකාවේ කිරිගව ගහණයෙන් 95%ක් පමණ ප්‍රතිශතයක් පාලනය කරනුයේ ඉඩම් රහිත වතුකම්කරුවන් සහ අක්කර 4ට අඩු ඉඩම්ලාභී කුඩා පරිමාණ ගොවීන් විසිනි. (ශක්තිවේල්, 1986) ශ්‍රී ලංකාවෙහි ඉතා පුළුල් පරාසයකට අයත් කෘෂි - පාරිසරික සහ සමාජ - ආර්ථික තත්ත්වයන් පවතින බැවින් කුඩා පරිමාණ කිරිපට්ටි අංශයෙහි කිරි නිෂ්පාදන පද්ධති රාශියක් තෝරා ගතු ලැබිය.

කිරි පට්ටි අංශය දියුණු කිරීමේදී මුහුණ පෑමට සිදුවන ප්‍රධාන බාධකයක් හැටියට, පශු නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් සේවාවන් නොතිබීම, රාජ්‍ය ප්‍රතිපත්ති රාමුවෙහි විශේෂිත කොට දක්වා ඇත.

ඉහත සඳහන් බාධක ජය ගැනීමට 'යලි පුබුදමු ශ්‍රී ලංකා' නම් ප්‍රකාශනයෙහි මෙසේ යෝජනා කර ඇත.

> " වාණිජ නැඹුරුවක් ඇති කාර්යක්ෂම පශු සම්පත් සේවාවන් ඇති කිරීමට පෞද්ගලික අංශයට අනුබල දීම. මෙම අංශයෙහි වැඩිවන ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය පරිදි රජයේ පශු සම්පත් සේවා පුළුල් නොවේ. සත්ත්ව සෞඛ්‍යය, එන්නත් කිරීම, රසායනාගාර සේවා සහ තත්ත්ව පරීක්ෂණ වැනි සමහර සේවා ආරම්භයේදී පෞද්ගලික අංශයට පැවරිය හැක"

කිරිපට්ටි ගොවියන් වෙත තාක්ෂණය සහ යෙදවුම් රැගෙන ඒමේ පූර්ණ වගකීම දරණ රාජ්‍ය අංශයේ සේවා බෙදහරින එකම හස්තය වූයේ සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යි. යෙදවුම් සහ සේවා කිරිපට්ටි ගොවියන්ට සැපයීම සම්බන්ධ අත්දැකීම් පෞද්ගලික අංශයට ද ඇත. රජයේ ප්‍රතිපත්ති රාමුව තුළ කිරිපට්ටි අංශය නඟා සිටුවීම සඳහා පශු සම්පත් සේවා බෙදහැරීම

උදෙසා පෞද්ගලික අංශයේ ආයෝජනය යොමු කිරීම වෙත සැලකිය යුතු දිරිගැන්වීමක් පවතින බැවින්, කිරිපට්ටි සේවා බෙද හැරීමේ දී පෞද්ගලික අංශයට සහභාගී වීමට ඇති හැකියාව නිර්ණය කිරීමට අධ්‍යයනයක් සිදු කිරීම වැදගත් ය.

## අධ්‍යනයේ අරමුණ

කුඩා පරිමාණයේ කිරිපට්ටි ගොවිතැන සඳහා සේවා බෙදහැරීම සම්බන්ධයෙන් පෞද්ගලික අංශයේ මැදිහත් වීම කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි සාධක හඳුනාගෙන ඒ ගැන වැඩි දුරටත් කරුණු හැදෑරීම අධ්‍යයනයේ මූලික අරමුණයි.

## අධ්‍යයන ක්‍රමය

ප්‍රතිලාභ ලබන්නන් (කුඩා පරිමාණ කිරිපට්ටි ගොවියන්) සහ සේවා බෙදහරින නියෝජ්‍යායතනවලින් එකතු කළ මූලික දත්ත, අධ්‍යයනයට ප්‍රධාන වශයෙන් පදනම් විය. පොල් ත්‍රිකෝන පද්ධතිය ද, වියලි කලාප පද්ධතිය ද වතුකරය ද නියෝජනය කරමින් කුරුණෑගල, අනුරාධපුර සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල අධ්‍යයනය සිදු කරන ලදී.

සෑම දිස්ත්‍රික්කයකින්ම කිරි නිෂ්පාදන එකතුකරන සමිති දෙක බැගින් තෝරා ගන්නා ලදී. තෝරා ගත් සෑම සමිතියකින් ම අහඹු ලෙස තෝරාගත් ගොවීන් 40 බැගින් ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා උපයෝගී කර ගන්නා ලදී. පෙර පරීක්ෂාවට භාජනය කරන ලද විස්තරාත්මක ප්‍රශ්නාවලියක් ක්ෂේත්‍ර අධ්‍යයනයට යොදා ගනු ලැබීය. සෑම සමිතියකම තෝරාගත් ගොවීන් සමඟ යොමුගත කණ්ඩායම් සාකච්ඡා දෙක බැගින් පවත්වන ලදී.

පවත්නා රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශවල සේවා බෙදහැරීමේ පද්ධතිවලින්, එම ආයතන සහ නියෝජිත ආයතනවල මුඛ්‍ය තොරතුරු සපයන්නන් සමඟ ව්‍යුහගත නොකළ සම්මුඛ පරීක්ෂණ පවත්වා දත්ත එකතු කරන ලදී. යථෝක්ත අංශ දෙකෙහිම ක්ෂේත්‍ර ව්‍යාප්ති සේවකයන් සමඟ පැවැත් වූ අනාකෘතික සාකච්ඡා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත එකතු කිරීමට ප්‍රයෝජනවත් විය.

## අධ්‍යයනයෙන් සොයාගත් කරුණු සහ ප්‍රතිපත්තිමය නිර්දේශ

හොඳ තත්ත්වයේ ගවයන් සොයාගැනීම අපහසුවීම හෝ එවන් ගවයන් නොමැති වීම නිසා වඩා උසස් ජාන විභවයක් ඇති ගව දෙනුන් ලබා ගැනීම ගොවීන්ට මුහුණපෑමට ඇති ප්‍රබල ගැටළුවකි. අධ්‍යයන ප්‍රදේශ තුනෙහිම ගොවීන්ට රජයේ ප්‍රජනන ගොවිපළ හෝ වෙනත් රජයේ ගොවිපළවලින් යහපත් තත්ත්වයේ සතුන් ලබාගැනීමට නොහැකි වී ඇත. ඔවුන් සතුව ඇත්තේ කෘත්‍රිම සිංචනය මගින් ඉහළ ශ්‍රේණියට නැංවූ සතුන් හෝ වෙනත් ගොවීන්ගෙන් මිලට ලබාගත් සතුන් ය. වැඩි කිරි ප්‍රමාණයක් ලබා දෙන සතුන් සඳහා ඉතා ඉහළ ඉල්ලුමක් සෑම පද්ධතියකම පවතී. එබැවින් ගොවීන්ගේ ඉල්ලුමට යොමු වූ හොඳ සතුන් ලබාදෙන කාර්යක්ෂම යාන්ත්‍රණයක් තිබිය යුතුය. රජයේ ප්‍රජනන ගොවිපළ සහ වෙනත් රජයේ ගොවිපළ සමඟ සම්බන්ධ වී, ගොවීන්ට හොඳ සත්ත්වයේ සතුන් ලබා ගැනීමට පහසු කරන වැඩසටහනකට සම්බන්ධ වීමට පශු වෛද්‍ය නිලධාරීන්ට හැකිවිය යුතුය.

ජානමය වශයෙන් ඉහළ තත්ත්වයකට නැංවූ සතුන් ගොවීන් සතුව ඇතත්, යෝග්‍ය නොවන ගව ආහාර නිසා එම සතුන්ගෙන් ලබන ප්‍රයෝජනය බෙහෙවින් හීන වී ඇත. හොඳ තත්ත්වයේ තණබිම් සහ වියළි තණ නිපයන තෘණබිම් හිඟ වීම ද දැනට තිබෙන සාන්ද්‍රිත ගව ආහාරවල අධික මිල ද සම්ප්‍රදායික වශයෙන් ප්‍රයෝජනයට ගත් සත්ව ආහාර සම්පත් නොමැතිවීම හෝ ඒවායේ ඌන භාවිතය ද සෑම අධ්‍යයන ප්‍රදේශයකම දුර්වල පෝෂණ තත්ත්වයට විශේෂයෙන් හේතු වී ඇත.

වසර පුරාම ජලය ලැබෙන බවට ස්ථිර කළ හැකි ඉඩම් කට්ටි ප්‍රමාණවත් ලෙස නොතිබීම සහ සිටුවීමට හොඳ තණ සහ වියළි තණ ලබාගත හැකි තණ වර්ග ලබා ගැනීම අපහසු වීම, විශේෂයෙන්ම වියළි කලාපයේ තණ බිම් ඇති කොට පවත්වා ගැනීමට බාධාවකි. වතුකරය තුළ ගොවීන් සතු ඉඩම් නොතිබීම ගොවීන් සතු තණ බිම් නොමැතිවීමට ප්‍රධාන හේතුවකි. විශේෂයෙන්ම වියළි කලාපයෙහි ගෙවතුවල හොඳ තත්ත්වයේ වියළි තණ වැවිය හැකි තෘණ බිම් ඇති කිරීමට පෙළඹවීම සහ සිටුවන ද්‍රව්‍ය සැපයීම, වගා පිළිවෙත් ඇතුළු තණ බිම් නඩත්තුව ගැන ව්‍යාප්ති සේවා පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ. ගව ආහාර මිශ්‍රණ සහ වෙනත් සාන්ද්‍රිත ආහාර නිෂ්පාදනය සහ බෙදාහැරීමට රජය මැදිහත් වී එම ද්‍රව්‍යවල මිල වැඩි කිරීම සහ මිල උච්චාවචනය පාලනය කොට ගොවීන්ට එම ද්‍රව්‍ය දරිය හැකි මිලකට ලබා ගැනීමේ අවස්ථාව සැලසිය යුතුය. අනෙක් අතට ලබාගත හැකි සම්ප්‍රදයික ආහාර සම්පත්වලින් උපරිම මට්ටමට ප්‍රයෝජන ගැනීමට ගොවීන්ට මග පෙන්වීම සත්ව ආහාර සඳහා දරන්නට වන මිල අඩු කිරීම උදෙසා ගත යුතු අත්‍යවශ්‍ය පියවරකි. වී වලින් ලබන පිදුරුවලට යූරියා යෙදීම, වියළි තණ සෑදීම, රනිල ශාකවලින් ආහාරයට කොළ ලබාගැනීම, ආදිය ප්‍රවර්ධනය කළ යුතු ක්‍රියාකාරකම් වේ.

වැඩි වශයෙන් ගොවීන් භාවිතා කරන සත්ව ප්‍රජනන ක්‍රමය කෘත්‍රිම සිංචනයයි. ස්වභාවික සේවනය සඳහා ගොනුන් ඇති කිරීම ඉතාම දුර්ලභය. විශේෂයෙන්ම පොල් ත්‍රිකෝණය සහ වියළි කලාපයෙහි කෘත්‍රිම සිංචන සේවය කලට වේලාවට ලබා ගත නොහැකි වීම සහ එම සේවයට අධික මිලක් අය කිරීම ගොවීන්ට මුහුණ පෑමට ඇති ප්‍රධාන ප්‍රශ්න වේ. පෞද්ගලිකව තමන්ගේම කෘත්‍රිම සිංචන තාක්ෂණ නිලධාරීන් යොදවා ගැනීමෙන් වතුකරයෙහි තිබෙන රාජ්‍ය නොවන සමාගම් දෙකක් තම ගොවීන්ට කාර්යක්ෂම සේවයක් ලබා දෙයි.

බොහෝ ප්‍රදේශවල කෘත්‍රිම සිංචනයෙන් පසු ගොවීන්ට කාර්යක්ෂම අනුගාමී සේවයක් නොලැබේ. බොහෝ ප්‍රදේශවල පශු වෛද්‍යවරුන් සඳහා ප්‍රමාණවත් ඉන්ධන සහ යැපීම් දීමනා නොලැබෙන බැවින් සුදුසු අනුගාමී සේවයක් ඉටු නොවේ. ගැබ් ගැනීම හඳුනා ගැනීම සහ වෙනත් අනුගාමී සේවාවලට පශු වෛද්‍යවරයා ගෙන්වා ගැනීමට ගොවීන් විසින්ම ගමන් ගාස්තු ගෙවිය යුතුය. ගමන් ගාස්තු අධික බැවින් ගැබ් ගැනීම හඳුනා ගැනීම සහ වෙනත් අනුගාමී සේවා ලබා ගැනීමට ගොවියෝ අකමැති වෙති. එබැවින් පැටව් ලබන කාල අන්තරය දීර්ඝ විය හැකිය. එසේ වුවහොත් එළදෙනගේ ප්‍රජනන හැකියාව අඩු වේ.

ගවයන්ගේ ශ්‍රේණිය උසස් කිරීමටත් ගවයන්ගේ ප්‍රජනන හැකියාව උපරිම මට්ටමෙහි තබා ගැනීමටත් යෝග්‍ය හා කාලීන කෘත්‍රිම සිංචන සේවයක් සහ අනුගාමී සේවාවන් තිබිය යුතුය. ක්ෂේත්‍ර නිලධාරීන්ගෙන් යහපත් සේවයක් ලබා ගැනීමට නම් පශු වෛද්‍ය කාර්යාලයට ඉන්ධන හා යැපීම් සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන් කළ යුතුය. වතුකරයෙහි රාජ්‍ය නොවන අංශයෙහි සමාගම් දෙකක් අනුගමනය කරන පරිදි තමන්ගේම කෘත්‍රිම සිංචන තාක්ෂණ නිලධාරීන් පත්කර දැරිය හැකි වියදමකට කාර්යක්ෂම සේවයක් ලබාදීම, සේවා බෙදහරින නියෝජිත ආයතන මෙන්ම ගොවීන්ට ද ප්‍රතිලාභ ගෙන දීමෙහිලා වඩාත් ප්‍රයෝජනවත් වනු ඇත.

තීක්ෂණ සෞඛ්‍ය ආරක්ෂා සේවයක් හෝ රෝග සුපරීක්ෂක ජාලයක් පවත්වා ගැනීම කිසිම රාජ්‍ය නොවන සංවිධානයක් හෝ සමාගමක් සිදු නොකරයි. සෑම ප්‍රදේශයකම රෝග සුව කිරීම සහ වැළැක්වීමේ සේවාවලට රාජ්‍ය අංශය සහභාගී වෙයි. රජයේ පශු වෛද්‍යවරුන් මඟින් සිදු කරන සෞඛ්‍ය සේවය ගැන බොහෝ ප්‍රදේහවල ගොවියෝ සෑහීමට පත් වී නැත. තම සතුන්ට කලට වේලාවට යහපත් සෞඛ්‍ය සේවයක් නොලැබෙන බවට බොහෝ අවස්ථාවලදී ගොවියෝ පැමිණිලි කරති.

පශු වෛද්‍ය නිලධාරීන්ට ප්‍රමාණවත් මුදලක් වෙන් කොට පහසුවෙන් නිලගමන්වල යෙදීමට සලස්වා, රෝග මර්දනය හා රෝග වැළැක්වීම, ගොවිපල සනීපාරක්ෂාව වැනි කරුණු ගැන ගොවීන් දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීම, රෝගවලින් නිදහස් ගව සම්පතක් ඇති කිරීමට අවශ්‍ය වේ.

විශේෂයෙන් වතු අංශයෙහි, ගොවීන්ගේ අධ්‍යාපන මට්ටම අඩුවීම, පශු සම්පත් පිළිබඳ පුහුණු වැඩසටහන්වල සහභාගීවීම සහ වෙනත් දැනුවත් කිරීමේ වැඩ සටහන්වලට සහභාගි වීම අඩු කරයි. ග්‍රාමීය මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන්වල ද වෙනත් දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් ද වතුකරයේ කම්කරුවන්ට (කිරි පට්ටි ගොවීන්ට) සහභාගි වීමට හැකි වන පරිදි සුදුසු කාල සටහනක් අනුව පැවැත්වීම අවශ්‍ය වේ. විශේෂයෙන්ම ගවමඩුවල තිබිය යුතු සනීපාරක්ෂාව ද පවතින සම්ප්‍රදායික සත්ව ආහාර ගැන දැනුවත් කිරීමේ වැඩ සටහන් ද වහා ඉටුවිය යුතු අවශ්‍යතා හැටියට දැක්විය හැක.

විධිමත් ලෙස ගවමඩු පවත්වා ගැනීම සෑම අධ්‍යයන ස්ථානයකම සිදුව ඇත්තේ මද වශයෙනි. විශේෂයෙන්ම වියළි කලාපයෙහි සහ පොල් ත්‍රිකෝනයෙහි විධිමත් ගව මඩුවක් පවත්වා ගැනීමට අඩු උනන්දුවක් දක්වන බව පෙනේ. වතුකරයේ ගවපට්ටි ගොවියෝ ගවමඩු පවත්වා ගැනීමට දැඩි උනන්දුවක් දක්වති. නමුත් ඔවුහු මඩුවල වතුර බැස යාම සහ වාතාශ්‍රය ගැන සැලකිල්ලක් නොදක්වති. මෙම තත්ත්වය ගවමඩුවල අයහපත් සෞඛ්‍ය තත්ත්වයක් ඇති කිරීමට හේතුවන බැවින් එය සත්ව සෞඛ්‍යයට බලපායි.

සත්ව සෞඛ්‍යය, ආහාර දීමේ කාර්යක්ෂමතාව, අප ද්‍රව්‍ය කළමනාකරණය, කම්කරු ශ්‍රම භාවිතය වැනි කරුණු ගැන අවශ්‍ය සැලකිලිමත්භාවයෙන් යුක්තව, විධිමත් ගවමඩු පවත්වා ගැනීමේ වැදගත්කම ගැන ගොවීන් දැනුවත් කළ යුතුය. විවිධ කිරි නිෂ්පාදන ප්‍රදේශවල පවතින දේශගුණික තත්ත්වය අනුව විධිමත් ගවමඩු තැනීම සඳහා තාක්ෂණික දැනුම සහ මූල්‍යාධාර ලබා දිය යුතුය.

කිරි මිලට ගැනීම සහ පිරිසැකසුම කරන සමාගම් අතර ගොවීන් ආකර්ෂණය කර ගැනීමටත්, ඔවුන් තමන් වෙත රඳවා ගැනීමටත්, බලවත් තරඟයක් පවතින බව සෑම ස්ථානයකම දක්නට ලැබිණ. අමු කිරි එකතු කිරීමට කිරි ගොවි සංවිධාන පිහිටුවා මෙම සංවිධාන තුළින් සේවා සැපයීම, කිරි එකතු කරන නියෝජිතායතන සහ සමාගම් අනුගමනය කරන ජනප්‍රිය ක්‍රමය වේ. කිරිවලට ගෙවීම සිදු වන්නේ අදාළ නියෝජිතායතනය හෝ සමාගම සකස් කළ මිල දර්ශනය අනුව ය. ලැක්ටෝ මීටරයේ කියවීම සහ ඝන මේද රහිත අන්තර්ගතය යන නිර්නායක පදනම් කර ගෙන මිල ලැයිස්තුව සකස් කරනු ලැබේ. දිවයින පුරාම සෑම කිරි එකතු කරන සමාගමක් සඳහාම පොදු මිල ලැයිස්තුවක් හඳුන්වා දීමෙන් රටේ විවිධ ප්‍රදේශවල පවතින මිල වෙනස් වීමට පිළියම් යෙදීම අත්‍යවශ්‍ය වේ.

**වෙනත් ක්‍රියාකාරකම්**

ටී.ඒ. ධර්මරත්න මහතා

- " ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතභාවය සඳහා ස්වාරක්ෂක තොග පවත්වා ගැනීම හඳුන්වාදීමට යෝජිත ක්‍රියාකාරකම්." කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට ඉදිරිපත් කළ ලියවිල්ලක්.

ආචාර්ය එම්.එස්. සේනානායක මහතා

- "ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම නූතනකරණය" චීන මහජන සමුහාණ්ඩුවේ වුහාන් හි පිහිටි හුබෙයි කෘෂිකර්ම නිලධාරී පුහුණු මධ්‍යස්ථානයේ දී ඉදිරිපත් කළ ලියවිල්ලක් - ජූලි 2004

- "ගොවි සමාගම් සහ කෘෂිකර්ම නූතනකරණය - ශ්‍රී ලංකාවේ අත්දැකීම් ගැන අධ්‍යයනයක්" චීන මහජන සමුහාණ්ඩුවේ වුහාන් හි පිහිටි හුඅසොං විද්‍යා හා තාක්ෂණ විශ්ව විද්‍යාලයේදී ඉදිරිපත් කළ ශාස්ත්‍රීය නිබන්ධයක් - ජූලි 2004

- "ශ්‍රී ලංකාවේ කුඩා වැව් ආශ්‍රිත ජනාවාස" යන තේමාව යටතේ හෙ.කො.ගො.ප.පු ආයතනයේ පැවති සම්මන්ත්‍රණයකට සහභාගි වීම. 2004 අගෝස්තු 21

- "විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ තුන්වන ද්විවාර්ෂික සම්මේලනය" යන ශීර්ෂය යටතේ NASTEC ආයතනය විසින් සංවිධානය කරන ලදුව බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි පැවති සම්මේලනයකට සහභාගි වීම. 2004 සැප්. 16 සිට 22.

- " ශ්‍රී ලංකාවේ ගොවි සමාගම් සාර්ථක ව්‍යාපාර ඒකක බවට පරිවර්තනය වීමේදී මුහුණපාන දුෂ්කරතා - ප්‍රතිපත්තිමය ගැටළු පිළිබඳ දළ විශ්ලේෂණයක්" ජපානයේ ටෝකියෝ නගරයෙහි මෙජි විශ්ව විද්‍යාලයේ පැවති ජපාන ආර්ථික ප්‍රතිපත්ති සමාජයේ තුන්වන අන්තර්ජාතික සම්මේලනයේදී ඉදිරිපත් කළ ලියවිල්ලක් - 2004 නොවැම්බර්

- " කිතුල් කර්මාන්ත සංවර්ධන වැඩසටහන" යන මැයෙන් කොළඹ කාර්මික තාක්ෂණ ආයතනයේ පැවති ජාතික වැඩමුළුවකට සහභාගි වීම. 2004 දෙසැ.14

ආර්.එම්.ජී.කේ.බී. රත්නායක මහතා

- "ආහාර අනාරක්ෂිතභාවය සහ අනතුරට නිරාවරණය වීම පිළිබඳ තොරතුරු සහ අනුරූප පද්ධතිය" ගැන හෙ.කො.ගො.ප.පු. ආයතනය සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානය එක්වී සංවිධානය කළ වැඩ මුළුවට සහභාගී වීම. 2004 ජූලි 23

- " ශ්‍රී ලංකාවේ වී/සහල් වෙළඳපොළෙහි මිල ස්ථාවරත්වය සහ ආහාර සුරක්ෂිතභාවය උදෙසා ස්වාරක්ෂක තොග කළමනාකරණය" යන මැයෙන් කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම සඳහා ලේඛනයක් සකස් කිරීමට දායක වීම - 2004 ජූලි 15-30

- " ශ්‍රී ලංකාවේ කුඩා වැව් ආශ්‍රිත ජනාවාස" යන මැයෙන් හෙ.කො.ගො.ප.පු. ආයතනයේ දී පැවති සම්මන්ත්‍රණයට සහභාගි වීම - 2004 අගෝ 21

- " විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ තුන්වන ද්විවාර්ෂික සම්මේලනය" යන ශීර්ෂය යටතේ NASTEC ආයතනය විසින් සංවිධානය කරන ලදුව බණ්ඩානායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි පැවති සම්මේලනයට සහභාගී වීම. 2004 සැප්.16-22

- " ශ්‍රී ලංකාවේ උණගස් භාවිතය ප්‍රවර්ධනය කිරීම" යන ශීර්ෂය යටතේ ශ්‍රී ලංකාවේ උණ ශාක සමාජය විසින් සංවිධානය කරන ලදුව SLASS හිදී පවත්වන ලද වැඩ මුළුවට සහභාගී වීම - 2004 ඔක් 12

- " තිරසාර සංවර්ධනය සඳහා ජලය බෙද ගැනීම" - සී.ජී. වීරමරන්ත්‍රී විනිසුරුතුමා ලබාදුන් දෙවන මතය ඇතුලත් නඩු තීන්දුව පරිවර්තනයට දායක වීම - 2004 ඔක්. 15-22

- " පොස්පේට් නිධිය ප්‍රයෝජනයට ගැනීම" යන ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා වෘත්තිකයන්ගේ සම්මේලනය විසින් සංවිධිනය කරන ලදුව හෙ.කොගො.ප.පු. ආයතනයේදී පවත්වන ලද වැඩ මුළුව සහ සාකච්ඡා මඩුල්ලට සහභාගී වීම - 2004 නොවැ. 05

- "ආහාර සහ පෝෂණය පිළිබඳ කාර්ය බලකාය" මාතෘකාව යටතේ කේ.එච්.ජේ. විජයදස මහතා විසින් ලේඛනයක් ඉදිරිපත් කිරීමේදී සහභාගීකරුවකු වශයෙන් සම්බන්ධ වීම - 2004 නොවැ. 19

- " පර්යේෂණ පැවැත්වීම සහ සංවර්ධනය - නව පර්යේෂණ සංස්කෘතියක අවශ්‍යතාවය" යන ශීර්ෂය යටතේ NASTEC ආයතනය විසින් සංවිධානය කරන ලදුව SLASS හිදී 2004 නොවැ. 25 පවත්වන ලද වැඩමුළුවට සහභාගී වීම

- " කාබනික කෘෂිකර්මයට විවෘතවීම" යන මැයෙන් ලංකා කාබනික කෘෂිකර්ම කළමනාකරන ආයතනය විසින් සංවිධානය කරන ලද වැඩ මුළුවට සහභාගී වීම - 2004 නොවැ. 30

ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා සහ ඩී.ඩබ්.එස්.ඩී.කේ. සෙනෙවිරත්න මිය

- "ශ්‍රී ලංකාවේ ජලසම්පත් සම්බන්ධයෙන් මෑත දී ඇති වූ සංවර්ධන ප්‍රවණතා" යන මාතෘකාව යටතේ SLASS හිදී පවත්වන ලද සම්මන්ත්‍රණයට සහභාගී වීම 2004.පෙබ. 19

- " කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ගිවිසුම්ගත පර්යේෂණ වැඩ සටහන" යන මැයෙන් පේරාදෙණියේ ගන්නොරුවේ පිහිටි සේවාස්ථ පුහුණු ආයතනයේ දී පැවති පර්යේෂණ සම්මන්ත්‍රණයට සහභාගී වීම. 2004 මාර්තු 12

- " ආහාර අනාරක්ෂිතභාවය සහ අනතුරට නිරාවරණය වීම පිළිබඳ තොරතුරු සහ අනුරූප පද්ධතිය" යන ශීර්ෂය යටතේ හෙ.කො.ගො.ප.පු. ආයතනය සහ ආහර කෘෂිකර්ම සංවිධානය විසින් සංවිධානය කරන ලද වැඩ මුළුවට සහභාගී වීම - 2004 ජූලි 23

- " පොස්පේට් නිධිය භාවිතයට ගැනීම" යන ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා වෘත්තිකයන්ගේ සම්මේලනය විසින් සංවිධානය කරනු ලැබ හෙ.කො.ගො.ප.පු. ආයතනයේ දී පවත්වන ලද වැඩමුළුව සහ සාකච්ඡා සභාවට සහභාගිවීම - 2004 නොවැ.05

- " සේතුසමුද්‍රම් මුහුදු මාර්ගය" ගැන ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ රැස්වීම් ශාලාවෙහි පවත්වන ලද වැඩ මුළුවට සහභාගිවීම 2004 නොවැ. 12

- " ආහාර සහ පෝෂණය පිළිබඳ කාර්ය බලකාය" මාතෘකාව යටතේ කේ.එච්.ජේ.විජයදාස මහතා විසින් ලේඛනයක් ඉදිරිපත් කිරීමේදී සහභාගීකරුවකු වශයෙන් සම්බන්ධවීම. 2004 නොවැ.19

- " කාබනික කෘෂිකර්මයට විවෘත වීම" යන මැයෙන් ලංකා කාබනික කෘෂිකර්ම කළමනාකරණ ආයතනය විසින් සංවිධානය කරන ලද වැඩ මුළුවට සහභාගී වීම. 2004 නොවැ.30

ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා

- ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දී ග්‍රන්ථයක් එළි දැක්වීමේ (එච්.ඩී.එම්. සෙනෙවිරත්න මහතාගේ පුල්එලිය) උත්සවයට සහභාගී වීම - 2004 පෙබ.10

- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ශාස්ත්‍රීය සංග්‍රහය වැඩ සටහනෙහි සම්පත් දයකයකු වශයෙන් සහභාගී වීම. 2004 මාර්තු 30

- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ශාස්ත්‍රීය සංග්‍රහය වැඩ සටහනෙහි සම්පත් දයකයකු වශයෙන් සහභාගි විම - 2004 මැයි 26

- " ශ්‍රී ලංකාවේ පශු සම්පත් කර්මාන්තය" ගැන ලිපියක් සම්පාදනය කොට ගොවිජනතා වෙළුම 07 අංක 01, ඔක්. 2004 කලාපයෙහි පළ කිරිම

ඩී.ඩබ්.එස්.ඩී.කේ සෙනෙවිරත්න මෙනවිය

- 'දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේදි පවත්වන ලද 'සේවාවන්ගේ ප්‍රයෝජනය දුප්පතුන්ට ලැබෙන පරිදි කටයුතු කිරිම' පිළිබඳ විඩියෝ සම්මන්ත්‍රණයට සහභාගී වීම. 2004 ජූනි 22

# වාරි ජලකළමනාකරණ සහ ගොවිජන සබඳතා අංශය

**කාර්ය මණ්ඩලය**

| | | |
|---|---|---|
| අචාර්ය ඩබ්.එම්.ජී.බී. ගිරාගම මහතා | - | අංශ ප්‍රධාන |
| ආර්.ද. එස්. ආරියබන්දු මහතා | - | අධි පර්යේෂක |
| එම්.එම්.එම්. අහියර් මහතා | - | සහාය අධි පර්යේෂණ |
| එච්.එම්.ජේ.කේ. හේරත් මහතා | - | පර්යේෂණ නිලධාරී |
| පී.සී. ජයම්පති ද සිල්වා මහතා | - | පර්යේෂණ නිලධාරී |
| එම්.ඒ.සී. සිදත් බණ්ඩාර මහතා | - | පර්යේෂණ නිලධාරී (අධ්‍යයන නිවාඩු ලබා ඇත) |
| ජී.ජී.ද.එල්.ඩබ්. සමරසිංහ මහත්මිය | - | පර්යේෂණ නිලධාරී (අධ්‍යයන නිවාඩු ලබා ඇත) |
| ඩී.ජී. කරුණාරත්න මහතා | - | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී |

**නිම කළ අධ්‍යයන**

**1. තිරසර ග්‍රාම සංවර්ධන වැඩ සටහන - මාතලේ දිස්ත්‍රික්කය**

**පර්යේෂණ කණ්ඩායම :**

ආචාර්ය ඩබ්.එම්.ජී.බී. ගිරාගම මහතා
ආර්.එල්.එන්. ජයතිස්ස මහතා
එච්.එම්.ජේ.කේ. හේරත් මහතා
පි.සී. ජයම්පති ද සිල්වා මහතා
එම්.ඒ.සී. සිදත් බණ්ඩාර මහතා

අධ්‍යයනය අනුව (දිගම්පතහ ගමෙහි) ගොවීන් මුහුණ දෙන විවිධ ගැටළු හඳුනා ගන්නාලදී. ජල හිඟය, වල් අලි උවදුර, නීත්‍යානුකූල නොවන මත්පැන් සහ හොඳ බීජ දුලබවීම ගැටළු අතර වේ. තවද ලොකු ළූණු නිෂ්පාදන වියදම අධික බව ද ඒවා අලෙවි කිරීමේ ගැටළු ඇති බව ද අධ්‍යයනයේ දී පැහැදිලි විය.

ගෙවතු දියුණු කිරිම සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලදී. තවද පැළ සහ උපදෙස් ලබා දෙනු ලැබිය. මධ්‍යම පළාතේ ගෙවතු තරගයේදී පළමුවන ත්‍යාගය දිගම්පතහ ගමේ ගොවි මහතෙකුට හිමි විය. වැව් දෙකක ජලජ රෝපණ වැඩසටහන් පවත්වන ලදී. බිම් මට්ටමේ ජලාශවල වැසි ජලය එකතු වෙන්නට සලස්වා එමගින් කජු වගා කරන ලදී. නායකත්ව සංවර්ධනය, ලොකු ළූනු වගාව, කාබනික ගොවිතැන පොහොර හැටියට දහයියා භාවිතා කිරීම, දිල්ලිහොට් මිරිස් වගාව, ප්‍රජා සංවර්ධනය සහ පශුසම්පත් සංවර්ධනය ගැන පුහුණු වැඩ සටහන් රාශියක් පවත්වා ඇත. ගම තුළ නළ ළිං 4ක් සාදන ලදී. ක්‍රීඩා, සමාජ ශුභ සාධනය නළ ළිං නඩත්තුව යන විෂයන් සඳහා පිරිමි සහ කාන්තා සහභාගිත්වය ඇති කමිටු කීපයක් පිහිටුවන ලදී. සියලු ව්‍යාපෘති සම්බන්ධීකරණය සඳහා තිරසර සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරී කමිටු පිහිටුවන ලදී. ලොකු ළූණු බීජ නිෂ්පාදන වැඩ සටහනක් පවත්වන ලදී.

පශු සම්පත් සංවර්ධන වැඩ සටහන යටතේ කෘත්‍රිම සිංචන සායන කීපයක් ද හෝමෝන් ප්‍රතිකාරය ද සිදු කරන ලදී. ව්‍යාපෘතිය අවසන් කරන ලදුව වාර්තාවක් ඉදිරිපත් කර ඇත.

**2. ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍රවාරි තාක්ෂණය භාවිතා කිරිම : විභවතා සහ බාධක**

**පර්යේෂණ කණ්ඩායම :**

එම්.එම්.එම්. අහියර් මහතා
එස්. ධර්මලිංගම් මහත්මිය
ජී.ජී.ද.එල්. සමරසිංහ මහත්මිය

1990 දශකයේ අවසානභාගයේ සිට නියමු පදනමක් යටතේ ක්ෂුද්‍ර වාරි ක්‍රම වර්ධනයට, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ විවිධ ප්‍රදයක නියෝජිතායතන සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් ආයෝජනය කර ඇත. කුඩා පරිමාණ ගොවිජනතාවට ක්ෂුද්‍ර වාරි තාක්ෂණය සාපේක්ෂ වශයෙන් මෑත කාලයේ දී හඳුන්වා දී ඇති බැවින්, මෙම තාක්ෂණයේ ශක්‍යතාවය ගැන සවිස්තරාත්මක සමාජ ආර්ථික අධ්‍යයනයන් සිදු කර නැත. මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වූයේ, ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර වාරි පද්ධති ප්‍රවර්ධනය කිරීමේ විභවතාවය දනගැනීම සහ දනට මෙම තාක්ෂණය භාවිතා කරන කුඩා පරිමාණ ගොවීන්ට අත්විඳින්නට සිදුවන ගැටළු සහ බාධා හඳුනා ගැනීමයි. උතුරු මැද ප්‍රදේශයේ $DL_1$ කෘෂි පාරිසරික කලාපයෙන් සහ දකුණු වියළි කලාපයෙන් අධ්‍යයන ප්‍රදේශ තෝරාගන්නා ලදී. තෝරාගත් නියැදි ප්‍රමාණය 69 කි.

රතු ළූනු, ලොකු ලූනු, ගර්කින් සහ පැපොල් යන වගාවන් සඳහා ආර්ථික විශ්ලේෂණය සිදු කරන ලදී. එම අධ්‍යයනය අනුව පෙනී ගියේ අවුරුදු එකක් හෝ දෙකක් ඇතුළත මූලධන ආයෝජනය නැවත උපයා ගැනීමට, තෝරාගත් භෝගවලින් ප්‍රමාණවත් ආදයමක් ලැබුණ බවයි. ජල බිංදු වාරික්‍රමය යටතේ පාපොල් වැවීම, 20% ක වට්ටමක් යටතේ වුවද ආර්ථික වශයෙන් එලදයී විය. ක්ෂුද්‍ර වාරික්‍රම යටතේ වගා කරන භූමිය අක්කර 0.125 සිට 02 දක්වා පරාසයක පවතී. ඒ අතුරෙන් ගොවීන් වැඩි සංඛ්‍යාවක් අක්කර 0.25 සිට 0.5 දක්වා ප්‍රමාණයක් වගා කළහ. ක්ෂුද්‍ර වාරික්‍රම භාවිතා කළ ගොවීන් 77%ක්ම භූගත ජලය භාවිතා කළහ. ක්ෂුද්‍ර වාරි තාක්ෂණය ඇරඹීමෙන් පසුව වුවද ගොවීන් වැඩි දෙනෙක් තමන් වවන සම්ප්‍රදායානුකූල භෝග වෙනස් කර නැත.

ගොවීන් 52%ක අත්දකීම වූයේ විසිරි වාරි ක්‍රමයෙහි (Sprinkler irrigation) ප්‍රධාන අඩුපාඩුව ඒකාකාරී නොවන ජල සැපයුමය. ක්ෂුද්‍ර වාරි ජල සැපයුම සඳහා අඩු පීඩන පොම්ප යෙදීම නිසා වේගවත් ක්‍රියාකාරිත්වය තුළ ඉන්ධන සඳහා වැඩි මුදලක් වැය වේ. මෙම වාරි ක්‍රමයෙන් සපයන ජල ප්‍රමාණය භෝගවලට ප්‍රමාණවත් නොවේ යනුවෙන් ගොවීන් අතර පවතින වැරදි විශ්වාසය එම ක්‍රමය ප්‍රවර්ධනය කිරීමට පවතින එක් බාධාවකි. වසර 2002 වන විට ක්ෂුද්‍ර වාරික්‍රම අයිතිව සිටි ගොවීන් අතුරෙන් 57%ක් එම ක්‍රම භාවිතා නොකළ බව සමීක්ෂණයෙන් හෙළි විය. එයට හේතු දෙකකි. එනම් 1. ප්‍රතිලාභීන් නිවැරදි ලෙස තෝරා නොගැනීම සහ 2. ක්ෂුද්‍ර වාරි තාක්ෂණය ගැන මනා පුහුණුවක් හා දනුවත්කමක් නොතිබීමයි.

ක්ෂුද්‍ර වාරි පද්ධති අයිතිකරුවන් 13% ක් දනටමත් තමන් සතු පද්ධති විකුණා තිබීම සැලකිය යුතු කරුණකි. සැපයුම් කරුවන්ගේ සේවය ඉතා දුර්වල වූ බැවින් අමතර කොටස් සහ තාක්ෂණ දනුම ලබා ගැනීමේ දුෂ්කරතාවලට මුහුණ පෑමට ගොවීන්ට සිදු විය. තම ප්‍රදේශයෙහි කණ්ඩායම් ගොවිතැන (අවම වශයෙන් අක්කර 10ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක්) පවතී නම් සැපයුම්කරුවන්ට විකිණීමෙන් පසු දරිය හැකි වියදමකට සේවාවන් සැපයිය හැකි බැවින් එම ක්‍රමය අනුගමනය කිරීම යෝග්‍ය බව නිර්දේශ කරමු.

### 3. ක්ෂුද්‍ර ව්‍යවසාය සඳහා ක්ෂුද්‍ර මූල්‍ය සම්පාදනය : සමෘද්ධි සහ සමෘද්ධි නොවන ක්ෂුද්‍ර ව්‍යවසායකයන් පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණයක්

**පර්යේෂක :** එම්.එම්.එම්.අහියර්

වර්තමානයෙහි ක්‍රියාත්මක දිළිඳුබව අවම කිරීමේ උපාය සහ වැඩ සටහන් වඩාත් නිවැරදිව යොමුගත කිරීම සඳහා ප්‍රතිපත්තිමය ගුරුපදේශ ලබා දීමේ අරමුණ ඇතිව ජාතික දිළිඳුකම අවම කිරීමේ උපාය සහ වැඩසටහන් සහ සමෘද්ධි වැඩ සටහන් ගැන විශේෂ අවධානයකින් යුක්තව, ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර ව්‍යවසාය සංවර්ධනයට පවත්නා දිරිගැන්වීම්, බාධක සහ අවහිරතා හඳුනා ගැනීම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ.

1 ග්‍රාමීය ක්ෂුද්‍ර ව්‍යවසායකයන්ගේ අනන්‍යතාව හඳුනා ගැනීම සහ එම ව්‍යවසායන්ට අවශ්‍ය

සම්පත් ලබා ගැනීම සහ ඒවා හැසිරවීමට ඇති හැකියාව ඇසුරුකොට ගෙන එම ව්‍යවසායන්ගේ ස්වභාවය විශ්ලේෂණය කිරීම

2. විශේෂිත අධ්‍යයන ස්ථානයන්තහි ක්ෂුද්‍ර ව්‍යවසාය වර්ධනයට පවත්නා දිරිගැන්වීම්, බාධක සහ අවහිරතා හඳුනා ගැනීම

3. මෙම ව්‍යවසායකයන්ගේ සාර්ථකත්වය අසාර්ථකත්වය සමඟ සමාජ ආර්ථික සහ ස්ත්‍රී පුරුෂභාවය දක්වන සබඳතාවය සහ එම ව්‍යවසායන් පිළිබඳ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල මැදිහත්වීම් හඳුනා ගැනීම.

4. විවිධ ක්ෂුද්‍ර ව්‍යවසායන් (කෘෂිකර්මය, සත්ව පාලනය, අලෙවිය සහ කුඩා කර්මාන්ත) සාර්ථක වීම හෝ අසාර්ථකවීම සහ සමෘද්ධිය මඟින් ලබාදුන් ක්ෂුද්‍ර මූල්‍ය මට්ටම අතර සබඳතාවය සොයා බැලීම

5. අසාර්ථක ක්ෂුද්‍ර ව්‍යවසායකයන්ගේ ඉරණම ගැන තවදුරටත් සොයාබැලීම. එනම්, අනාගත පැවැත්මේ උපාය, විකල්ප ක්ෂුද්‍ර ව්‍යවසායන්ට දක්වන උනන්දුව, ණය ආපසු ගෙවීම, මූල්‍ය පහසුකම් ලබන වෙනත් මූලාශ්‍ර, දිළිඳුකම අවමකරන උපාය මාර්ග සහ වැඩසටහන් කෙරෙහි දක්වන ප්‍රතිචාරය, සිවිල් සමාජය සහ පවුල සහ එවන් ආයතනවලින් ඔවුන් ලබන ප්‍රතිපෝෂණය.

6. සමෘද්ධි නියෝජිතයන් (සජීවි කාරක, කළමනාකරු සහ වෙනත් ඉහළ මට්ටමේ නියෝජිතයන්) ඉටු කළ මූල්‍ය නොවන කාර්යභාරය හඳුනා ගැනීම සහ මෙම ආයතනවලින් ක්ෂුද්‍ර ව්‍යවසායකයන් බලාපොරොත්තු වූ වෙනත් මූල්‍ය නොවන ආධාර හඳුනා ගැනීම

7. ක්ෂුද්‍ර ව්‍යවසායන්ගේ දීර්ඝ කාලීන පැවැත්මට ඇති බාධක හඳුනා ගැනීම සහ දනට පවත්නා දිළිඳුකම අවම කිරීමේ උපාය සහ වැඩසටහන් වඩාත් සාධාරණ ලෙස නැවත යොමුගත කළහැකි ක්‍රම හඳුනා ගැනීම

අධ්‍යයනයේ දත්ත රැස් කිරීම අවසන් කර ඇත. වාර්තා සම්පාදනය සිදුවෙමින් පවතී.

## 4. මාතලේ සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ලොකු ළූනු නිෂ්පාදනය සහ අලෙවිය.

**පර්යේෂණ කණ්ඩායම**

පී.සී.ජේ. ද. සිල්වා මහතා
ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා
ආර්.එල්.එන්. ජයතිස්ස මහතා

ලොකු ළූණු වගා නිෂ්පාදන සහ අලෙවි පද්ධති අධ්‍යයනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. ක්ෂේත්‍ර අධ්‍යයනය සිදු කළ ප්‍රදේශ මෙසේය. 1. මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල සහ කිඹිස්ස කෘෂි සේවා මධ්‍යස්ථානවලට අයත් ප්‍රදේශ 2. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවැලි කොට්ඨාශ වන ගල්නෑව සහ තලාව. එම දිස්ත්‍රික්කයේම ඇතාකඩ සහ ගලෙන්බිඳුනවැව කෘෂිසේවා මධ්‍යස්ථානවලට අයත් ප්‍රදේශ. දිස්ත්‍රික්ක දෙකෙහිම උස් බිම්වල ගොවීන් විශාල සංඛ්‍යාවක් ලොකුළූණු වගා කරන බව පෙනුණි. මාතලේ දිස්ත්‍රික්කයේ උස්බිම්වලින් ලොකුළූණු නිපයුම පිළිබඳ ඉහළම සාමාන්‍යය වාර්තා විය. ගොවීන් මුහුණ දෙන ප්‍රධානම ප්‍රශ්නය නම් උසස් තත්ත්වයේ බීජ ලබා ගැනීම අපහසු වීමයි. ඒ ඇරුන විට, ජල හිඟ වීම, දුබල ව්‍යාප්ති සේවය සහ අධික ලෙස රසායනික පොහොර භාවිතා කිරීම වහා අවධානය යොමුවිය යුතු ගැටළු බව පෙනී ගියේය.

මෙරට ලොකු ළූණු නිෂ්පාදනයට බෙහෙවින් අවශ්‍ය වන ළූණු බීජ දේශීය වශයෙන් නිපදවීම වැඩිකරන අතරම කෙටි කාලීන විසඳුමක් වශයෙන් ඉන්දියාවෙන් හොඳ තත්ත්වයේ බීජ ආනයනය

කිරීමට රජය මැදිහත් වීම සුදුසු බව නිර්දේශ කරනු ලැබේ. යෝග්‍ය පරිදි කෘෂි ළිං තැනීම වාරි ජල සැපයීමේ ප්‍රශ්නය බොහෝ දුරට ලිහිල් කරනු ඇත. තවද, මෙරට අස්වැන්න නෙළන කාලයේදී ලොකු ළූණු ආනයනය නැවැත්වීම හේතු කොට ගෙන දේශීය නිෂ්පාදනය නිශ්චිතවම වැඩි වනු ඇත. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ වෙළඳුන් අයකරන කොමිස් මුදල වෙත ද අවධානය යොමු කිරීම අතිශයින්ම වැදගත් ය.

## 5. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය.

**පර්යේෂණ කණ්ඩායම**

එස්.ඩබ්.ජී.කේ. බුලන්කුලම මහත්මිය
එම්.කේ.එස්. දමයන්ති මෙනෙවිය

**අධ්‍යයනයේ අරමුණු මෙසේය :**

1. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අතිරික්ත වී නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම.
2. වී අලෙවිය සිදුවන ආකාරය හඳුනා ගැනීම.
3. වී නිෂ්පාදකයන්, සහල් මෝල් හිමියන් සහ ගැනුම්කරුවන් අතර සබඳතාවය අධ්‍යයනය කිරීම.
4. වී ගොවිතැන් කරන ගොවීන්, වී මිලට ගනු ලබන්නන් සහ වී මෝල් හිමියන් මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීම සහ
5. පොළොන්නරුවේ වී මිල අඩුවීමේ ගැටළුව විසඳීමට නිර්දේශ ඉදිරිපත් කිරීම.

ප්‍රතිපල අනුව පෙනී යන්නේ ගොවීන් අතුරෙන් 29% ක් පමණක් හොඳ මිලක් ලැබෙන තුරු වී ගබඩා කරන බවයි. ගොවීන්ගෙන් 12%කට පමණක් වී ගබඩා පහසුකම් ඇත. සෙසු පිරිස් නිවස තුළ වී ගබඩා කරති. වාර්තාව සම්පූර්ණ කර ඇත.

## ආහාර අනාරක්ෂිතභාවය සහ අනතුරට නිරාවරණය වීම පිළිබඳ තොරතුරු සහ අනුරූපන පද්ධති ව්‍යාපෘතිය.

**පර්යේෂණ කණ්ඩායම**

එච්.එම්.ජේ.කේ. හේරත් මහතා
ඩබ්.ඩී. වික්‍රමසිංහ මහත්මිය

**ව්‍යාපෘතියේ අරමුණු නම් :**

* ප්‍රතිපත්ති සම්පාදනයේ දී වැඩි ප්‍රමුඛතාවයක් හිමිවන පරිදි, ආහාර සුරක්ෂිතභාවය පිළිබඳ ගැටළු වෙත ජාතික සහ අන්තර්ජාතික අවධානය යොමු කිරීම.

* ආහාර සුරක්ෂිතභාවයට අදළ උප ජාතික මට්ටමේ දත්ත සහ දත්ත විශ්ලේෂණය පිළිබඳ විශ්වාසනීයත්වය, ගුණාත්මකභාවය, සහ කාලීනභාවය දියුණු කිරීම

* අනුපූරක තොරතුරු සංඝටක වඩා හොඳින් ඒකාබද්ධ කොට බහු - අංශික විශ්ලේෂණය පහසු කිරීම

* ප්‍රයෝජන ලබන්නන්ගේ අවශ්‍යතා වඩා හොඳින් තේරුම් ගැනීමෙන් සහ වඩා ඵලදයී බෙදහැරීමෙන්, තොරතුරුවලින් වඩා හොඳ ප්‍රයෝජනයක් ගැනීමට අනුබල දීම.

* ජාලගත කිරීමෙන් සහ බෙදගැනීමෙන් ප්‍රයෝජන ගන්නන්ට තොරතුරු ලැබීම පහසු කිරීම.

සෑම දෙනාටම සියලු කල්හි, ක්‍රියාශීලි සෞඛ්‍යසම්පන්න ජීවිතයකට අවශ්‍ය ආරක්ෂා සහිත පෝෂ්‍යදයක ආහාර භෞතික, සාමාජික සහ ආර්ථික වශයෙන් ප්‍රමාණවත් ලෙස ලැබෙන තත්ත්වයක් පවතී නම් එය ආහාර සුරක්ෂිතභාවය පවතින තත්ත්වයකි. සාමාන්‍ය භෞතික හා මානසික වර්ධනයට අවශ්‍ය ආරක්ෂා සහිත පෝෂ්‍යදයක ආහාර ප්‍රමාණවත් ලෙස ජනතාවට නොලැබේ නම් එය ආහාර අනාරක්ෂිතභාවය පවතින තත්ත්වයකි.

සංවර්ධනයවන රටවල ජනගහනයෙන් මිලියන 800ක් පමණ ඌන පෝෂිත තත්ත්වයෙහි පසුවන බවද, ඒ අතුරෙන් මිලියන 170 ක් පමණ අවු. 5ට අඩු ළමයින බවද, 1996 දී රෝමයේ දී පැවති ලෝක ආහාර සමුළුවේදී වාර්තා විය. 2015 වන විට මෙම සංඛ්‍යාව අඩකින් අඩු කිරීමටද, දීර්ඝ කාලීන වශයෙන් සාගිනි තුරන් කොට සියලු දෙනාටම ආහාර සුරක්ෂිතභාවය ලබා දීමට ද ලෝක ආහාර සමුළුව තීරණය කළාය.

**7. සී.ජී. වීරමන්ත්‍රී විනිසුරුතුමාගේ 'ශ්‍රී ලංකාවේ පුරාණ වාරි පද්ධතිය ආශ්‍රිත පාරිසරික ලක්ෂණ' නම් කෘතිය සිංහලට පරිවර්තනය කිරීම.**

කණ්ඩායම : අනුරුද්ධ ප්‍රදීප් මහතා (පරිවර්තක)
ආචාර්ය ඩබ්.එම්.ජී.බී. ගිරාගම මහතා (සම්බන්ධීකාරක)

සී.ජී. වීරමන්ත්‍රී විනිසුරුතුමාගේ 'ශ්‍රී ලංකාවේ පුරාණ වාරි පද්ධතිය ආශ්‍රිත පාරිසරික ලක්ෂණ' නම් වූ ග්‍රන්ථය සිංහලට පරිවර්තනය කරන ලදුව රජයේ මුද්‍රණාලය මඟින් මුද්‍රණය කරන ලදී.

**8. 'ශ්‍රී ලංකාවේ කුඩා වැව් ආශ්‍රිත ජනාවාස' පිළිබඳ සම්මන්ත්‍රණය. 2004 අගෝ.21 - හෙ.කො.ගො.ප.පු. ආයතනයේ දී පවත්වන ලදී.**

**සම්බන්ධීකාරකයෝ :**

ආචාර්ය ඩබ්.එම්.ජී.බී. ගිරාගම මහතා
එම්.එම්.එම්. අභියර් මහතා

**සම්මන්ත්‍රණයට සහභාගි වූ සම්පත්දායකයින් සහ ඔවුන් ඉදිරිපත් කළ දේශනා:**

ආචාර්ය එම්.යූ.ඒ. තෙන්නකෝන් මහතා - අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා මහවැලි අධිකාරය,
"වැව් එක කාර්යකට කැප වී නැත, ඒවා බහු කාර්ය ඉදිකිරීම් වේ"

ඉංජිනේරු ජී.ටී. ධර්මසේන මහතා, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්
"වාරිකර්මාන්තයේ ගෝලීය විවිධත්වය සහ බහු කාර්ය මෙහෙවර"

ඉංජිනේරු ඩී.ඩී. ප්‍රභාත් විතාරණ මහතා, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
" පුනරුත්ථාපනය සඳහා කුඩා වැව් වර්ගීකරණය"

ආචාර්ය පී.බී. ධර්මසේන මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
"කුඩා වැව් පිළිබඳ උරුමය සහ වර්තමාන ගැටළු"

මහාචාර්ය සී.එම්. මද්දුම බණ්ඩාර මහතා, පේරාදෙණිය විශ්ව විද්‍යාලය,
"වියළි කලාපයේ වැව් එකිනෙකට යාකරන ජල ධාරා රටාව"

ආචාර්ය ජේම්ස් හඳවල මහතා,

'වැව් පුනරුත්ථාපනයට පූර්ව අවශ්‍යතාවයක් ලෙස වර්ෂාපතනය තේරුම් ගැනීම'

විද්‍යා ජෝති ආචාර්ය සී.ආර්. පානබොක්කේ මහතා, 'ශ්‍රී ලංකාවේ කුඩා වැව් ආශ්‍රිත ජනාවාස

**සාකච්ඡා සභාව**

ඉංජිනේරු ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා, අධ්‍යක්ෂ (විශේෂ ව්‍යාපෘති) වාරිමාර්ග අමාත්‍යාංශය.

නන්ද අබේවික්‍රම මහතා, ලංකා ජලනි.

ආචාර්ය ආර්.ඩී. වනිගරත්න මහතා, උපදේශක, ඉඩම් නම් කිරීමේ ව්‍යාපෘතිය.

ඉංජිනේරු එස්. සෙල්වරාජා, ගරු ඇමතිතුමාගේ උපදේශක

සම්මන්ත්‍රණයේ කාර්ය වාර්තාව හෙ.කො.ගො.ප.පු. ආයතනයේ අධ්‍යක්ෂ ඩී.ජී.පී. සෙනෙවිරත්න මහතාගේ හැඳින්වීමක් සමඟ ප්‍රකාශයට පත්කර ඇත.

**වෙනත් කටයුතු**

* 2004 දෙසැ. 20 දින කොළඹ විශ්ව විද්‍යාලයේදී පවත්වන ලද ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ 60 වන වාර්ෂික සම්මේලන වාරයේ දී, ආචාර්ය ඩබ්.එම්.ජී.බී. ගිරාගම මහතා විසින් 'වර්ෂාපතනය කෙරෙහි ඉහළ වායුගෝලයේ බලපෑම' යන ශීර්ෂය යටතේ E1 අංශයේ සභාපති දේශනය පවත්වන ලදී.

* 'ජල සම්පත් සංවර්ධනය ශ්‍රී ලංකාවේ ඉහළ මහවැලි ජලාධාරයෙහි ඉඩම් පරිහරණය වන ජල ඉල්ලුම කෙරෙහි බලපාන ආකාරය' යන මැයෙන් දේශනයක් ආචාර්ය ගිරාගම මහතා විසින් කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. 2004 නොවැ. 19.

* "දේශගුණ විචල්‍යතාවය සහ ඉඩම් පරිහරණ වෙනස්වීම්, පේරාදෙනියේ සහ තලවකැලේ ජලය ගලායාම කෙරෙහි බලපාන ආකාරය" යන මැයෙන් ලියවිල්ලක් ආචාර්ය ගිරාගම මහතා විසින් 2004 ඔක් 01 දින පේරාදෙණියේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයෙහි දී ජල වෘත්තිකයන්ගේ දිනය නිමිත්තෙන් පැවති සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කරන ලදී.

* "ශ්‍රී ලංකාවේ ඉහළ මහවැලි ද්‍රෝණියෙහි ආහාර, ජනතාව සහ පරිසරය සඳහා ජලය" යන මාතෘකාව යටතේ ලියවිල්ලක් ලංකා ජලනි විසින් 2004 මැයි 07 දින ගලධාරි හෝටලයේදී පවත්වන ලද රැස්වීමකදී ආචාර්ය ගිරාගම මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

* "මෝසම් වැසි කලාපයේ වෙනස් වන පරිසරයක් තුළ තිරසර ජල කළමනාකරණය" යන තේමාව යටතේ 2004 නොවැ. 17-19 දිනවල බණ්ඩාරනායක අනුස්මරණ අන්තර් ජාතික සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති අන්තර් ජාතික සම්මන්ත්‍රණයයකට ආචාර්ය ගිරාගම මහතා සහභාගි විය.

* NASTEC ආයතනය විසින් සංවිධානය කරනු ලැබ, 2004 සැප්. 16-19 දිනවල කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රන ශාලාවේ පවත්වන ලද, "විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ තුන්වන ද්විවාර්ෂික සම්මේලනය" ට හෙ.කො.ගො.ප.පු. ආයතනයේ අධ්‍යක්ෂ ඩී.ජී.පී. සෙනෙවිරත්න මහතා ද ආචාර්ය ගිරාගම මහතාද සහභාගි වූහ.

* තිරසාර සංවර්ධනය සහ දේශගුණ වෙනස්වීම් සඳහා හැකියා වර්ධනය යන ශීර්ෂය යටතේ, එක්සත් ජාතීන්ගේ අනුග්‍රහය ඇතිව සංවර්ධනය සඳහා වන මුනසිංහ ආයතනය විසින් හෙ.කො.ගො.ප.පු. ආයතනයේ දී 2004 ජූනි 8-9 දිනවල පවත්වන ලද වැඩමුළුවකට, ආචාර්ය ගිරාගම මහතා සහභාගි විය.

* "ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ ගොවීන් සඳහා ක්‍ෂුද්‍ර වාරික්‍රම හඳුන්වාදීම - අනාගතය සඳහා පාඩම්" යන හිසින්, එම්.එම්.එම්. අහියර් මහතා විසින් සපයන ලද ලිපියක්, ආර්.ආර්.ද. සිල්වා මහතා විසින් සංස්කරණය කරන ලද " ශ්‍රී ලංකාවේ ජල සම්පත් පර්යේෂණ" යන පොතට ඇතුළත් විය. එම පොතෙහි පළවන්නේ ජල වෘත්තිකයන්ගේ දිනය නිමිත්තෙන් 2004 ඔක් 01 දින පේරාදෙණියේ කෘෂිකර්ම පශ්චාද් උපාධි ආයතනයේ දී පවත්වන ලද සම්මන්ත්‍රණයක කාර්ය වාර්තාවය.

* "ක්‍ෂුද්‍ර වාරි ක්‍රම භාවිතය" යන හිසින් යුත් ලිපියක් අහියර් මහතා විසින් ලංකාදීප දිනපතා පුවත්පතෙහි පළකරන ලදී.

* " ශ්‍රී ලංකාවේ කුඩා වැව් ආශ්‍රිත ජනාවාස" යන තේමාව යටතේ 2004 අගෝ. 21 දින හෙ.කො.ගො.ප.පු. ආයතනයේ දී පවත්වන ලද සම්මන්ත්‍රණයේ කාර්ය වාර්තාව අහියර් මහතා විසින් සංස්කරණය කරන ලදී.

* 2004 ජූලි 23 දින හෙ.කො.ගො.ප.පු. ආයතනයේ පවත්වන ලද " ආහාර අනාරක්‍ෂිතභාවය සහ අනතුරට නිරාවරණය වීම පිළිබඳ තොරතුරු සහ අනුරූපන පද්ධතිය" යන හිසින් යුත් සම්මන්ත්‍රණය එච්.එම්.ජේ.කේ. හේරත් මහතා සහ ඩබ්.වික්‍රමසිංහ මහත්මිය විසින් සම්බන්ධීකරණය කරන ලදී.

# අලෙවිය, ආහාර ප්‍රතිපත්තිය සහ කෘෂි ව්‍යාපාර අංශය

කාර්ය මණ්ඩලය :

| | | |
|---|---|---|
| සී.පී. හතුරුසිංහ මහත්මිය | - | අංශ ප්‍රධාන |
| ආචාර්ය ඩී. ගමගේ මහතා | - | අධි පර්යේෂක |
| ටී. රවිචන්ද්‍රන් මහතා | - | සහාය අධි පර්යේෂණ |
| ඩබ්.ඩී. වික්‍රමසිංහ මහත්මිය | - | පර්යේෂණ නිලධාරී |
| රෝෂිණී රඹුක්වැල්ල මෙනවිය | - | පර්යේෂණ නිලධාරිණී |
| රුවිනී විදනපතිරණ මෙනවිය | - | පර්යේෂණ නිලධාරිණී |
| එල්.පී. රූපසේන මහතා | - | අධි පර්යේෂක (අධ්‍යයන නිවාඩු ලබා ඇත) |

වෙළඳ, වාණිජ කටයුතු හා ආහාර අමාත්‍යාංශය විසින් මෙහෙයවන ලද, ජීවන වියදම් විමර්ශන කමිටුවට අලෙවි තොරතුරු ලබා දීම සඳහා, 1979 දී සම්මත වූ පාර්ලිමේන්තු පනතක් මගින් ගොවිකටයුතු පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානයෙහි, අලෙවි ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශය (මීට ප්‍රථමයෙන් අලෙවිය හා ආහාර ප්‍රතිපත්ති අංශය) පිහිටුවනු ලැබීය. පසුව ආහාර අංශයේ පුළුල් පැතිකඩ අවලෝකයට භාජන කිරීමත් සමඟ එම කමිටුව ජාතික ආහාර ආරක්ෂණ කමිටුව ලෙස නම් කරනු ලැබීය. මෙම කමිටුව ආහාර සහ අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ලදී. මෙම අංශය විසින් ඉහත සඳහන් කමිටු දෙකටම මිල සහ වෙනත් අදාළ දත්ත සපයන ලදී.

මෙයට අමතරව, රජයේ දෙපාර්තමේන්තු, ආරක්ෂක බලකාය සහ සතොසට ආහාර මිලදී ගැනීම ඇගයීමට තවත් කමිටුවක් ඇති කරන ලදී. එහි එක් සාමාජිකයකු මෙම අංශයෙන් තොරාගනු ලැබේ.

**අංශයේ සේවය කරන නිලධාරී පිරිස මෙසේය.**

| | | | |
|---|---|---|---|
| 1. | අධි පර්යේෂක | - | 01 |
| 2. | සහාය අධි පර්යේෂක | - | 01 |
| 3. | පර්යේෂණ නිලධාරීන් | - | 03 |
| 4. | සංඛ්‍යාන සහකාරවරු | - | 15 |
| 5. | අනියම් විමර්ශකයෝ | - | 18 |

**නිමකළ අධ්‍යයන**

**2004 වසර සඳහා ප්‍රගතිය**

* සතිපතා නිකුත් කරන ආහාර ද්‍රව්‍ය විවරණිකාව -වසර පුරාම නිකුත් කරන ලදී.
* අදාළ අධිකාරීන් වෙත සපයන ලද සතිපතා ආහාර මිල - වසර පුරාම
* මාසික ආහාර මිල විවරණිකාව ජුනි/ජූලි, අගෝස්තු, ඩබ්.ඩී. වික්‍රමසිංහ මහත්මිය විසින් සකස් කරන ලදි.
* මාධ්‍යවලට දිනපතා සහ සතිපතා තොරතුරු සපයන ලදී.
* පහත සඳහන් රාජ්‍ය සහ පෞද්ගලික නියෝජිතායතනවලට මිල පිළිබඳ දත්ත සහ වෙනත් වෙළඳපොළ තොරතුරු වසර පුරාම සපයන ලද අතර පෞද්ගලික අංශයට දත්ත සැපයුවේ නොමිලයේ නොවේ.

**රාජ්‍ය අංශයේ ආයතන**

1. ජනාධිපති ලේකම් කාර්යාලය
2. අග්‍රාමාත්‍ය කාර්යාලය

3. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
4. සමූපකාර අමාත්‍යාංශය
5. පාරිභෝගික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය
6. සමූපකාර තොග වෙළඳ සංස්ථාව
7. මුදල් අමාත්‍යාංශය
8. ශ්‍රී ලංකා මහ බැංකුව
9. ලංකා බැංකුව සහ මහජන බැංකුව
10. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව - ලක්හඬ, රුහුණු සේවය, රජරට සේවය සහ වෙනත් නාලිකා
11. පොල් සංවර්ධන අධිකාරිය
12. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
13. ධීවර දෙපාර්තමේන්තුව
14. බන්ධනාගාර දෙපාර්තමේන්තුව
15. ශ්‍රී ලංකා නාවුක හමුදාව
16. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
17. ශ්‍රී ලංකා ගුවන් හමුදාව

**පෞද්ගලික අංශයේ නියෝජිතායතන**

1. පෞද්ගලික ගුවන් විදුලි සේවා - සිරස, ඉසිර, තරු සහ හිරු එෆ් එම්.
2. පෞද්ගලික අංශයේ රූපවාහිනී නාලිකා - සිරස, එම්.ටී.වී. සහ ටීඑන්එල්
3. සෙලාන් බැංකුව
4. අලියා සිසිල් බීම සමාගම
5. පෞද්ලික සමාගම් සහ පුද්ගලයින්
6. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්

**නිත්‍ය වැඩසටහන්**

1. ආහාර තොරතුරු සහ වෙළඳපොළ තොරතුරු ව්‍යාපෘතිය.

**සම්බන්ධීකාරක** - සී.පී. හතුරුසිංහ මහත්මිය
**පර්යේෂණ කණ්ඩායම** - ටී. රවිචන්ද්‍රන් මහතා
රෝෂිණී රඹුක්වැල්ල මෙනෙවිය
රුචිනී විදනපතිරණ මෙනෙවිය
**ඇස්තමේන්තුගත අයවැය** - 3,669,833.33
**අරමුදල් සම්පාදනය** - මහා භාණ්ඩාගාරය

අලෙවිය, ආහාර ප්‍රතිපත්තිය සහ කෘෂි ව්‍යාපාර අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ ජාතික ආහාර ආරක්ෂණ කමිටුවට සහ කැබිනට් මණ්ඩලය විසින් ආහාර ලබා ගැනීම සඳහා පත්කරන ලද ටෙන්ඩර් මණ්ඩලයට නිවැරදි කාලීන වෙළඳපොළ තොරතුරු සම්පාදනය කිරීමයි. තෝරාගත් ආහාර වර්ග ගැන වෙළඳපොළ තොරතුරු සහ අදළ දත්ත ලබා ගැනීමට, කොළඹ සහ අවට උප නගරවල සිල්ලර වෙළඳපොල 9ක් ද (පිටකොටුව, තොටලඟ, දෙමටගොඩ, බොරැල්ල, වැල්ලවත්ත, කිරුලපනේ,නුගේගොඩ, කඩවත සහ කිරිබත්ගොඩ) පිටකොටුවේ තොග වෙළඳපොළ ද තෝරා ගන්නා ලදී. මීට අමතරව, ප්‍රමුඛ ගණනයේ ආහාර නිෂ්පාදන සහ ආහාර පරිභෝජන දිස්ත්‍රික්කවල පිහිටි වෙළඳපොළ 20 කින් දත්ත සහ තොරතුරු රැස් කරන ලදී. යථෝක්ත දත්ත සහ තොරතුර එකතු කිරිමට සංඛ්‍යාන සහායකවරැ 8 දෙනෙක් ද, අනියම් ගවේෂකයින් 5 දෙනෙක් ද යොදවන ලදී. කොළඹින් පිට ප්‍රදේශවල දත්ත රැස් කිරිමට සංඛ්‍යාන සහායකයින් 6 දෙනෙක් ද අනියම් ගවේෂකයින් 11 දෙනෙක් ද යොදවන ලදී.

පුහුණු කරන ලද ගවේෂකයින් රජයේ සේවයට බැඳීම සඳහා ඔක්තෝබර් මාසයේදී සේවයෙන් ඉල්ලා අස්වූහ. අනතුරුව, පූරප්පාඩු පිරවීමට උපාධිධාරීන් 23 දෙනෙක් නොවැම්බර් අවසාන සතියේදී බඳවා ගන්නා ලදී.

2004 වසරේ දී ආවරණය කරන ලද ස්ථාන මෙසේය. කුරුණෑගල, තිකවැරටිය, දඹුල්ල, මාතලේ, අනුරාධපුර, තඹුත්තේගම, පොළොන්නරුව, කළුතර, නුවරඑළිය, නුවර, හඟුරන්කෙත, බදුල්ල, බණ්ඩාරවෙල, හම්බන්තොට, මාතර, මොනරාගල, අම්පාර, මරදගහමුල සහ රත්නපුර. දෙසැම්බර් මාසයේ දී අමතර වශයෙන් තිස්සමහරාමය, ගාල්ල සහ ත්‍රිකුණාමලය ආවරණය කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ, ආහාර ද්‍රව්‍යවල මිල දිනපතා පිටකොටුව, නුවර, දඹුල්ල සහ මරදගහමුල වෙළඳපොලවලින් ලබා ගන්නා ලදී. ප්‍රධාන තොග වෙළඳපොළවල පවත්නා භාණ්ඩ මිල නිෂ්පාදකයන්ට සහ වෙළෙඳුන්ට කලට වේලාවට දැනගතහැකි වන අයුරින් මෙම දත්ත දිනපතා විද්‍යුත් මාධ්‍ය මගින් බෙදහරිනු ලැබීය. සතිපතා පළකරන ආහාර ද්‍රව්‍ය පිළිබඳ විවරණිකාවෙහි පලකිරීම සඳහා කොළඹ හා පිටපළාත්වල තොගමිල සහ සිල්ලර මිලද, පිට පළාත්වල නිෂ්පාදකයන් අයකරන මිල ද විශ්ලේෂණය කරනු ලැබීය. මෙම විවරණිකාව සිකුරාද දිනවල නිකුත් කරනු ලැබේ. මෙම දත්ත සහ තොරතුරු ප්‍රතිපත්ති සම්පාදකයින්ට කලට වේලාවට සපයන ලදී.

## 2. තෝරාගත් ජනප්‍රිය පලතුරු වර්ග නිෂ්පාදනය සහ අලෙවිය, (කෙසෙල්, අඹ, අන්නාසි, පැපොල් සහ පැෂන්ෆෘට්)

**සම්බන්ධීකාරක** : ටී. රවිචන්ද්‍රන් මහතා
**සහාය පර්යේෂක** : සී.පී. හතුරුසිංහ මහත්මිය
**ඇස්තමේන්තුගත අයවැය :** රු.248,000.00

කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් අරමුදල් සපයන ලදී.

පර්යේෂකයන් මෙම අධ්‍යයනය මගින් වෙළඳ නාලිකා හඳුනා ගැනීම, නිෂ්පාදන පිරිවැය සහ අලෙවි පිරිවැය ගණන් බැලීම, වෙළඳ පොලෙහි විවිධ සහභාගිකරුවන් මුහුණ දෙන ගැටළු සහ බාධක හඳුනාගැනීම සහ වත්මන් රජයේ ප්‍රතිපත්ති රාමුව සහ ආයතනික සැකැස්ම විස්තර කිරීම ආදිය අරමුණු කර ගන්නා ලදී. තවද, අපනයන වෙළඳපොළ විභවතා සමාලෝචනය කිරීම සහ අරමුණුවල සඳහන් ගැටළු විසඳීමට රජය, පෞද්ගලික අංශය සහ රාජ්‍ය නොවන සංවිධානවලට ඉටු කළ හැකි කාර්යභාරය හඳුනාගැනීම ද අපේක්ෂිතය.

අධ්‍යයනය අවසන් කර ඇත. නිෂ්පාදන සහ අලෙවි පිරිවැය (සම්පූර්ණ නිෂ්පාදන පිරිවැය, වාර්ෂික නිෂ්පාදන පිරිවැය, කිලෝග්‍රෑමයකට හෝ එක ගෙඩියකට නිෂ්පාදන වියදම, ක්‍රියාවකට හෝ අයිතමයකට අදාළව පිරිවැය ව්‍යුහය) ඇස්තමේන්තු කරන ලදී. තෝරාගත් සෑම පලතුරු වර්ගයකම නිෂ්පාදන පිරිවැයෙන් විශාලතම කොටස වැය වී තිබුනේ ශ්‍රමයට සහ පොහොරවලටය. අලෙවි නාලිකා හඳුනාගන්නා ලදී. දශකයකට පෙර කොළඹ මැනිං වෙළඳපොළෙහි කොමිස් ලබන ඒජන්තවරු කෙසෙල්, අන්නාසි, පැපොල් සහ අඹ අලෙවියෙහි වැදගත් කාර්යභාරයක් ඉටු කළහ. පිටින් පැමිණෙන තොග වෙළන්දන් සෘජුවම නිෂ්පාදන ප්‍රදේශවලට ගොස් ගොවීන්ගෙන්, එකතුකරන්නන්ගෙන් පලතුරු මිලට ගෙන තම ප්‍රදේශවල සිල්ලර වෙළෙන්දන්ට සැපයීම දනට මතුවන නැඹුරුතාවයකි. එසේ වුවද, තවමත් කොළඹ මැනිං වෙළඳපොළෙහි කොමිස් ලබන ඒජන්තවරු අඹ අලෙවියෙහි ප්‍රධාන කාර්යභාරය ඉටු කරති.

ගොවීන් වාර්තා කළ ප්‍රධාන ගැටළු නම්, නිෂ්පාදන මිලෙහි ඉහළ උච්ඡාවචනය, අවුරුද්දේ වැඩි කොටසක පවතින අඩු නිෂ්පාදක මිල, පොහොරවල අධික මිල සහ සිටුවන ද්‍රව්‍ය හිගවීමයි.

අපනයන කරුවන් මුහුණ පාන ගැටළු හැටියට, ඔවුන් ඉදිරිපත් කළ කරුණු මෙසේය. අධික ලෙස මිල උච්ඡාවචනය වීම, අස්ථාවර සැපයුම, හොඳ ගුණාත්මකභාවයක් ඇති පලතුරු නිෂ්පාදන හිගවීම, හොඳ පසු අස්වනු පරිහරණයක් නොමැති වීම, ගුවනින් යැවීමේ ගාස්තු අධිකවීම, ගුවන් යාත්‍රාවල භාණ්ඩ යැවීමට අවශ්‍යතරම් ඉඩ නොමැති වීම, අපනයන වෙළඳපොළ තොරතුරු පද්ධති හිගවීම, වෙළඳ සබඳතා ඇතිකරණ සේවා හිඟවීම සහ ඇසුරුම් ද්‍රව්‍ය හිඟවීම. පිරිසැකසුමෙහි

නියුතු වූවන් දක්වූ ගැටළු මෙසේය: ඉහළ මිල උච්ඡාවචනය, අස්ථාවර සැපයුම, විදුලි බලය, ජලය සහ සීනි වැනි යෙදවුම්වල මිල වැඩිවෙමින් පැවතීම, ඇසුරුම් ද්‍රව්‍ය හිඟ වීම, අන්තර්ජාතික පිළිගැනීමක් ඇති ප්‍රමිති සහිතව නිෂ්පාදනය කිරීම සඳහා වැඩි වියදමක් දරන්නට සිදු වීම, පරීක්ෂා කිරීමේ සහ සහතික ප්‍රදානය කිරීමේ සේවා හිඟවීම සහ දේශීය වෙළඳපොලෙහි ආනයනික භාණ්ඩ සමඟ තරඟ කරන්නට සිදුවීම. පලතුරු පිටරට යැවීමේ විභව්‍යතා සහ අන්තර් ජාතික වෙළඳපොළට ප්‍රධාන වශයෙන් පලතුරු සපයන්නන් ගැන ද සාකච්ඡා කරන ලදී. පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රධාන වශයෙන්ම ඉටුකරනු ලබන්නේ රජයේ ආයතන විසිනි. මෙම සේවා වැඩි වශයෙන් සැපයුමට නැඹුරු වී ඇති අතර, පලතුරු අංශයේ ප්‍රධාන වෙළඳපොළ සහභාගීකරුවන්ගේ සත්‍ය අවශ්‍යතාවලට සරිලන පරිදි සකස් නොවේ.

එබැවින් නිෂ්පාදනය, ඵලදාව, පසු අස්වනු තාක්ෂණය, පිරිසැකසුම සහ අපනයනය දියුණු කිරීම වෙත වැඩි අවධානයකින් යුක්තව, නිෂ්පාදනය සහ අලෙවිය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීම අතිශයින්ම වැදගත් ය. පර්යේෂණ සහ ව්‍යාප්ති සේවා, ඉල්ලුම විසින් මෙහෙයවනු ලැබිය යුතුය.

## 3. කෘෂිකර්ම සංවර්ධන උපාය මාර්ග තුළ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මැදිහත්වීම

**සම්බන්ධීකාරක** : වී. රවිචන්ද්‍රන් මහතා
**ඇස්තමේන්තුගත පිරිවැය:** රු.334,100.00
**කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව අරමුදල් සපයයි.**

කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි පෞද්ගලික අංශයේ ආයෝජන රටා සමාලෝචනය කිරීම, එම ක්ෂේත්‍රයෙහි පෞද්ගලික අංශයේ සහභාගිත්වය කෙරෙහි විවිධ රාජ්‍ය ප්‍රතිපත්ති සහ ආයතනික සැකැස්ම බලපාන ආකාරය අධ්‍යයනය කිරීම, එම ක්ෂේත්‍රයෙහි මැදිහත්වීමේදී පෞද්ගලික අංශයට මුහුණ දීමට සිදුවන බාධක සහ ගැටළු නිර්ණය කිරීම, කෘෂිකර්ම අංශයෙහි පෞද්ගලික අංශයේ මැදිහත්වීම වර්ධනය කළ හැකි ක්‍රම හා එහි නිර්ණය කිරීම සහ මෙම ගවේෂණවලින් සොයාගත් කරුණු පදනම් කරගෙන කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි පෞද්ගලික අංශයේ මැදිහත් වීම වැඩි කිරීමට යෝග්‍ය ප්‍රතිපත්ති නිර්දේශ කිරීම, මෙම පර්යේෂණය මෙහෙයවූවන්ගේ අරමුණ විය.

කෘෂි භාණ්ඩ රාශියක් නිපදවීම වර්ධනයකින් තොරව පැවතීම හෝ පිරිහීම හේතු කොට ගෙන, දේශීය කෘෂිකර්ම අංශයට අභියෝග රැසකට මුහුණපෑමට සිදු වී ඇත. බොහෝ කෘෂිකාර්මික භාණ්ඩවලට අධික නිෂ්පාදන වියදම නිසා ආනයනික භාණ්ඩ සමඟ තරඟ කිරීම අපහසුය. එසේත් නැත්නම් පිටරට වෙළඳපොළට ඇතුල්වීම අපහසුය. තවද, කෘෂි භාණ්ඩ රාශියක්ම ගුණාත්මක භාවය අතින් විදේශ වෙළඳපොළෙහි අවශ්‍යතාවලට අනුකූල නැත. ඒ හැරුනවිට, කෘෂිකර්මය පාදක කරගත් කර්මාන්ත හොඳින් දියුණු වී නැත. මෙම හේතු නිසා, තාක්ෂණික නව්‍යතා ද, පෙර හා පසු අස්වනු කළමනාකරණ දියුණුව ද, කෘෂි - කර්මාන්ත දියුණුව සඳහා ආයෝජනය ද, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ දැඩි අවශ්‍යතා බවට පත්ව ඇත. මෙය රාජ්‍ය අංශයට පමණක් ඉටු කළ නොහැක. එබැවින් කෘෂිකර්ම ක්ෂේත්‍රය වෙත පෞද්ගලික අංශයේ ආයෝජනය ආකර්ශනය කර ගත යුතුව ඇත. පෞද්ගලික අංශයේ මැදිහත්වීම හේතු කොට ගෙන, වඩා යහපත් කළමනාකරණය, ආයෝජනය සහ තාක්ෂණ නව්‍යතා අනුගමනය කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි වැඩි දියුණු වනු ඇත. කෙසේ වුවද කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි පෞද්ගලික අංශයේ වත්මන් මැදිහත්වීම පහත මට්ටමක පවතී. එබැවින් කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි පෞද්ගලික අංශයේ මැදිහත්වීමට අවහිර කරන සාධක පිරික්සීමට ද මෙම අංශය තුළ පෞද්ගලික අශයේ මැදිහත්වීම ප්‍රවර්ධනය කිරීමට සුදුසු මාර්ග හඳුනාගැනීමට ද අධ්‍යයනය ආරම්භ කරන ලදී. අධ්‍යයනය අවසන් කර ඇත.

පෞද්ගලික අංශයට කෘෂිකර්ම අංශය තුළ ගැටළු සහ බාධක රාශියකට මුහුණ පෑමට සිදුව ඇත. රජයේ ප්‍රතිපත්ති ද රාජ්‍ය ආයතන සහ ඒවා විසින් සපයනු ලබන සේවා සඳහා දිරිගැන්වීම් ද, දුර්වල තාක්ෂණ සහ භෞතික යටිතල පහසුකම් ද, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ අසතුටුදායක ඵලදායිතා/කාර්යක්ෂමතා මට්ටම්ද, වෙනත් ගැටළු ද(උදා. විශාල පරිමාණ වගාවට අවශ්‍ය ඉඩම්

හිඟවීම) පෞද්ගලික අංශයට මුහුණපෑමට ඇති ගැටළුවලට පාදක වේ. පෞද්ගලික අංශයට ස්වයම් සිද්ධ ජවයක් ඇතත්, කෘෂි අංශයෙහි ආයෝජනය ප්‍රවර්ධනය කිරීමට අනුබල දෙන පරිසරයක් එයට අවශ්‍ය වේ. කෘෂි අංශයෙහි පෞද්ගලික අංශයේ සහභාගිත්වය දියුණු කිරීමට අවශ්‍ය නිර්දේශ රැසක් අධ්‍යයනය මඟින් ඉදිරිපත් කර ඇත.

**4. රුහුණු නිම්න තුළ දිළිඳුකම, ආහාර අනාරක්ෂිතභාවය සහ අනතුරට නිරාවරණය වීම පිළිබඳ අවකාශමය සහ කාලික ගතිකයන්,**

**පර්යේෂණ කණ්ඩායම**

ආචාර්ය ඩී.ගමගේ මහතා (සම්බන්ධීකාරක)
ආචාර්ය ඩබ්.ජී. ජයසේන මහතා
ආචාර්ය ඩබ්.එම්.ජී.බී. ගිරාගම මහතා
එච්.එම්.ජේ.කේ. හේරත් මහතා

**අධ්‍යයනයේ අරමුණු**

අන්තර් ජාතික ජල කළමනාකරණ ආයතනය සමඟ හෙ.කො.ගො.ප.පු. ආයතනය විසින් අධ්‍යයනය සිදු කර නිමකරන ලදී. රුහුණු ගංගා නිම්නයේ සමාජ ආර්ථික තත්ත්වය සංගෘහිත කිරීම අධ්‍යයනයේ සාමාන්‍ය අරමුණ විය. අධ්‍යයනයෙහි විශේෂිත අරමුණු දෙකක් විය.

* පවත්නා ඉඩම් පරිහරණ ක්‍රියාකාරකම් සහ කෘෂිකර්මයෙන් ලැබෙන ආදයම සංගෘහිත කිරීම සහ විශ්ලේෂණය.

* සම්පත් භාවිතය සහ ජීවන තත්ත්වය පිළිබඳ වෙනස්වීම් ඇස්තමේන්තු කිරීමට සුදුසු පාදක රේඛාවක් ලෙස, සොයා ගැනීම් භාවිතා කළ හැකි පරිදි, තොරතුරු ගොනු කිරීම

**පර්යේෂණ අධ්‍යයනයේ වැදගත් සොයා ගැනීම්**

දකුණු හා ඌව පළාත්වල පිහිටා ඇති රුහුණු ගංගා නිම්නවලට ගංගා තුනක නිම්න ඇතුළත් වේ. එම ගංගා නම් කිරිඳි ඔය, වලවේ සහ මැණික් ගඟ වේ. මෙම ගංගා පද්ධතිය කෘෂිකර්මයට දයක වන අතරම භූගත ජලය පෝෂණය කරන බැවින් ප්‍රදේශයේ ජීවනෝපායට ප්‍රධාන වශයෙන් මූලාශ්‍ර වේ. මෙම රුහුණු ගංගා නිම්නවල ඉඩම් පරිහරණය කරන ජනගහනය ප්‍රධාන වශයෙන් දිවයිනේ ජනගහනයේ 10% ක් පමණ වාසය කරන මානව ජනාවාසවලින් සමන්විතය.

මානව සම්පත් සහ ජීවන තත්ත්වයේ ගුණාත්මක භාවය සංවර්ධනය කිරීම සහ දිළිඳුකම අවම කිරීමට දයකවන වැදගත් සාධකයක් ලෙස 'අධ්‍යාපනය' වැඩි වැඩියෙන් පිළිගැනීමට පාත්‍රවන නමුදු, නියැදි ජනගහනයෙන් සැහෙන් කොටසක් (28%) වසර 1-5 දක්වා අධ්‍යාපනයක් ලබා ඇති අතර 6% ක් පාසල් අධ්‍යාපනයක් ලබා නැත. පාසල් හැරගිය ළමයින් අතුරෙන් බොහෝ දෙනෙක් පාසල හැරගොස් ඇත්තේ මූල්‍ය දුෂ්කරතා, පවුලේ වගකීම්, දෙමව්පියන් උනන්දුවක් නොදක්වීම සහ රැකියාව සඳහා පාසලෙන් ඉවත්වීමට සිදුවීම යන කරුණු නිසාය.

ගෘහස්ථයින් 91%ක්ම තම නිවාසවල හිමිකම ලබා සිටියහ. නමුත් ඒවායින් 30% ක්ම සම්මතයට වඩා පහත් මට්ටමක පැවතුණි. බයිසිකලයක් අයත් වූ ගෘහස්ථ 50% ක්ද මෝටර් බයිසිකලයක් අයිති ගෘහස්ථ සියයට 10-15 ක්ද තිබුණි. ගංගා නිම්න තුනෙහිම කාර්, වෑන් ලොරි වැනි ප්‍රවාහන පහසුකම් හිමි අය සුළු පිරිසක් සිටියහ. කිරිඳිඔය නිම්නයේ ගෘහස්ථ අඩක් පමණ පොදු ජල නලවලින් ජලය ලබා ගත් අතර, මැණික් ගඟ නිම්නයේ එම පහසුකම් ලත් ගෘහස්ථ සංඛ්‍යාව 3/4 ක් පමණ විය. එසේ වුවද රුහුණු ගංගා නිම්නවල ගෘහස්ථවලින් අති බහුතරයක් ළිං වලින් හෝ නළ ළිං වලින් බීමට ජලය ලබාගත්හ. ආරක්ෂිත නොවන මූලාශ්‍රවලින් බීමට ජලය ලබා

ගැනීම වාර්ෂිකව අඩු වීමෙන් කිසියම් දියුණුවක් ලබන බව පෙන්නුම් කරයි. එසේ වුවද නියං කාලය තුළ ජලය ලබා ගැනීමට ගමන් කිරීමට සිදු වූ දුර සාමාන්‍යය කි.මී.1.01 කි. ගෘහස්ථ 3/4 ට වැඩි සංඛ්‍යාවක තිබුණේ වල සහිත වැසිකිළිය. 18% සිට 32% දක්වා ගෘහස්ථ සංඛ්‍යාවක විදුලිබලය නොතිබුනි. මැණික් ගඟ නිම්නයේ ගෘහස්ථ 45% කට පමණ සහ වලවේ ගඟ නිම්නයේ ගෘහස්ථ 21% කට පමණ දුරකථන පහසුකම් තිබුණි.

මෝටර් රථයක් ගමන් කළ හැකි පාරකට හෝ බස් නැවතුම්පොළකට හෝ කුලී රථ නැවතුම්පළකට ළඟාවීමට බොහෝ ප්‍රජාවනට බොහෝ දුර ගමන් කරන්නට සිදුවන බව පෙනුණි. මෙම හේතුව නිසා බොහෝ ගම් වැසියනට මෝටර් රථ නොවන වාහන භාවිතයට ගැනීමෙන් හෝ බොහෝ දුර පයින් ගමන් කිරීමෙන් පසු පොදු ප්‍රවාහන සේවාවන් වෙත ළඟාවීමට සිදු විය. ගමනාගමනය සඳහා පාරවල් හිඟවීම දක්නට ලැබෙන මුත්, සාමාන්‍ය වශයෙන් පාසල් සිසුවකුට ග්‍රාමීය පාසැලට යාමට කි.මී. 5ක් පමණ ගමන් කළ යුතු විය. එසේ නැතහොත් නගරයක පිහිටි වඩා හොඳ පාසලකට යාමට කි.මී.12ක් ගමන් කළ යුතු විය. සාමාන්‍ය වශයෙන් ගත් කල, නියැදි ගෘහස්ථ සාමාජිකයින්ට, ආසන්නතම සිල්ලර වෙළඳසලට කි.මී. 4ක්ද, ගමේ පොළට කි.මී. 22ක්ද, නගරයට කි.මී.12 ක්ද ගමන් කිරීමට සිදු වී ඇත. එමෙන්ම, සාමාන්‍ය වශයෙන් රුහුණු ගංගා නිම්නවල ගෘහස්ථයනට වෛද්‍යවරයකු මුන ගැසීමට කි.මී. 18 ක්ද, ග්‍රාමීය රොහලට කි.මී.31 ක්ද, මූලික රෝහලට කි.මී.30ක් ද ගමන් කිරීමට සිදුව ඇත.

සෑම ගංගා නිම්නයකම වගා කරන ලද බිම් කැබලි සාපේක්ෂ වශයෙන් කුඩා විය. ඒවා ප්‍රමාණය අතින් අක්කර 1.9 සිට 2.3 දක්වා විය. ගෘහස්ථ අතුරෙන් සුවිශේෂ ප්‍රමාණයක් (38%ක් පමණ) ගෙවත්ත, එසේත් නැත්නම් මඩ හෝ ගොඩ ඉඩම් හැටියට සැලකිය හැකි එක ඉඩම් කැබැල්ලක් පමණක් වගාකරන බව විශ්ලේෂණයෙන් හෙළි විය. සමහර ඉඩම්, විශේෂයෙන්ම කුඹුරු ඉඩම් වගා කිරීමට ලබාගෙන ඇත්තේ බදු ගැනීම, කට්ටිමාරු හෝ තට්ටුමාරු ක්‍රමය වැනි විවිධ ඉඩම් භුක්ති ක්‍රම මඟිනි. වලවේ ගඟ, කිරිදි ඔය සහ මැණික් ගඟ යන ගංගා ආශ්‍රිත නිම්නවල ඉසින යන්ත්‍ර හිමි සංඛ්‍යාව පිළිවෙලින් 14,16 සහ 19 විය.

ගංගා නිම්න තුනෙහිම ගෘහස්ථයන්හි සාමාන්‍ය මාසික ආදයම රු.7,700 සිට රු.8,300 දක්වා විය. මාසකට රු.3000ට අඩු ආදායමක් ලබන ගෘහස්ථ සංඛ්‍යාව වලවේ ගඟ නිම්නයෙහි 26% කි. කිරිදි ඔය නිම්නයෙහි 22 කි, මැණික් ගඟ නිම්නයෙහි 17% කි. මෙම ගෘහස්ථ දිළිඳු හැටියට සැලකිය හැක. ගෘහස්ථ ආදයමට කෘෂිකර්මයෙන් ලැබුණ දයකත්වය, වලවේ ගඟ නිම්නයෙහි 33% ක්ද, කිරිදිඔය නිම්නයෙහි 17%ක්ද විය. කෘෂිකර්ම නොවන ආදයම් මාර්ග අතර, කුලී වැඩ, කම්කරුවන් හැටියට රැකියාව කිරීම සහ ස්වයං රැකියා නිම්න තුනෙහිම විශේෂයෙන් වැදගත් විය.

තව දුරටත් විභේදනය කිරීමේ දී ගෘහස්ථ ආදයමෙන් 10% සිට 17% දක්වා ප්‍රමාණක් කුලී වැඩවලින් ද, 23% සිට 32% දක්වා ප්‍රමාණයක් වැටුප් ලබන රැකියාවලින් ද, 15%සිට 23% දක්වා ප්‍රමාණයක් ස්වයං රැකියාවලින්ද උපයන බව පෙනී ගියේය.

## ප්‍රතිපත්ති සම්පදනයෙහිලා ඇති වැදගත්කම සහ නිර්දේශ

මෙම අධ්‍යයනය මඟින් සොයාගත් කරුණු ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වැදගත් වේ. එක් වැදගත් ඇඟවීමක් නම් කෘෂිකර්මයෙන් බැහැර වන ශ්‍රම අතිරික්තය උකහා ගැනීමට ග්‍රාමීය ආර්ථිකය විවිධාංගකරණය කිරීමෙහි අවශ්‍යතාවයයි. මෙම විවිධාංගකරණයට කෘෂිකර්ම විවිධාංගකරණය ද ඇතුළත්ය. තවත් ප්‍රධාන ක්ෂේත්‍රයක් නම් ග්‍රාමීය කාර්මීකරණයයි. මෙම නිර්දේශ අධ්‍යයනයෙන් සොයාගත් පහත සඳහන් කරුණු මත පදනම් වේ.

* ගෘහස්ථ ආදයමෙන් ඉතා කුඩා අනුපාතයක් පමණක් කෘෂිකර්මයෙන් ලැබේ. මෙයට ප්‍රධාන හේතුව වන්නේ වගාකරනු ලබන ඉඩම් කට්ටිවල ප්‍රමාණය ආර්ථික වශයෙන් ඵලදයී නොවීම

සහ ඉඩම් භුක්තිය පිළිබඳ ගැටළුවයි. වත්මන් ඉඩම් භුක්තිය පිළිබඳ තත්වයට හේතුව ජනගහන වර්ධනය පමණක් නොව මෙරට වෙනත් ප්‍රදේශවලින් ද ජනයා සංක්‍රමනය වීමයි. රුහුණු ගංගා නිම්නවල ගෘහස්ථ 37% කම, දිවයිනේ වෙනත් ප්‍රදේශවලින් සංක්‍රමනය වූ අය වාසය කරන බව අධ්‍යයනයෙන් හෙළි විය. මෙම සංක්‍රමනය වියළි කලාපයේ ජනාවාස ඇති කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය නිසා අර්ධ වශයෙන් අනුබල ලබයි. ගොවීන් ආර්ථික නොවන ඉඩම් කැබලි වගාකිරීම ඉතා අධික වීම සහ ඉඩම් ලබා ගැනීමට සංකීර්ණ ඉඩම් භුක්ති සබඳතා යොදගැනීම බොහෝ දුරට ජනගහන වර්ධනය නිසා සිදු වී ඇත. රුහුණු ගංගා නිම්නවල පවත්නා ජනගහන වර්ධනය සහ ඉඩම් භුක්තිය යන සාධක දෙක ශ්‍රී ලංකා ගංගා නිම්න වල ඉඩම් සහ ජලය වැනි ස්වාභාවික සම්පත් වෙත අඛණ්ඩව බලවත් පීඩනයක් එල්ල කරන බව පෙන්නුම් කරයි.

* අදයම අනුව බලන කළ රුහුණු ගංගා නිම්නවල දුප්පත්කම ඉතා සුවිශේෂ වශයෙන් දක්නට ලැබෙන බව කිව හැක. නිවාසවල තත්ත්වය වැනි නියෝජනය සඳහා යොදගතහැකි වෙනත් සාධක උපයෝගී කර ගෙන මෙම කාරණය සනාථ කළ හැක. ස්වාභවික සම්පත් වෙත එල්ල වී ඇති පීඩනය, කාර්මික සහ සේවා අංශ නොමැති වීම සහ ග්‍රාමීය ප්‍රදේශවල පුළුල්ව පැතිර පවත්නා දිළිඳුකමට සම්බන්ධ කළහැකිය.

* ගෘස්ථයන්හි දක්නට ලැබෙන ප්‍රධාන ලක්‍ෂණයක් නම් කෘෂිකර්මය නොවන ආදයම් මාර්ග මත බෙහෙවින් රඳ පැවතීමයි. ආදයම් මාර්ග සහ කෘෂිකර්මයෙන් නොලැබෙන අදයමෙහි ප්‍රතිශතය පිළිබඳ දත්ත, ගොවිකම අර්ධකාලීන වශයෙන් නිරතවන රැකියාවක් බව පැහැදිලි කරයි.

අධ්‍යයනයෙන් ලැබෙන දෙවන වැදගත් ඇඟවීම නම් ග්‍රාමීය භෞතික සහ සාමාජික යටිතල පහසුකම් වර්ධනය කිරීමේ අවශ්‍යතාවයයි. ආර්ථික සංවර්ධනය උදෙසා මාර්ග සහ ප්‍රවාහන යටිතල සංවර්ධනයට විශේෂ අවධානය යොමු විය යුතුය. බොහෝ ගෘහස්ථ, මෝටර්රථ ධාවනය කළ හැකි මාර්ග, බස් නැවතුම්පොළ, බස් ගාල, පාසල් සහ සෞඛ්‍ය පහසුකම් ආදියට බොහෝ ඈතින් පිහිටා ඇත. මෙම සාධක දුප්පත්කම දක්වන සාධක හැටියට පමණක් නොව දුප්පත්කමට හේතු හැටියටද දැක්විය හැක.

**වෙනත් කටයුතු**

සී.පී. හතුරුසිංහ මහත්මිය

1. ආහාර සුරක්ෂිත භාවය පිළිබඳ අන්තර් අමාත්‍යාංශ කමිටුවට සහභාගි වූවාය.
2. ආහාර භෝග ගැන දත්ත හා තොරතුරු ආහාර ආරක්‍ෂණ කමිටුවට සපයන ලදී.
3. සමුපකාර අමාත්‍යාංශය සහ ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ පැවති ආහාර මිලදී ගැනීමේ කමිටුවේ රැස්වීම්වලට සහභාගි වූවාය.
4. වී/සහල් ආරක්‍ෂක තොග වැඩ සටහනට ක්‍රියාකාරී ලෙස සහභාගි වූවාය. කෘෂිකර්ම, පශුසම්පත් ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට තොරතුරු සැපයීම ද දත්ත විශ්ලේෂණය කිරීම ද ඉටු විය.

ටී. රවිචන්ද්‍රන් මහතා
සභරා සහ වෙනත් ප්‍රකාශනවලට ලිපි සැපයීම

'කෙසෙල්, පැපොල්, අන්නාසි සහ අඹ - ගෝලීය මට්ටමේ නිෂ්පාදනය සහ ආනයන/අපනයන තත්ත්වය' කමලනම් සහරාව, 2004 සැප්තැම්බර් - දෙසැම්බර් කලාපය

ඩබ්. වික්‍රමසිංහ මහත්මිය

ක්‍රියාකාරකම 1: ආහාර තොරතුරු විවරණිකාව

ප්‍රතිපත්ති සම්පාදකයින්, සැලසුම්කරුවන් සහ අන්තර් ජාතික නියෝජිතායතනවල දැනගැනීම සඳහා දිස්ත්‍රික් මට්ටමෙන් ප්‍රධාන ආහාර ද්‍රව්‍ය තත්ත්වය සහ අලෙවි තත්ත්වය ආවරණය කරන අයුරින්, ආහාර තොරතුරු විවරණිකාව වාර ප්‍රකාශනයක් ලෙස නැවත නිකුත් කිරීම ආරම්භ විය.

ක්‍රියාකාරකම 2 : ආහාර අනාරක්ෂිතභාවය සහ අනතුරට නිරාවරණය වීම පිළිබඳ තොරතුරු සහ අනුරූපන පද්ධතිය.

ආහාර සහ කෘෂිකර්ම සංවිධානය විසින් අරමුදල් සපයනු ලබන මෙම ව්‍යාපෘතිය පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමට අමාත්‍යාංශ රාශියක කටයුතු සම්බන්ධීකරණය කරයි.

අ. ජාතික, කලාපීය, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී මට්ටමෙන් අඛණ්ඩව,නිවැරදිව, ආහාර අනාරක්ෂිතභාවය විශ්ලේෂණය කළහැකි වන පරිදි තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම.

ආ. සෑම මට්ටමකම හා ස්ථානයකම ආහාර අනාරක්ෂිතභාවය හා අනතුරට නිරාවරණයවීම අඩු කිරීමට, ඵලදායී ලෙස ප්‍රතිපත්ති සහ උපාය මාර්ගික ක්‍රියාකාරී විකල්ප සකස් කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයන් සහ සැලසුම්කරුවන්ට සහය වීම.

ඇ. ව්‍යාපෘතිය මඟින් අනුරූපනය කර ඇති පරිදි අනතුරට නිරාවරණය වීම ගැන ඇස්තමේන්තු පිළිබඳ තොරතුරු බෙදා හැරීම.

මෙම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකාවේ යොමුගත ලක්ෂය හෙ.කො.ගො.ප.පු. ආයතනය වේ.

# සංඛ්‍යාලේඛන සහ දත්ත සැකසුම් අංශය

**කාර්ය මණ්ඩලය**

| | | |
|---|---|---|
| ආචාර්ය ඩී. තෙන්නකෝන් මහතා | - | අංශ ප්‍රධාන |
| එම්.ඩී.එල්. සෙනරත් මහතා | - | ජ්‍යෙෂ්ඨ විශ්ලේෂණ වැඩසටහන් සම්පාදක |
| කේ.ඩී.එස්. ආරියසිංහ මහතා | - | දත්ත විශ්ලේෂක |
| ඊ.එන්.ආර්. ප්‍රනාන්දු මහතා | - | දත්ත විශ්ලේෂක |
| එන්.එස්.ඩබ්. නවරත්න මහතා | - | සංඛ්‍යාන නිලධාරී |
| ජී.එච්. කරුණාරත්න මහතා | - | පුස්තකාලයාධිපති (අගෝස්තු අවසානය දක්වා) |
| ශ්‍රීමා කටුගම්පල මෙනවිය | - | වැඩබලන පුස්තකාලයාධිපති (සැප්තැම්බර් සිට) |
| කේ.වයි.පී. වීරරත්න මහත්මිය | - | සහකාර පුස්තකාලයාධිපති |

සංඛ්‍යාලේඛන සහ දත්ත සැකසුම් අංශය, ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම සංවර්ධන තොරතුරු පිළිබඳ ජාතික මධ්‍යස්ථානය හැටියට ක්‍රියාකරයි. එක්සත් ජනපද ආධාර (USAID) ඇතිව 1979 දී මධ්‍යස්ථානය ස්ථාපිත කරන ලදී. ජාතික කෘෂිකර්ම දියුණුව සඳහා කෘෂිකර්ම හා ගොවි කටයුතු ගැන තොරතුරු එකතු කිරීමේ සහ බෙදාහැරීමේ පුළුල් අරමුණ ඇතිව මෙම අංශය (මධ්‍යස්ථානය) සැලසුම් කරන ලදී. පර්යේෂකයන්, සැලසුම්කරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, උපාධි අපේක්ෂකයන්, ගොවීන් හා වෙනත් උනන්දු වන්නන් තොරතුරුවලින් ප්‍රයෝජන ලබන අය හැටියට සලකනු ලැබීය. මෙම අංශය ඒකක තුනකින් සමන්විතය. ඒවා නම්, දත්ත සංවර්ධන ඒකකය, පරිගනක ඒකකය සහ පුස්තකාලය දත්ත සංවර්ධන ඒකකය සහ පරිගනක ඒකකය එක් වී සංඛ්‍යාන තොරතුර එකතු කිරීම සහ පිරිසැකසුම සිදු කරයි. ග්‍රන්ථනාමාවලී තොරතුරු මධ්‍යස්ථානය හැටියට පුස්තකාලය සේවය කරයි.

## 1. දත්ත සංවර්ධන ඒකකය

**කාර්ය මණ්ඩලය**

| | |
|---|---|
| දත්ත විශ්ලේෂකයෝ | 2 |
| සංඛ්‍යාන නිලධාරී | 1 |
| දත්ත සහකාරවරු | 3 |
| ලේකම්/ලඝු ලේඛක ලිපිකරු | 1 |
| කාර්යාල කාර්ය සහායක | 1 |

දත්ත සංවර්ධන ඒකකයේ ප්‍රධාන කාර්ය වනුයේ තොරතුරු මධ්‍යස්ථානයේ දත්ත බැංකුව පවත්වාගෙන යාමයි. 2004 වසර පුරාම මෙම ඒකකයෙහි සම්පූර්ණ කාර්ය මණ්ඩලය වන, දත්ත විශ්ලේෂකයන් 2 සහ දත්ත සහකාරවරු 3 සේවයෙහි නිරත වූහ.

### දත්ත බැංකුව

ශ්‍රී ලංකාවේ ගොවි කටයුතු තත්ත්වය පිළිබඳ දත්ත එකතු කොට තැන්පත් කිරීම දත්ත බැංකුවේ සාමාන්‍ය චර්යාවයි. දත්ත බැංකුව වර්ධනය කිරීම දත්ත සංවර්ධන ඒකකයේත් පරිගනක ඒකකයේත් පොදු වගකීමකි. දත්ත සංවර්ධන ඒකකයේ කාර්යභාරය අංශ දෙකකින් යුක්තය. ඒවා නම්,

#### i) සංවර්ධන දර්ශක බැංකුව

දත්ත එකතුව සහ පිරිසැකසුම වසර පුරාම සිදුවිය. පරිගනක දත්ත බැංකුවට තෝරාගත් දර්ශක පරිගනක ඒකකයේ ගබඩා කරන ලදි. රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතනවලින් නිකුත් වන ද්විතීයික සහ තත්හව දර්ශක මෙහිදී දර්ශක යනුවෙන් හඳුන්වනු ලබයි.

## ii) ක්ෂේත්‍ර සමීක්ෂණ මගින් බිහිවන දත්ත පන්ති ලේඛනාගාරය

ආයතනය විසින් පවත්වනු ලබන ක්ෂේත්‍ර අධ්‍යයනවලින් කලාපීය පාදක දත්ත උකහා ගනු ලැබේ. වසර තුළ ආයතනය සිදු කළ පර්යේෂණවල දත්ත පරිඝනකවලින් පිරික්සන ලදුව, මධ්‍යස්ථානයේ පිහිටි දත්ත ලේඛනාගාරයට එකතු කරන ලදී. මීට අමතරව, අධ්‍යයනවලින් ලබාගත් දත්ත පංති, ප්‍රශ්නාවලී සහ වැඩ පත්‍රවල ඇතුළත්ය.

ද්විතීයික සහ ප්‍රාථමික මූලාශ්‍රවලින් දත්ත එකතු කොට ඒවා උපයෝගීකොට කෘෂි භෝග, පශු සම්පත්, ජනගහනය සහ ජීව සංඛ්‍යාති සඳහා දත්ත පදනමක් පවත්වා ගැනීම දත්ත බැංකුවේ කාර්ය භාරයයි. කෘෂි භෝග ආශ්‍රිත පහත සඳහන් දත්ත පන්ති 2004 වසර තුළ යාවත්කාලීන කරන ලදී.

1. වී වගාකරන භූමි ප්‍රමාණය, නිෂ්පාදනය සහ සාමාන්‍ය නිෂ්පාදනය.
2. වී හැර වෙනත් ධාන්‍යවර්ග, රනිල, අලවර්ග, තෙල් නිපදවන බීජ, කාර්මික භෝග, කුළුබඩු, එළවළු, පලතුරු, වැවිලි කර්මාන්ත භෝග සහ වෙනත් භෝග වවන භූමි ප්‍රමාණය සහ නිෂ්පාදනය.
3. පශු සම්පත් නිෂ්පාදන පිළිබඳ දත්ත
4. වී, සහල්, වෙනත් ධාන්‍යවර්ග, රනිල, අලවර්ග, කුළු බඩු, එළවලු, පලතුරු, වැවිලි භෝග, පශු සම්පත්, පශු සම්පත් නිෂ්පාදන සහ මාළුවල මිල සහ බාහිර වෙළඳ සංඛ්‍යාති.
5. ඉහත සඳහන් භෝගවල ඒක පුද්ගල පරිභෝජනය.
6. වී, වෙනත් භෝග, රනිල, අලවර්ග සහ තෙල් ලැබෙන බීජ ආදියෙහි නිෂ්පාදන පිරිවැය සහ ඒවායින් ලැබෙන ආදායම.
7. වී වගාව ආශ්‍රිත පෝර යෙදීම, කෘෂි රසායන භාවිතය, දියුණු කළ වර්ග වගාකරන වපසරිය සහ වගාක්‍රමය පිළිබඳ දත්ත.
8. කම්කරු සංඛ්‍යාති. (රැකියා නියුක්තිය පිළිබඳ දත්ත)
9. දේශගුණය පිළිබඳ දත්ත (වැසිපල සහ උෂ්නත්වය)
10. ආර්ථික දර්ශක. (දළ දේශිය නිෂ්පාදනය, ශුද්ධ දේශීය නිෂ්පාදනය, CC PI සහ විනිමය අනුපාත)
11. කෘෂිකර්මයෙහි නියුතු අයගේ සංඛ්‍යාව සහ වගා ඉඩම් හැටියට සැලකිය හැකි භූමි ප්‍රමාණය.

සමාලෝචනයට භාජනය වන වසර තුළ දත්ත වාර්තා 49,973 ක් එකතු කරන ලදුව, වාර්තා 2,188 ක් පරිඝනකයට ඇතුළත් කරන ලදී. තොරතුරු ලබාගත හැකි ද්විතීය මූලාශ්‍ර හැටියට පහත සඳහන් ප්‍රකාශන පරිශීලනය කරන ලදී.

1. කෘෂිකර්ම සංගණන - 2002. (ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)
2. ශ්‍රී ලංකා ශ්‍රම බලකාය පිළිබඳ සමීක්ෂණය - ත්‍රෛමාසික වාර්තා (ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව)
3. ගෘහස්ථ ආදයම හා වියදම පිළිබඳ සමීක්ෂණය - 1980/81, 1995/96 සහ 2002 - ජන ලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.
4. සංඛ්‍යාති සාර සංග්‍රහය - 2002 - ජන ලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.
5. ආර්ථික සහ සාමාජික සංඛ්‍යාති - 2003 - ජන ලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව.
6. කෘෂි බෝග වගා පිරිවැය - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.
7. වී ගොවිතැන පිළිබඳ සංඛ්‍යාති - 2002/03 මහ - 2004 මහ.
8. බාහිර වෙළඳ සංඛ්‍යාති - 2003 (තීරු බදු දෙපාර්තමේන්තුව)

**දත්ත සඳහා ඉල්ලීම්**

සමාලෝචිත වර්ෂය තුළ දත්ත බැංකුවෙන් දත්ත ඉල්ලීම සතුටුදයක අන්දමට සිදු විය. 2004 වසර තුළ බැංකුවට ලැබුණ සම්පූර්ණ ඉල්ලීම් ගණන 138කි. ආයතනය තුළ දත්ත භාවිතා කරනන්ගෙන් ඉල්ලීම් 32 ක් ලැබුණ අතර බාහිර ඉල්ලීම් ගණන 106කි. අභ්‍යන්තර ඉල්ලීම් අංශ අතර බෙදීගිය ආකාරය පහත දක්වේ.

| අංශය | සංඛ්‍යාව | % |
|---|---|---|
| කෘෂිකර්ම සහ පාරිසරික සම්පත් කළමනාකරණය | 6 | 18.7 |
| අලෙවිය, ආහාර ප්‍රතිපත්තිය සහ කෘෂි ව්‍යාපාර | 1 | 40.6 |
| කෘෂිකර්ම ප්‍රතිපත්තිය සහ ව්‍යාපෘති ඇගයීම | 7 | 21.9 |
| වාරි කර්මාන්තය, ජල කළමනාකරණය සහ ගොවි කටයුතු සබඳතා | 4 | 12.5 |
| වෙනත් | 2 | 6.2 |
| එකතුව | 32 | 100 |

**බාහිර ඉල්ලීම් පහත සඳහන් පරිදි වර්ග කළ හැක**

| වර්ගය | සංඛ්‍යාව | % |
|---|---|---|
| අමාත්‍යාංශ / රජයේ දෙපාර්තමේන්තු අර්ධ වශයෙන් රාජ්‍ය අංශයට අයත් සංවිධාන | 30 | 28.3 |
| පෞද්ගලික සමාගම් | 22 | 20.7 |
| විශ්ව විද්‍යාල ආචාර්ය මණ්ඩලය, පශ්චාත් උපාධි ශිෂ්‍යයන්, උපාධි අපේක්ෂකයන් | 28 | 26.4 |
| අන්තර් ජාතික සංවිධාන | 6 | 5.7 |
| රාජ්‍ය නොවන සංවිධාන | 4 | 3.7 |
| වෙනත් පර්යේෂණ ආයතන | 3 | 2.8 |
| මාධ්‍යවේදීන් | 2 | 1.9 |
| වෙනත් පුද්ගලයින් | 11 | 10.4 |
| එකතුව | 106 | 100 |

### දත්ත සැපයීමෙන් ලැබෙන ආදායම

බාහිර උපයෝගීතාවයන් සඳහා දත්ත සැපයීමෙන් 2004 වසරේදී ලද සම්පූර්ණ ආදයම රු.46,738.95 කි. බාහිර උපයෝගීතාවයන් සඳහා නොමිලේ සපයන ලද දත්ත වල ඇස්මේන්තුගත පිරිවැය රු.293.05 කි. ආයතනය තුළ විවිධ අංශ සඳහා සපයන ලද තොරතුරුවල ඇස්තමේන්තුගත පිරිවැය රු.13,151.94 කි.

## 2. පරිඝනක ඒකකය

### කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ විශ්ලේෂක වැඩසටහන් සම්පාදක | 1 |
| දත්ත පිවිසුම් ක්‍රියාකරු | 2 |
| අනියම් දත්ත පිවිසුම් ක්‍රියාකරු | 1 |

සංඛ්‍යාලේඛන සහ දත්ත සැකසුම් අංශයේ පරිඝනක ඒකකය දත්ත සැකසුම් සහ විශ්ලේෂණය සඳහා පහසුකම් සලසයි. මීට අමතරව දත්ත බැංකුව සඳහා දත්ත සංවර්ධනය පිළිබඳ වගකීම ද දරයි. මෙම ඒකකය කාර්යභාරයන් තුනක් ඉටු කරයි.

i දත්ත බැංකුව සඳහා දත්ත සැකසුම සහ දත්ත විශ්ලේෂණය
ii හෙ.කො.ගො.ප.පු. ආයතනය සිදු කරන අධ්‍යයනයන්ගේ දත්ත විශ්ලේෂණය.
iii පද්ධති සංවර්ධනය

### දත්ත විශ්ලේෂණය

මෘදුකාංග පහසුකම් යොද ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත සහ තොරතුරු විශ්ලේෂණය කරුනු ලැබේ. පහත සඳහන් අධ්‍යයනයන් වසර තුළ පරිඝනක ගත කරන ලදී.

| | | | |
|---|---|---|---|
| 1. | R 290/4 | - | තිරසර ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිය |
| 2. | R 299 | - | තෝරාගත් ජනප්‍රිය පලතුරු වර්ග නිෂ්පාදනය සහ අලෙවිය විශ්ලේෂණය කිරීම. |
| 3. | R 310 | - | කෘෂි භාණ්ඩ එකතු කිරීමේ සහ අලෙවි කිරීමේ මධ්‍යස්ථාන පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය. |
| 4. | R 301 | - | මාතලේ සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ලොකු ළූනු නිෂ්පාදනය සහ අලෙවිය. |
| 5. | R 302 | - | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය. |
| 6. | R 311 | - | ගැටුම් පවතින කලාපයට මායිම් වූ ගම්වල කෘෂි සංවර්ධනය ප්‍රකෘතිමත් කිරීමට සාම ක්‍රියාවලිය බලපාන ආකාරය. |
| 7. | R 300 | - | ශ්‍රී ලංකාවේ සමෘද්ධි සහ ක්ෂුද්‍ර ව්‍යවසායකයන් පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණයක්. |
| 8. | R 304 | - | ශ්‍රී ලංකාවේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල කාර්ය සාධනය පිළිබඳ ඇස්තමේන්තුවක්. |
| 9. | R 306 | - | මහවැලි H කලාපයේ 2 වන සහ 3 වන පරම්පරා සඳහා පවතින රැකියා ලබාගැනීමේ අවස්ථා පිළිබඳ වත්මන් තත්ත්වය සහ අනාගත බලාපොරොත්තු. |
| 10. | R 303 | - | පශු සම්පත් සේවා බෙදහැරීමේ ක්‍රියාවලියට පෞද්ගලික අංශයේ මැදිහත්වීම. |

## පරිඝනක ගත කළ දත්ත පදනම

පරිඝනක ගත දත්ත පදනම වනාහී ශ්‍රී ලංකාවේ 60ක් පමණ සංවිධාන විසින් එකතු කරනු ලබන කෘෂිකාර්මික සහ සමාජ ආර්ථික දත්ත පවත්වා ගැනීමට වර්ධනය කරන ලද මාර්ගගත ගබඩාකරණ සහ සමුද්ධරණ පද්ධතියකි. පරිඝනක ගත දත්ත බැංකුවට වාර්තා 2,188 ක් එකතු කරන ලදී. අභ්‍යන්තර හා බාහිර භාවිතකරුවන් විසින් ඉල්ලීම් 116ක් පමණ මෙම වසර තුළ පරිඝනක ඒකකයට ඉදිරිපත් කර ඇත. ප්‍රස්තාර සහ සම්මත වගු වශයෙන් දත්ත බැංකුව විසින් තොරතුරු ඉදිරිපත් කරන ලදී.

පරිඝනක ගත දත්ත සැකසුම් පද්ධති මගින් ආයතනයේ පර්යේෂණ අංශවලට පරිඝනක ඒකකය විසින් වෘත්තීය සේවාවන් සපයන ලදී. වෙනත් අංශවලට තම මෘදුකාංග සහ දෘඩාංග ගැටළු විසඳ දීමට පරිඝනක ඒකකය සහාය වේ. ආයතනයේ පඩි ලැයිස්තුව සහ දත්ත ආකෘති පරිඝනකගත කිරීමෙහි ලා පරිඝනක ඒකකය උපකාරී විය.

## 3. ව්‍යාපෘති ඒකකය

මෙරට කෘෂිකර්ම සහ ග්‍රාමීය සංවර්ධනය සඳහා, කෘෂි සම්පත් පදනම, උපකාරක සේවා යාන්ත්‍රණය සහ ආයතනික සංවර්ධනය පිළිබඳ ආනුභාවික අධ්‍යයන පදනම් කොටගත් දත්ත හා තොරතුරු ලබාගැනීමට, සමීක්ෂණ හා අධ්‍යයන සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට, 1990 වසරේදී, ව්‍යාපෘති ඒකකය නමින් වෙනම ඒකකයක් සංඛ්‍යාලේඛන සහ දත්ත සැකසුම් අංශය තුළ පිහිටුවන ලදී.

දැනට සිදුකරන අධ්‍යයන

1. මාතලේ දිස්ත්‍රික්කයේ කෘෂි බෙදාහැරීම පිළිබඳ ව්‍යවසාය සංවර්ධන සහායක ව්‍යාපෘතිය ග්‍රාමීය කෘෂි ව්‍යාපාරිකයන් සහ නියෝජිතයන් ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහන (2002 -2004).

### පර්යේෂණ කණ්ඩායම

1. ආචාර්ය ඩී. තෙන්නකෝන් මහතා (සම්බන්ධීකාරක)
2. ආර්.එල්.එන්. ජයතිස්ස මහතා
3. එන්.එස්. ඩබ්. නවරත්න මහතා

අනාගත බලාපොරොත්තු තැබිය හැකි නියෝජිතයන්ට ග්‍රාමීය මට්ටමේ කෘෂි ව්‍යාපාරිකයන් හා නියෝජිතයන් වීමට අවශ්‍ය ව්‍යවසායකත්ව කුසලතා ලබා දීමෙන්, කෘෂි යෙදවුම් බෙදාහැරීම සහ කෘෂි නිෂ්පාදන අලෙවිය ශක්තිමත් කිරීම වෙත මෙම ව්‍යාපෘතිය යොමුගත වී ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූයේ මාතලේ කලාපීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘතියේ අනුග්‍රහයෙනි.

යෝජිත ක්‍රියාදමය නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක විය. එහි ප්‍රගතිය අනුව දිස්ත්‍රික්කයේ වෙනත් ප්‍රදේශවලට ද එම ක්‍රියාදමය හඳුන්වා දීමට අපේක්ෂා කරන ලදී. වෙනත් රේඛීය නියෝජිත ආයතන සමඟ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අත්තිවාරම කලාපීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිය විසින් සකස් කර තිබුණි. ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කිරීම හෙ.කො.ගො.ප.පු. ආයතනයට පැවරීමට 2001 දී එකඟ විය. මෙම ව්‍යාපෘතිය 2002 - 2004 කාලයේ දී ක්‍රියාත්මක කරන ලදී.

### ව්‍යාපෘතියේ අරමුණු

ග්‍රාමීය මට්ටමෙහි ස්ථාපිත පුහුණු වෙළෙන්දන් මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් දැනට පවතින උදාසීන කෘෂි යෙදවුම් බෙදාහැරීම වෙනස් කරනු ඇතැයි තදින්ම අවධාරණය කරනු ලැබීය.

නව ව්‍යවසායකයින්, නගරයට කේන්ද්‍රගත පෞද්ගලික වෙළෙන්දන් නායකත්වය දෙන සංවිධානාත්මක ව්‍යාපාරික පරිසරයට තරඟයක් දිය හැකි ශක්තිමත්, විශ්වාසදායක වෙළඳ නියෝජිතයන් වීමත් සමඟ ඔවුන්ට තම ප්‍රදේශයේ ජනතාවට වඩාත් පෘථුල සේවයක් කිරීමට හැකි වනු ඇත.

**පහත සඳහන් අරමුණු මත ව්‍යාපෘතිය ගොඩනැගී ඇත.**

i. විශ්වසනීය, කලට වේලාවට ලැබෙන බවට ස්ථිර කළහැකි, කෘෂි සේවා සහ යෙදවුම් සැපයීම වෙත සමීපවීමට කුඩා පරිමාන ගොවීන්ට ඇති අවස්ථා දියුණු කිරීම

ii. ප්‍රාදේශීය මට්ටමින් කෘෂි යෙදවුම් බෙදහරීමේ ව්‍යවසායකත්වයක් ගොඩ නැගීම. එමගින් ගොවිපළ මට්ටමට වඩා සමීපව බැඳී පවත්නා අයුරින් සේවා සහ ආයතන විමධ්‍යගත කළ හැකි යාන්ත්‍රණයකට ආධාර කිරීම.

iii ගොවිපළ ආශ්‍රිත තීරණ ගැනීමේදී ගොවීන් සතු අවේණික විභව්‍ය කුසලතාවලට ඉඩ සැලසීම. එමගින් දනට පවත්නා සූරාකෑම තුරන්කොට අලුතෙන් ස්ථාපිත කරනු ලබන පෞද්ගලික වෙළඳුන් විසින් කුඩා පරිමාන ගොවීන්ගේ අවශ්‍යතා සපුරාලන අතරම, මෙම නව වෙළෙඳුන්ගේ මෙහෙයුම් පාලනය වන පරිදි නියෝජිත ආයතන සමඟ සම්බන්ධ කොට ගොවීන් සහ ග්‍රාමීය ආර්ථිකය සූරාකෑමට භාජන නොවන තත්ත්වයක් සහතික කිරීම

iv අලුතෙන් ස්ථාපිත කරන ග්‍රාමීය වෙළෙඳුන් මඟින් ගොවි පුහුණුව සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම්වලට ඇති පහසුකම් වැඩි කිරීම

v නව තාක්ෂණ සහ නව යෙදවුම් භාවිතයෙන් ගොවීන් විසින් නව ක්‍රියාකාරකම් අනුගමනය කිරීම වැඩි කිරීම. එමගින් ව්‍යාපෘති ප්‍රදේශය තුළ කෘෂි නිෂ්පාදනය වැඩි කිරීම සහ ගොවීන්ගේ ආදයම වැඩි කිරීම

**ව්‍යාපෘති වාර්තාව නිම කිරීම - 2004**

2001 ඔක්තෝබර් මස ව්‍යාපෘතිය අනුමත කරන ලදී. එය ක්‍රියාත්මක කිරීම ආරම්භ වූයේ 2002 මාර්තු මසය. ව්‍යාපෘතිය ආරම්භවූයේ අත්හදබැලීමේ පදනම මතය. 2003 නොවැම්බර් සහ දෙසැම්බර් කාලයේදී ද, 2004 ජනවාරි - මාර්තු කාලයේදී ද, ප්‍රගති ඇගයීම් සිදු විය. මෙම අත්හදබැලීම්වල ප්‍රතිඵල 2004 දෙසැම්බර් මස පැවති කලාපීය වැඩ මුළුවකට ඉදිරිපත් කරන ලදී.

නාඋල, අළුගොල්ල, දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානයේදී, 2004 දෙසැම්බර් 17,18 දිනවල ප්‍රගති ඇගයීම් වැඩමුළුව පවත්වන ලදී. එම වැඩ මුළුවේ දී හෙ.කො.ගො.ප.පු. ආයතනය ඉදිරිපත් කළ ව්‍යාපෘති සමාප්ති වාර්තාව සූපරීක්ෂාකාරී ලෙස සමාලෝචනය කරනු ලැබීය. මෙම ග්‍රාමීය කෘෂි ව්‍යාපාරිකයන් සහ නියෝජිතයන් ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහනෙහි සමාප්ති වාර්තාවට පහත සඳහන් ද ඇතුළත්ය.

- වෙළෙඳුන්ට ලබාගත හැකි වූ ව්‍යාපාරික ප්‍රගතිය සහ ප්‍රතිලාභ.

- යෙදවුම් ද වගා කාලසටහන තුළ නිතිපතා විශ්වසනීය සැපයුම් ද, යෙදවුම්වල ගුණාත්මකභාවය ද, යන කරුණු සම්බන්ධයෙන් ගොවි ප්‍රජාවට ලැබුන ප්‍රතිලාභ.

- ව්‍යවසායකත්වය ගොඩනැගීමේ දී ප්‍රයෝජනවත් වන පරමාදර්ශී ආකෘති සහ අභිමතාර්ථ පිළිබඳව අත්හදබැලීමෙන් ලද අත් දකීම.

- ප්‍රදේශීය මට්ටමේ කෘෂි බෙදහැරීම් පද්ධතිය ශක්තිමත් කිරීමට අදළ ප්‍රතිපත්තිමය ගම්‍යතා.

වැඩි ගුණාත්මකභාවයෙන් යුත් විශ්වසනීය යෙදවුම් ලබා ගැනීම වඩාත් පහසු කිරීම ද, වගා කාලසටහන තුළ අවශ්‍ය අවස්ථාවලදී විශ්වාසිනීය ලෙස එම යෙදවුම් සම්පාදනය ද, ඇප සහ සාධාරණ සැපයුම් කොන්දේසි පැවතීම ද (උදහරණ ණය පදනම මත සැපයීම), උපදේශක සේවාවන් වඩා පහසුවෙන් ලබාගත හැකි වීම ද ග්‍රාමීය කෘෂි ව්‍යාපාරිකයන් සහ නියෝජිතයන් ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම හේතු කොට ගෙන ඇති වී තිබේ. එම ප්‍රතිඵල ප්‍රාදේශීය මට්ටමෙහි විශාල ඉදිරි පිම්මකට මග පාද ඇත. යථෝක්ත වැඩ සටහන සම්බන්ධ නියෝජිතයන් 2002 සහ 2003 වසරවල ප්‍රමාණවත් ලෙස ව්‍යාපාර දියුණු කර ඇති බව නිරීක්ෂණය කරන ලදී. ව්‍යාපාර චක්‍රයකට යෝග්‍ය කාලය අවුරුදු 6-10 කි. එබැවින් ව්‍යාප්තිය ක්‍රියාත්මක කාලය ප්‍රමාණවත් නොවන තරමට කෙටි විය. එසේ වුවත් කෘෂිකර්ම සංවර්ධන පද්ධතිය විමධ්‍යගත කිරීමට යොදගත් තම උපාය බලාපොරොත්තු වූවාටත් වඩා ඵලදායී වූ බවත් ප්‍රයෝජනවත් වූ බවත් ගොවීන්ට අවබෝධ වී ඇත.

ව්‍යාපෘතියෙන් පහත සඳහන් ප්‍රයෝජන ගොවීන්ට ලබා ගත හැකි බව "වැඩසටහන් ඇස්තමේන්තු කිරීමේ ක්‍රියාවලියෙන්" පැහැදිලි විය.

i. කලට වේලාවට හොඳ ගුණාත්මක භාවයක් ඇති බීජ සහ විශ්වසනීය රසායනික යෙදවුම් ලබා ගැනීම පහසු වීම.

ii ග්‍රාමීය මට්ටමෙහි දී යෙදවුම් සමඟ කෘෂි උපදේශක සේවා බාධා රහිතව ලබා දීම.

iii නව වෙළෙන්දන් සහ නියෝජිතයන් මඟින් තාක්ෂණය සහ යෙදවුම් භාවිතයට අනුගතවීම වැඩි කිරීමට ගොවීන්ට හැකි වීම.

iv පෞද්ගලික අංශය සමඟ වෙළඳ දමයක් වර්ධනය වීමට අනුබල දෙන අලෙවි මූලාශ්‍රයකට ළඟාවීම වඩාත් පහසු කිරීම.

v නව වෙළන්දන් සහ නියෝජිතයන් ඇති කරගත් සබඳතා හේතු කොට ගෙන වෙනත් සේවාවන්ට බාධාවකින් තොරව ළඟාවීමට හැකිවීම.

මෙම ව්‍යාපෘතියේ වෙනත් අංශවලට, එනම්, බීජ නිපැයුම සහ අලෙවි වැඩසටහන, කාබනික ගොවිතැන් වැඩසටහන, කාබනික පොහොර නිපයුම සහ අලෙවිය සහ කෘෂි නිපැයුම් අලෙවි කිරීමේ වැඩ සටහන, කාලය මදවීම නිසා ක්‍රියාත්මක නොකරන ලදී.

2005 වසරේ දී මෙම ව්‍යාපෘතිය දිස්ත්‍රික්කයේ වෙනත් ප්‍රදේශවලට ව්‍යාප්ත කරන ලෙස ග්‍රාමීය කෘෂි ව්‍යාපාරිකයන් සහ නියෝජිතයන්ගේ සංගමය යෝජනාවක් ඉදිරිපත් කළාය. මාතලේ දිස්ත්‍රික්කයේ වෙනත් ප්‍රදේශවලට මෙම වැඩ සටහන ව්‍යාප්ත කරන්නේ නම්, 2002-2003 වසරවල ග්‍රාමීය කෘෂි ව්‍යාපාරිකයන් සහ නියෝජිත වෙළඳුන් ලබා ගත් අත්දකීම්වලින් දනගත් බාධක ජයගැනීමට වැඩසටහනෙහි අන්තර්ගතයන් සුදුසු පරිදි වෙනස් කළ යුතුය. මෙම වැඩසටහනේ පහත සඳහන් ලක්ෂණ වෙනස් කළ යුතු බව අපි යෝජනා කරමු.

1. ග්‍රාමනිලධාරී කොට්ඨාස තෝරා ගැනීම - දුරස්ථ ප්‍රධාන නිෂ්පාදක ප්‍රදේශවලට වැඩි බරක් තැබිය යුතුය.

2. පුහුණු වන්නන් තෝරාගැනීම - පෙර ව්‍යාපාරික අත්දකීම් ඇත්තා වූද, වත්කම් සහ තොග සැපයුම් කරන්නන් හා සබඳතා ඇත්තා වූද පිරිසට වැඩි ප්‍රමුඛතාවයක් හිමි විය යුතුය.

3. පුහුණුව - භෝග රැක බලා ගැනීම, පස සහ කෘෂි නිෂ්පාදන පිළිබඳ විද්‍යාව සහ කෘෂිකර්ම කටයුතු වලදී රසායන ද්‍රව්‍ය භාවිතය වෙත, සූදනම් වන අවධියේ දී වැඩි අවධානයක් යොමු විය යුතුය.

4. ණය - ව්‍යවස්ථායකයන් අභිප්‍රේරණයට සහ ව්‍යාපාර ප්‍රසාරණයට ණය නැතිවම බැරි පූර්ව අවශ්‍යතාවයකි.

5. තොරතුරු ජාලය - ග්‍රාමීය කෘෂි ව්‍යාපාරිකයන් සහ නියෝජිතයන්ගේ සංගමය මඟින් එම සංගමයේ සාමාජිකයන් අතර තොරතුරු හුවමාරු පද්ධතියක් පවත්වා ගැනීම අවශ්‍ය වේ.

**මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල ප්‍රාදේශීය නිලධාරී ලේකම් කොට්ඨාසයේ කෘෂි නිපැයුම් එකතුකරන සහ අලෙවි කරන මධ්‍යස්ථානයක් පවත්වා ගැනීමේ ශක්‍යතාවය පිළිබඳ සමීක්ෂණය - 2004**

**පර්යේෂණ කණ්ඩායම**

ආචාර්ය ඩී. තෙන්නකෝන් - සම්බන්ධීකාරක
ආර්.එන්.එල්. ජයතිස්ස මහතා
එන්.එස්.ඩබ්. නවරත්න මහතා

2004 ජනවාරි මස යථෝක්ත අධ්‍යයනය සිදු කරන ලෙස මාතලේ කලාපීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිය විසින් හෙ.කො.ගො.ප.පු. ආයතනයෙන් ඉල්ලීමක් කරන ලදී. අධ්‍යයනයේ වාර්තාව 2004 මාර්තු අවසන එම කලාපීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘතියට බාර දිය යුතු බව ද සඳහන් විය. මාතලේ කලාපීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘතිය 2000 සිට 2005 දක්වා ක්‍රියාත්මක වේ. එහි ප්‍රධාන අරමුණ වූයේ දිස්ත්‍රික්කයේ දිළිඳු ග්‍රාමීය ගොවි පවුල්වල ආදායම වැඩි කොට එම තත්ත්වයෙහි රඳවා ගැනීමයි. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි ලාබ සහිත ක්‍රියාකාරකම් වර්ධනය කිරීම සැලකිල්ලට භාජනය වී ඇත. භෝග නිපැයුම සඳහා පවතින එක් ප්‍රධාන බාධකයක් නම් සාධාරණ වෙළඳපොළක් ග්‍රාමීය මට්ටමෙහි නොපැවතීමයි. ඒ සමගම දුබල පසු අස්වනු පරිහරණය නිසා අයහපත් ගුණාත්මකභාවයෙන් යුත් නිපැයුම්වලට වඩා හොඳ මිලක් ලබා ගැනීම අපහසු විය.

ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි සුවිශේෂ කෘෂි - පාරිසරික කලාප දෙකක් ඇත. ඉලුක්කුඹුර, පිටවල, මහලකොටුව සහ පුවක්පිටිය යන තෙත් දේශගුණය පවතින ප්‍රදේශවල යල කන්නයේදී වැසි ජලය සහ අතිරේක වාරි ජලය උපයෝගීකොට ගෙන එළවලු සහ වෙනත් ක්ෂේත්‍ර භෝග වවන අතර මහ කන්නයේ දී ප්‍රධාන වශයෙන් වී ගොවිතැන් කරනු ලැබේ. වියළි ප්‍රදෙශයෙහි මහ කන්නයේදී අක්‍රමවත් වර්ෂාපතනය නිසා ඉරිඟු සහ වී වගා කරනු ලැබේ.

කොට්ඨාශයෙහි තෙත් දේශගුණය පවතින කොටසෙහි ගොවීන්ට තම භෝගවලට බාහිර වෙළඳුන්ගෙන් ඉතා අඩු මිලක් ලැබේ. එයට ප්‍රධාන හේතුව නම් ගබඩා පහසුකම් සහ ප්‍රවේශ මාවත් වැනි කෘෂි යටිතල පහසුකම් හිඟවීමයි. (දනට ව්‍යාපෘතිය යටතේ පුවක්පිටියේ සිට කම්බරාව දක්වා ප්‍රවේශ මාර්ගයක් තනනු ලැබේ.) ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි යෝග්‍ය ග්‍රාම මධ්‍යස්ථානයක කෘෂි භාණ්ඩ එකතු කරන මධ්‍යස්ථානයක් ස්ථාපිත කළ යුතු බවට ගොවීන් සහ වෙනත් අය විසින් මාතලේ කලාපීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘතියට ඉල්ලීම් රැසක් ඉදිරිපත් කර ඇත.

**සමීක්ෂණයේ අරමුණ**

ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි කෘෂි භාණ්ඩ එකතුකිරීමේ සහ අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ යෝජනාව සහ එමඟින් පසු අස්වනු පරිහරණ අලාභ අඩු කරන අතරම දිළිඳු ගොවීන්ගේ කෘෂි නිෂ්පාදනවලට ලැබෙන මිල වැඩි කිරීමට ඇති හැකියාව ගැන ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම මෙම සමීක්ෂණයේ ප්‍රධාන අරමුණ විය.

## කාර්යයෙහි විෂය පථය

පහත සඳහන් කරුණු ඇතුළුව විස්තරාත්මක වාර්තාවක් සැපයීමේ අදහස ඇතිව සමීක්ෂණය සකස් කරන ලදී. සමීක්ෂණ පවත්වන කාලය තුළ ප්‍රාදේශීය ලේකම්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් සහ ඉලුක්කුඹුර ප්‍රාදේශීය නිලධාරී යන නිලධාරීන්ගේ උපදේශ සහ ආධාරය අවශ්‍ය පරිදි ලැබුණි. සමීක්ෂණය ප්‍රධාන වශයෙන් පහත සඳහන් ගැටළු වෙත යොමු විය.

* යෝජිත මධ්‍යස්ථානය ඇති කිරීම ගැන ප්‍රදේශයේ ගොවීන්ගේ කැමැත්ත.
* කන්නය අනුව එළවළු, පලතුරු සහ වෙනත් භෝග වර්ග ලබා ගැනීමේ හැකියාව සහ ලබාගත හැකි ප්‍රමාණය.
* ප්‍රදේශයේ සියලු භාණ්ඩ සඳහා දනට පවතින අලෙවි පද්ධතිය සහ ආන්තික ලාභ
* මධ්‍යස්ථානය ආරම්භ කිරීමෙන් පසු ලාභ ලැබීමෙන් සිදු විය හැකි වාසි.
* හැකිතාක් අඩු කාර්ය මණ්ඩලයක් සහිතව මධ්‍යස්ථාන මෙහෙයවිය හැකි සහ නඩත්තු කළ හැකි සංවිධානයක් හඳුනා ගැනීම.
* කාර්ය මණ්ඩලයේ වැටුප් ඇතුළුව මධ්‍යස්ථානය මෙහෙයවීමට හා නඩත්තුවට අවශ්‍ය අරමුදල් මධ්‍යස්ථානය විසින්ම ඉපැයිය හැකි ක්‍රමයක් සේවා සපයන්නා විසින්ම යෝජනා කළ යුතුය.
* මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට සුදුසු ස්ථානයක් සේවා සපයන්නා විසින් යෝජනා කළ යුතුය.
* සෘජුව හා වක්‍රව ජනනය කළ හැකි රැකියා සංඛ්‍යාව

2004 මාර්තු මස සමීක්ෂණය අවසන් කරන ලදුව, ශක්‍යතා වාර්තාවෙහි අවසන් සැකැස්ම කලාපීය ආර්ථික සංවර්ධන ව්‍යාපෘතියට 2004 මාර්තු මස ඉදිරිපත් කරන ලදී. එම ව්‍යාපෘතියේ වෘත්තීය මණ්ඩලයක් ඉදිරියේදී 2004 මාර්තු 25 දින වාර්තාව ඉදිරිපත් කරනු ලැබීය. මෙම සාකච්ඡාවට සහභාගිවූ මණ්ඩලය විසින් ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉලුක්කුඹුර ග්‍රාමයෙහි කෘෂි භාණ්ඩ එකතු කිරීමේ සහ අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම අනුමත කරන ලදී.

## පුස්තකාලය

### කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| පුස්තකාලයාධිපති | 1 |
| සහකාර පුස්තකාලයාධිපති | 1 |
| පුස්තකාල සහකාර 1 වන ශ්‍රේණිය | 1 |

පුස්තකාලයෙහි ප්‍රධාන අරමුණ වනුයේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සහ වෙනත් උනන්දුවන පුද්ගලයන්ගේ සහ නියෝජිත ආයතනවල ප්‍රයෝජනය පිණිස ගොවි කටයුතු අංශයට සම්බන්ධ තොරතුරු එකතුකිරීම, ගොනු කිරීම, සමුද්ධරණය හා බෙදහැරීමයි. වසර තුළ කාර්ය මණ්ඩලය පොත් 928ක් ද, සඟරා 276ක් ද, කියවා ආපසු ගෙනවුත් දීම සඳහා රැගෙන ගියහ. පුස්තකාලයට වසර තුළ පැමිණි අමුත්තන්ගේ සංඛ්‍යාව 254 කි. ඒ අතුරෙන් බොහෝ දෙනෙක් විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ වූහ.

### පොත්, සඟරා, සිතියම් සහ වාර්තා ලබාගැනීම

වසර තුළ පුස්තකාලයට පොත් සහ වාර්තා 732 ක් ලැබුණි. ඒවා අතුරෙන් 488ක් සෘජුවම මිලට ගනු ලැබීය. අනෙක් පොත් හුවමාරු පදනම මත හෝ තුටු පඬුරු වශයෙන් ලැබුණි. හුවමාරු පදනම මත හෝ තුටු පඬුරු ලෙස, සඟරා, පුවත් හසුන්, වාර්ෂික වාර්තා රාශියක් මෙරට හෝ පිටරට ආයතනවලින් ලැබී ඇත. විදේශීය සඟරා 38 ක්ද, දේශීය සඟරා 15ක් ද, පුස්තකාලය විසින් වසර තුළ වාර මුදල් ගෙවා ලබා ගන්නා ලදී. 2004 වසර අවසන් වන විට පුස්තකාලය සතු පොත් සංඛ්‍යාව (පොත් සහ එකට බඳින ලද සඟරා කලාප) 19,700 ක් විය.

## අන්තර් පුස්තකාල සහයෝගීතාවය

AGRINET SDCP යෝජනා ක්‍රමයට පුස්තකාලය අඛණ්ඩව සහභාගි විය. වසර තුළ සඟරා පටුන පිටු 240ක් මෙම පුස්තකාලය විසින් අන්‍ය සාමාජික පුස්තකාල වෙත යවා ඇත. පුස්තකාලයට සඟරා 11 ක පටුන පිටු 116ක් ලැබුණි. සඟරා ලිපි සඳහා අන්තර් පුස්තකාල ඉල්ලීම් (ආපසු දීමේ පදනම මත) 18ක් ලැබුණි. වසර තුළ අන්තර් පුස්තකාල ණය පදනම යටතේ, පොත් තාවකාලිකව ගැනීමේ පහසුව කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ නිලධාරීන්ට ද ලබා දෙන ලදී. එම පදනම යටතේ මෙම වසර තුළ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ නිලධාරීන්ට ද තාවකාලිකව පොත් ලබා ගැනීමට අවස්ථාව සලසන ලදී.

කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පුස්තකාලය නඩත්තු කරන ජාතික කෘෂිකර්ම ග්‍රන්ථනාමාවලියට, අලුතෙන් ලබා ගන්නා පොත් සඟරා ආදියෙහි නාමාවලී තොරතුරු සපයන ලදී. මෙම දත්ත පදනමෙහි මුද්‍රිත සහ විද්‍යුත් පිටපත් දැනට පුස්තකාලයෙහි ඇත. වසර තුළ පොත් සහ සඟරා ලිපි වාර්තා 1401 ක් පිළිබඳ නාමාවලී තොරතුරු කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවට මෙම පුස්තකාලය විසින් සපයන ලදී. කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් නඩත්තු කරනු ලබන TEEAL විද්‍යුත් පුස්තකාලයට ප්‍රවේශවීමට පර්යේෂණ කාර්ය මණ්ඩලයට අවස්ථාව ලබා දී ඇත. වසර තුළ පාඨකයන්ට ලබාදෙන පරිඝනක පහසුකම් තවදුරටත් පුළුල් කරන ලදී.

## වෙනත් සේවා

පොත් සහ සඟරා පිළිබඳ වාර්තා එකතු කිරීමෙන් පුස්තකාල විද්‍යුත් ග්‍රන්ථනාමාවලී දත්ත පදනමට අයත් වාර්තා සංඛ්‍යාව 655 දක්වා වැඩි කර ඇත. සාමාන්‍යයෙන් ඉටුවන පොත් කියවා ආපසු දීමට නිකුත් කිරීම, පරිශීලනයට ඉඩ දීම, ඡායා පිටපත් ලබා දීම හැරුනවිට, පර්යේෂණ කාර්ය මණ්ඩලයට සහ බාහිර වශයෙන් සබඳතා පවත්වන්නන්ට, වත්මන් පොත් පත් හා ලිපි ගැන දැනුවත් කිරීමේ සේවය පුස්තකාලය විසින් නොකඩවා ඉටු කරන ලදී.

පොත් සහ සඟරා ලිපි ගැන වාර්තා 2500 ක් ජාතික සූචි එකතුවට ඇතුළත් කිරීමට ජාතික පුස්තකාල සූචි සේවා මණ්ඩලයට යවන ලදී.

ජාතික විද්‍යා පදනමේ පුස්තකාලය විසින් නඩත්තු කරනු ලබන, ශ්‍රී ලංකා විද්‍යා හා තාක්‍ෂණ පුස්තකාල තොරතුරු ජාලයේ දත්ත පදනමට මෙම පුස්තකාලය විසින් පරිඝනක ගත කළ සඟරා ලිපි ගැන තොරතුරු යවන ලදී.

## ප්‍රකාශන ඒකකය

**කාර්ය මණ්ඩලය**

| | |
|---|---|
| කේ.ඒ.එස්. දයානන්ද මහතා | - ඒකක ප්‍රධාන (සැප්තැම්බර් දක්වා) |
| එස්. රාමේස්වරන් මහතා | - වැඩ බලන ඒකක ප්‍රධාන (සැප්තැම්බර් සිට) |
| ජී. රාමනායක මහතා | - ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී |
| එස්. රාජපක්ෂ මිය | - ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී |
| එස්.ඒ.සී.යූ. සේනානායක මහතා | - ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී |
| එම්.ඩී. සුසිලා ලූර්දු මෙනවිය | - පර්යේෂණ නිලධාරී |

දශක තුනකට වැඩි කාලයක් ආයතනයට සේවය කිරීමෙන් පසු සැප්තැම්බර් මාසයේ දී දයානන්ද මහතා විශ්‍රාම ලබා ගත්තේය. එවක් පටන් එස්. රාමේස්වරන් මහතා ඒකකයේ වැඩබලන ප්‍රධාන බවට පත්විය.

පර්යේෂණ වාර්තා, අවස්ථානුගත ප්‍රකාශන, සඟරා, පුවත් හසුන්, විවරණිකා, අත්පොත්, පත්‍රිකා සහ වෙනත් තොරතුරු ප්‍රකාශන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සංස්කරණය කොට ප්‍රකාශයට පත් කිරීම ප්‍රකාශන ඒකකයේ මෙහෙවරයි. මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය සමඟ සබඳතා පවත්වමින් මහජන සබඳතා පැවැත්වීමද එම ඒකකය ඉටුකරයි.

මීට අමතරව කෘෂිකර්ම අමාත්‍යාංශය පවරන පරිවර්තන කටයුතු ද මෙම ඒකකය විසින් ඉටුකරනු ලැබේ. තවද ප්‍රකාශන අලෙවිය වැඩි කිරීම ප්‍රදර්ශන කීපයකටද ඒකකය සහභාගී විය. දේශීය සහ අන්තර්ජාතික සම්මන්ත්‍රණ, වැඩමුළු,සාකච්ඡා සංවිධානය කිරීමටද, ප්‍රචාරක කටයුතුවලට ද ඒකකයේ සාමාජිකයෝ ක්‍රියාකාරී ලෙස සහභාගී වූහ.

**නිමකළ පර්යේෂණ වාර්තා**

**ප්‍රකාශිත පර්යේෂණ වාර්තා**

1. කෘෂි භාණ්ඩ මිල 1997 - 2003.
2. වැවිලි කර්මාන්ත අංශයට අයත් නොවන ව්‍යාප්ති සේවා පෞද්ගලීකරණයට භාජනය කිරීම
3. ශ්‍රී ලංකාවේ ගිවිසුම්ගත ගොවිතැන : වෙළඳපොළ ඒකාබද්ධකරණයේ විභවතා සහ ගැටළු- පෙබරවාරි 2003.
4. ශ්‍රී ලංකාවේ කුකුල් මස් සහ බිත්තර නිෂ්පාදනය සහ අලෙවිය.
5. ශ්‍රී ලංකාවේ කුඩා වැව් ආශ්‍රිත ජනාවාස. (වැඩ මුළුවක කාර්ය වාර්තාව)

**ප්‍රකාශනය සඳහා නම්කර ඇති පර්යේෂණ වාර්තා**

1. කුඩා පරිමාණ ගොවිතැන් අංශයට ග්‍රාමීය ණය : කාර්ය සාධනය, අසාර්ථක වීම් සහ අනාගත බලාපොරොත්තු.
2. සහභාගිත්ව කෘෂි සම්පත් කළමනාකරණය. - FARM ව්‍යාපෘතියෙන් උගතහැකි පාඩම්.
3. ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර වාරි තාක්ෂණය උපයෝගීකර ගැනීම.
4. ශ්‍රී ලංකාවේ ගොවි සමාගම්.

**ප්‍රකාශිත සඟරා, වාර සඟරා සහ වෙනත් වාර්තා**

1. කමලනම්, සැප්තැම්බර් 2003
2. වාර්ෂික වාර්තාව 2000 (ඉංග්‍රීසි)
3. වාර්ෂික වාර්තාව 2001 (ඉංග්‍රීසි)
4. කෘෂි භාණ්ඩ මිල 1997 - 2003
5. වාර්ෂික වාර්තාව 2000 (සිංහල)
6. වාර්ෂික වාර්තාව 2001 (සිංහල)
7. ශ්‍රී ලංකාවේ කුකුල් මස් සහ බිත්තර නිෂ්පාදනය සහ අලෙවිය (සිංහල)
8. වාර්ෂික වාර්තාව 2002 (සිංහල)
9. වාර්ෂික වාර්තාව 2002 (ඉංග්‍රීසි)
10. වාර්ෂික වාර්තාව 2002 (දෙමළ)
11. ගොවි කටයුතු අධ්‍යයනය වෙළුම 5. අංක 1. 2004
12. ගොවි ජනතා 2004 ජනවාරි - ඔක්තෝබර්
13. කමනලම් සැප්තැම්බර් - දෙසැම්බර්
14. පුවත් හසුන. තිරසර ගම්මාන වැඩ සටහන
15. සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාව (සිංහල සහ ඉංග්‍රීසි)

# මානව සම්පත් සංවර්ධනය සහ ආයතනික සංවර්ධන අංශය

**කාර්ය මණ්ඩලය**

| | |
|---|---|
| අයි. රණසිංහ පෙරේරා මහතා | - අංශ ප්‍රධාන (නොවැම්බර් මස අවසන සිට) |
| ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා | - වැඩ බලන අංශ ප්‍රධාන (දෙසැම්බර් සිට) |
| පී. පියරත්න මහතා | - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (ඔක්තෝබර් මස අමාත්‍යාංශයට නිදහස් කර යවන ලදී.) |
| එන්.එස්.බී. ඇපාකන්ද මහතා | - සංඛ්‍යාන නිලධාරී |

මෙරට ගොවි කටයුතු අංශයෙහි ජාතික පුහුණු ආයතනය හැටියට හෙ.කො.ගො.ප.පු. ආයතනය සේවයෙහි නියුතු බැවින් එහි මානව සම්පත් සංවර්ධන හා ආයතනික සංවර්ධන අංශයට විවිධ තල තුනක සේවය කිරිමට සිදු වේ. පළමුවෙන්ම, ජාතික ප්‍රමුඛතා අනුව පෙළගස්වන ලද ආයතනයේ නිත්‍ය පුහුණු වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සංවිධානය කොට සම්බන්ධීකරණය කිරීම මෙම අංශයේ මෙහෙවරකි. දෙවනුව තත්කාලීන ප්‍රශ්න ඇසුරෙන් පැනනගින පුහුණු අවශ්‍යතාවලට ප්‍රතිචාර වශයෙන් කටයුතු කරයි. තෙවනුව වෙනත් රජයේ සංවිධානවලට තම පුහුණු වැඩ සටහන් සැලසුම් කිරිම, මෙහෙයවීම සහ ඇගයීමට මෙම අංශයේ විශේෂඥතා දැනුම ඇත්තුන්ගේ සේවය ලබා දෙනු ලැබේ. මීට අමතරව පුහුණුව අවශ්‍ය අංගයක් වන ගොවි කටයුතු ක්ෂේත්‍රයේ කාර්ය බද්ධතාවයට නැඹුරු පර්යේෂණ වැඩසටහන්වල නියැළීමට ද මෙම මානව සම්පත් සංවර්ධන සහ ආයතනික සංවර්ධන අංශයට සිදු වේ.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පුහුණු වැඩසටහන්, කෙටි පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලා, වැඩමුළු සහ සම්මන්ත්‍රණ යන ස්වරූපවලින් පැවැත්වේ. මෙම වැඩසටහන්වලට අවශ්‍ය සම්පත් දයකයින් ලබා ගන්නේ පුහුණු අංශයෙන් සහ ආයතනයේ වෙනත් අදාළ පර්යේෂණ අංශවලිනි. අවශ්‍යතාවය අනුව, විශ්ව විද්‍යාල, වෙනත් රජයේ ආයතන සහ නියෝජිත ආයතන සහ රාජ්‍ය නොවන සංවිධානවලින් සම්පත් දයකයින් ලබා ගනු ලැබේ.

**නිම කළ පුහුණු වැඩ සටහන් සහ පර්යේෂණාත්මක අධ්‍යයන.**

1. **ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය ගැන දැනුවත් කිරීමේ වැඩසටහන. (1 වන අදියර)**

2004 ජනවාරි මස අවසන් කරන ලදී. කළුතර දිස්ත්‍රික්කයේ පැවති වැඩමුළු දෙකකට 122 දෙනෙක් සහභාගි වූහ.

2. **දිළිඳු ජනතාවට හිතකර ආර්ථික අභිවර්ධන සහ ප්‍රජා බල ගැන්වීම.**

**ව්‍යාපෘතිය :** දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩ සටහන

මෙම ව්‍යාපෘතිය වාරි මාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ වාරි මාර්ග සහ ජල කළමනාකරණ අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා JABIC ආයතනයේ ආධාර ලැබේ. උතුරු හා නැගෙනහිර පළාත් ඇතුළු වියළි හා අතරමැදි කලාපවල වාරි පද්ධති 100 ක ව්‍යාපෘතිය ක්‍රියාත්මකය. වසර 7ක් තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදහස් කෙරේ. කෘෂි නිෂ්පාදන දියුණුව සහ ප්‍රජා/යටිතල පහසුකම් වර්ධන ක්‍රියාකාරකම් මගින් අරමුණුගත කාණ්ඩ සඳහා වඩා ඉහළ මට්ටමේ ජීවන තත්ත්වයක් ඇති කිරීමට අදහස් කරනු ලැබේ. විශාල භූමිභාගයක සියලු මට්ටම්වල අදළ නිලධාරීන් ද, ගොවීන් ද අවුරුදු 1 1/2 ක් තුළ පුහුණු කොට අවසන් කළ යුතු බැවින්, හෙ.කො.ගො.ප.පු. ආයතනය ඉදිරිපත් කර ඇති දැනුවත් කිරිමේ සහ පුහුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම ඉතා සංකීර්ණ අභියෝගාත්මක ක්‍රියාදමයකි.

ව්‍යාපෘති යෝජනාව අදාළ නියෝජිත ආයතනවලට ඉදිරිපත් කොට අනුමැතිය ඉල්ලා සිටින ලදී. ව්‍යාපෘතිය යටතේ යෝජනාකර ඇති පුහුණු සංරචකයට වෙන් කළ යුතු මුදල රුපියල් මිලියන 204 කි. කෙසේ වුවද, කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය නැවැත්වීමට තීරණය කළේය. එබැවින් හෙ.කො.ගො.ප.පු. ආයතනයට යෝජිත පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

## 3. තිරසර ග්‍රාම සංවර්ධන වැඩසටහන

**පර්යේෂණ කණ්ඩායම**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහපොතානේගම තිරසර ග්‍රාම සංවර්ධන වැඩසටහන මෙම අංශය විසින් මෙහෙයවන ලදී. මෙම ව්‍යාපෘතිය කෘෂිකර්මය, පරිසරය, යටිතල පහසුකම්, අලෙවිය, ආයතනික සංවර්ධනය සහ ග්‍රාමීය සංවර්ධන පිළිබඳ වෙනත් විවිධ සමාජ ආර්ථික කරුණු ඇතුළත් ග්‍රාම සංවර්ධනය පිළිබඳ ඒකාබද්ධ වැඩ සටහනකි. කෙසේ වුවද, කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් සහ වාරි මාර්ග අමාත්‍යාංශයේ නියෝගය පරිදි ව්‍යාපෘතිය 2004 අගෝස්තු මාසයේදී නතර කරන ලදී.

## 4. ශ්‍රී ලංකාවේ ගොවි සමාගම් : ඇස්තමේන්තු කිරීමක්

**පර්යේෂණ කණ්ඩායම**

අයි. රණසිංහ පෙරේරා. මහතා - සම්බන්ධීකාරක
ආර්.එල්.එන්. ජයතිස්ස මහතා
ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා

ශ්‍රී ලංකාවේ ගොවි සමාගම් ගැන 2004 සැප්තැම්බර් මස පැවති ශීඝ්‍ර ඇස්මේනතුවක ප්‍රතිඵලයක් වශයෙන් මෙම අධ්‍යයන හැඳින්විය හැක. මෙරට පවත්නා ගොවි සමාගම් 154 න් 42 ක් මෙම අධ්‍යයනයට පාත්‍ර විය. එම සමාගම් 42 පරිපාලන දිස්ත්‍රික්ක 17 ක පිහිටා ඇත. ස්තෘත අහඹු නියැදි ක්‍රමය සහ විවිධ වර්ගවල ගොවි සමාගම් නියෝජනයට ඉඩ සලසන සාර්ථ නියැදි ක්‍රමය ද මෙම අධ්‍යයනය සඳහා නියැදි තෝරා ගැනීමේදී භාවිතා කරන ලදී. දර්ශන 10 ක් යොදා ගනිමින් ගොවි සමාගම්වල තිරසර බව ඇස්තමේන්තු කිරීම වෙත මෙම අධ්‍යයනය මූලික වශයෙන් යොමු විය. සමාගම් ආයතනික ශක්තිය, සමාගමේ අවදිමත් භාවය (සමාගම ක්‍රියාකාරී තත්ත්වයක වී ද නැද්ද), බාහිර ආධාර ලැබීමේ මට්ටම, කොටස් ප්‍රාග්ධන වර්ධනය, සම්පූර්ණ ප්‍රාග්ධන වර්ධනය, ලාභ අලාභ තත්ත්වය, ව්‍යාපාර ව්‍යාප්තිය, ලාභාංශ බෙදීම, බදු ගෙවීම සහ ග්‍රාමීය ජනතාවට ගොවි සමාගම් හිමිකර දුන් සමාජ ආර්ථික ප්‍රතිලාභ යන සාධක දර්ශකවලට ඇතුළත් විය.

සාමාන්‍යයෙන් සමාගම් ස්වයම් ධාරිත, ස්වතන්ත්‍ර, මුදල් උපයන සංවිධාන ලෙස සලකන නමුත් මෙම ගණයට අයත්වන ගොවි සමාගම් පවතින බවට සාධක අධ්‍යයනයෙන් සොයාගත හැකි වූයේ ඉතා අල්ප වශයෙනි. ඉතාම සුළු අවස්ථා ගණනකදී හැර සමාගම් අධ්‍යක්ෂවරුන් අතර හෝ සමාගම් කොටස්කරුවන් අතර සාර්ථක ලෙස සමාගමක් මෙහෙයවීමට අවශ්‍ය චර්යාවන් අධ්‍යයනයේදී දක්නට නොලැබුණි. බොහෝ සමාගම් මෙහෙයුම්කරුවනට සමාගමක් මෙහෙයවීමට අවශ්‍ය ජවය, ගතිකත්වය හා ආකල්ප නොතිබුණි. ඔවුන් සතු ව්‍යවසායකත්ව කුසලතා ද, කළමනාකරණ හැකියාවන්ද, ආයෝජන පිළිබඳ දැනුමද, අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය ධෛර්යය ද අල්ප විය. ගොවි සමාගම්වල ගති ලක්ෂණ, අතීතයේ පැවති සම්ප්‍රදායානුකූල ප්‍රජා සංවිධානවල ලක්ෂණවලට බොහෝ සෙයින් සමීප විය. ගොවි සමාගම් කළමනාකරුවන්ගේ හැසිරීම් රටාව ද ප්‍රජා සංවිධාන නායකයින්ගේ හැසිරීම් රටාවට සමීප විය.

අධ්‍යයනයට පාත්‍ර වූ ගොවි සමාගම් බහුතරයක් ඵලදායී නොවන හීන ගතිකත්වයක් ඇති සංවිධාන වුවද, ඵලදායී සමාගම්වලින් උගත් කරුණු, ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වය නගා සිටුවීමට සහ ගොවි සමාගම්වල ප්‍රගතිය අරබයා අතිශයින්ම සිත්ගන්නා සුළු, විශිෂ්ඨ, වැදගත්, පාඩම් බව කිව යුතුය. ඵලදායී සමාගම් යොදාගත් ක්‍රමෝපාය අනුගමනය කිරීම සුදුසු බව මෙම අධ්‍යයනය නිර්දේශ කරයි.

ව්‍යාපෘතිය 2004 දෙසැම්බර් මස අවසන් කරන ලදුව වාර්තාව ප්‍රකාශයට පත් කිරීමට දැන් කටයුතු කරනු ලැබේ.

**ලබන වසර සඳහා වැඩ සටහන**

2005 වසර තුළ පහත සඳහන් පුහුණු වැඩසටහන් මෙහෙයවනු ඇත.

* ප්‍රාදේශීය මට්ටමේ සැලසුම් සංවර්ධන කටයුතු සඳහා PRA/RRA පුහුණු වැඩ සටහන්.
* ග්‍රාමීය සංවිධානවල නායකයන් සඳහා නායකත්ව පුහුණුව.
* සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් පසු විපරම සහ ඇගයීම.
* ගොවි ආයතන ශක්තිමත් කිරීම ගැන පුහුණුව.

මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආයතනය සතු අරමුදල් තත්ත්වය මත රඳා පවතී.

## හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
## 2004 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂ පත්‍රය

| | සටහන් | 2004 රුපියල් | 2004 රුපියල් | 2003 රුපියල් | 2003 රුපියල් |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| ජංගම නොවන වත්කම් | | | | | |
| දේපළ හා උපකරණ | 2 | 23,060,389.58 | | 21,051,568.91 | |
| ආයෝජන - ස්ථාවර තැන්පතු | 3 | 4,902,706.28 | | 5,03,583.90 | |
| භාණ්ඩාගාර බිල්පත් | | 4,372,095.10 | | 4,061,341.86 | |
| කාර්ය මණ්ඩල ණුගාසාධනය | 4 | 17,804,452.33 | | 17,568,810.77 | |
| එකතුව | | | 50,139,643.29 | | 47,755,305.44 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 5 | 3,040,695.05 | | 1,244,345.19 | |
| ණය අරමුදල | | 734,387.30 | | - | |
| ණය ගැතියෝ | 6 | 31,060,052.26 | | 29,432,380.68 | |
| තැන්පතු | 7 | 614,570.00 | | 624,570.00 | |
| ගෙවීම් හා ලැබිය යුතු ගිණුම් | 8 | 1,090,829.99 | | 1,372,943.81 | |
| අත්තිකාරම් | 9 | 3,216,190.03 | | 929,043.48 | |
| බැංකු ශේෂය | 10 | 4,584,007.96 | | 22,957,044.85 | |
| අතැති මුදල් | | 10,000.00 | | 10,000.00 | |
| **එකතුව** | | | 44,350,732.59 | | 56,570,328.01 |
| **පූර්ණ වත්කම්** | | | 94,490,375.88 | | 104,325,633.45 |
| **හිමිකම් සහ වගකීම්** | | | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | | | |
| රජයේ මූලධන ප්‍රදානය | 11 | 85,795,900.00 | | 80,855,900.00 | |
| ඉතිරි කිරීම්වල දයකත්වය | | 1,102,372.79 | | 1,102,372.79 | |
| අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන දීමනා | | 2,342,835.00 | | 142,835.00 | |
| ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල | 12 | 14,757,706.09 | | 14,646,921.09 | |
| ප්‍රාග්ධන සංචිත | | 3,242,284.40 | | 3,242,284.40 | |
| ව්‍යාපෘති පොදු සංචිත | 13 | 16,524,437.47 | | 9,926,803.34 | |
| දිරි දීමනා අරමුදල | | 137,061.91 | | 137,061.91 | |
| දිරි දීමනා අරමුදල - ව්‍යාපෘති | | 97,410,25 | | 7,725.67 | |
| පුහුණු අරමුදල - ව්‍යාපෘති | | 396,261.91 | | 396,261.91 | |
| දිරි දීමනා අරමුදල ආයතනයේ කොටස | | 338,633.99 | | - | |
| ශුද්ධ ඌණතාවය ඉදිරියට ගෙන ගියා | 14 | (54,597,029.70) | | (52,516,513.01) | |
| එකතුව | | | 70,137,874.11 | | 57,941,653.10 |
| **වගකීම්** | | | | | |
| ජංගම නොවන වගකීම් | | | | | |
| පාරිතෝෂික වෙන්කිරීම් | | 16,089,040.90 | | 15,085,245.00 | |
| | | | 16,089,040.90 | | 15,085,245.00 |
| **ජංගම වගකීම්** | | | | | |
| ණය හිමියෝ | 15 | 4,950,989.54 | | 28,887,095.01 | |
| ගෙවිය යුතු ණය | | 734,387.30 | | | |
| උපචිත වියදම් | | 2,578,084.03 | | 2,411,640.34 | |
| එකතුව | | | 8,263,460.87 | | 31,298,735.35 |
| **පූර්ණ හිමිකම් සහ වගකීම්** | | | 94,490,375.88 | | 104,325,633.45 |

| | | |
|---|---|---|
| අත්සන් කළේ | අත්සන් කළේ | අත්සන් කළේ |
| සභාපති | අධ්‍යක්ෂ | ගණකාධිකාරී |

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**
**2004 දෙසැම්බර් 31 වැනි දිනට ආදායම් හා වියදම් ගිණුම්**

| | සටහන | 2004 රුපියල් | 2003 රුපියල් |
|---|---|---|---|
| **ආදායම** | | | |
| මහා භාණ්ඩාගාරයෙන් ලද අරමුදල | | 42,936,000.00 | 40,575,540.00 |
| ව්‍යාපෘති ඉතිරියෙහි දයකත්වය | 16 | 3,494,227.25 | 3,871,557.52 |
| නේවාසිකාගාර හා සම්මන්ත්‍රණ පහසුකම් | | 129,807.20 | 161,557.90 |
| ප්‍රකාශන අලෙවිය | | 1,044,124.23 | 1,711,32494 |
| ආයෝජන පොළිය | | 568,055.98 | 621,919.19 |
| කාර්ය මණ්ඩල ණය පොළිය | 17 | 1,004,471.75 | 1,771,597.85 |
| ව්‍යාපෘති පුනරාවර්තන දයකත්වය | 18 | 394,911.91 | 396,957.58 |
| විවිධ ආදයම් | | 49,571,598.32 | 49,110,454.98 |
| **වියදම** | | | |
| පරිපාලන සහ ආයතන වියදම් | 19 | 53,380,427.36 | 53,458,077.71 |
| මූල්‍යන පිරිවැයට පෙර මෙහෙයුම්වලින් ශුද්ධ ආදයම | | (3,808,829.04) | (4,347,622.73) |
| මූල්‍යන පිරිවැය | | 21,316.50 | 54,567.00 |
| **බදු ගෙවීමට පෙර ශුද්ධ හිඟය** | | (3,830,145.54) | (4,402,189.73) |
| **බදු** | - | - | - |
| **බදු ගෙවීමෙන් පසු ශුද්ධ ආදයම සහ අති විශේෂ අයිතම්වලට පෙර** | | (3,830,145.54) | (4,402,189.73) |
| අති විශේෂ අයිතම | - | - | - |
| ආදයම ඉක්මවූ වියදම | | (3,830,145.54) | (4,402,189.73) |

| | | |
|---|---|---|
| අත්සන් කළේ | අත්සන් කළේ | අත්සන් කළේ |
| සභාපති | අධ්‍යක්ෂ | ගණකාධිකාරී |

# හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය
## 2004 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ක්‍රියාකාරී මෙහෙයුම් තුළින් මුදල් ප්‍රවාහය ලැබීම්

| | | |
|---|---|---|
| වර්ෂය සඳහා ශුද්ධ හිඟය | | (3,830,145.54) |
| ගැලපීම් | | |
| ක්ෂයවීම් සඳහා | 2,723,457.23 | |
| පෙර වසර සඳහා ගැලපීම් | 2,038,605.71 | |
| ස්ථාවර වත්කම් විකිණීම් මත ලාභය | 95.00 | |
| ශිෂ්‍යත්ව ණයහිමියන් පොතින් අස්කිරීම | (289,071.86) | |
| ආයෝජන ආදායම් | (1,044,124.23) | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 1,194,524.31 | |
| පාරිතෝෂික ගෙවීම් | (190,728.41) | 4,432,757.75 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අලාභය | | 602,612.21 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම් | | |
| තොග වැඩිවීම් | (1,776,349.86) | |
| ණයගැතියන් වැඩිවීම | (1,627,671.58) | |
| තැන්පතු වැඩිවීම | (10,000.00) | |
| ගෙවීම් අඩුවීම හා ලැබිය යුතු ගිණුම් | 282,113.82 | |
| අත්තිකාරම් වැඩිවීම | (2,287,146.55) | |
| ණය හිමියන් වැඩිවීම | (23,936,105.47) | |
| උපචිත වියදම් වැඩිවීම | 166,443.69 | (29,168,715.95) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල්** | | (28,566,103.74) |
| ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය | | |
| දේපල යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීම් | (4,804,289.66) | |
| උපකරණ විකිණීමෙන් ලද ආදායම | 72,011.76 | |
| පොළී ලැබීම් | 1,044.124.23 | |
